ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
අට වැනි පාර්ලිමේන්තුව

# පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 119

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ
ස්ථාවර නියෝග අංක 128 (5) යටතේ ඉදිරිපත් කරනු ලබන

# මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ
# 6 වන වාර්තාව

(7 වන පාර්ලිමේන්තුවේ පළමුවැනි සැසිවාරයේ
2013.01.01 සිට 2015.06.26 දක්වා වූ කාලය සඳහා
සහ 8 වන පාර්ලිමේන්තුවේ පළමුවැනි සැසිවාරයේ
2015.09.01 සිට 2016.08.31 දක්වා වූ කාලය සඳහා)

ඉදිරිපත් කරන ලද්දේ
මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සභාපති
පාර්ලිමේන්තු මන්ත්‍රී
ගරු සුජීව සේනසිංහ මහතා විසිනි

2016 නොවැම්බර් මස 29 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කිරිමට නියම කරන ලදී.

<u>**අන්තර්ගතය**</u>


| | | |
|---|---|---|
| 1 | පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව | 1 |
| 2 | මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ ආරම්භය සහ එහි විකාශය | 1 |
| 3 | කාරක සභාවේ සංයුතිය | 2 |
| 4 | මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ බලතල | 4 |
| 5 | ගරු මන්ත්‍රීවරු විසින් පෙත්සම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම | 5 |
| 6 | මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කාර්ය භාරය | 6 |
| 7 | 1981 වර්ෂයේ සිට මේ දක්වා කාලය තුළ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවන්හි සේවය කළ සභාපතිවරුන් සහ අදාළ නිලධාරීන් | 8 |
| 8 | හත්වන පාර්ලිමේන්තුවේ එනම් 2013.01.01 දින සිට 2015.06.26 දින තෙක් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කටයුතු | 11 |
| 9 | 2015.06.26 දින සිට 2015.09.01 දින තෙක් මහජන පෙත්සම් පිළබඳ කාරක සභාවේ කටයුතු | 12 |
| 10 | මහජන පෙත්සම් පිළිබඳ කාරක සභා කාර්යාංශය විසින් මෙම කාල සීමාව තුළ ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණ | 12 |
| 11 | මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ 5 වන වාර්තාවේ සඳහන් ඉලක්කයන් පිළිබඳ පසු විපරමක්. | 14 |
| 12 | හත්වන පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් කාරක සභාවේ ඉලක්කයන් හා නිර්දේශයන් | 15 |
| 13 | හත්වන පාර්ලිමේන්තුවේ ඉලක්කයන් සඳහා අටවන පාර්ලිමේන්තුවේදී ගැනීමට නියමිත පියවර | 16 |
| 14 | අටවන පාර්ලිමේන්තුවේ ඉලක්කයන් | 16 |
| 15 | 2013.01.01 සිට 2015.06.26 දක්වා කාල සීමාවේ විමර්ශනය කළ පෙත්සම් පිළිබඳ සාරාංශය | |
| | (අ) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව ලද පෙත්සම් පිළිබඳ සාරාංශයක් | 17 |
| | (ආ) ලබා දුන් සහන අනුව සාරාංශය | 18 |
| | (ඇ) පෙත්සම් විමර්ශනය සිදුකළ අමාත්‍යාංශය අනුව සාරාංශයක් | 21 |
| | (ඈ) 6 වන පාර්ලිමේන්තු කාල සීමාවේදී කාරක සභාවට ලැබී 2013.01.01 – 2015.06.26 කාල සීමාවේදී විමර්ශනය කළ පෙත්සම් පිළිබඳ අමාත්‍යාංශ අනුව සාරාංශය | 24 |
| | (ඉ) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්ට (ඔම්බුඩ්ස්මන්) අදාළ පෙත්සම් පිළිබඳ සාරාංශය | 25 |
| 16 | කාරක සභාව විසින් සහන සලසා දුන් පෙත්සම් | 26 |
| 17 | පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් විසින් නිර්දේශ කර සහන ලැබී ඇති පෙත්සම් | 55 |
| 18 | කාරක සභාව විසින් සහන සලසා නොදුන් අවස්ථා කිහිපයක් | 56 |

# <u>අන්තර්ගතය ........</u>


| | | |
|---|---|---|
| 19 | අටවන පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරයේ 2015.09.01 සිට 2016.08.31 දක්වා කාල සීමාව තුළ විමර්ශනය කළ පෙත්සම් පිළිබඳ සාරාංශය | |
| | (අ) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව ලද පෙත්සම් පිළිබඳ සාරාංශය | 58 |
| | (ආ) ලබා දුන් සහන අනුව සාරාංශය | 59 |
| | (ඇ) පෙත්සම් විමර්ශනය සිදු කළ අමාත්‍යාංශය අනුව සාරාංශයක් | 60 |
| | (ඈ) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්ට (ඔම්බුඩ්ස්මන්) අදාළ පෙත්සම් | 62 |
| 20 | කාරක සභාව විසින් සහන සලසා දුන් පෙත්සම් පිළිබඳ විමසුමක් | 63 |
| 21 | කාරක සභාව විසින් සහන සලසා නොදුන් අවස්ථා කිහිපයක් | 66 |
| | ස්තුතිය | 67 |
| | *උපලේඛන 1 - ආදර්ශ පෙත්සම* | 68 |
| | *උපලේඛන 2 - පෙත්සමක් ප්‍රතික්ෂේප කිරීමට අදාළ කරුණු* | 69 |
| | *උපලේඛන 3 - අංක E&O/AC/1/8/6 හා 2014.10.10 දිනැති චක්‍රලේඛය* | 70 |
| | *උපලේඛන 4 - පුහුණු සැසි සඳහා කාරක සභික මන්ත්‍රීන් යොමුකරන ලෙස ඉල්ලීම* | 71 |
| | *උපලේඛන 5 - ඔම්බුඩ්ස්මන්වරයාගේ නිර්දේශ පිළිබඳ ජනාධිපතිවරයාගේ ලිපිය* | 72 |
| | *උපලේඛන 6 - මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් වූ 17/2005 දරන රා.ප. චක්‍රලේඛය* | 73 |

# ගරු සභාපතිතුමාගේ සටහන

2013.01.01 සිට 2015.06.26 දක්වා වූ කාලය තුළ කාරක සභික මන්ත්‍රීවරයෙකු වශයෙන් සහ බොහෝ කාරක සභා රැස්වීම්වලදී තාවකාලික සභාපතිවරයෙකු වශයෙන් කටයුතු කළ මම, 2015.12.02 සිට අද දක්වා මහජන පෙත්සම් කාරක සභාවේ සභාපතිවරයා ලෙස කාරක සභාවේ කාර්ය භාරය පිළිබඳව මාගේ අදහස් එකතු කිරීමට අවස්ථාවක් ලැබීම පිළිබඳව සතුටු වෙමි.

රාජ්‍ය ආයතනවල ක්‍රියාකාරීත්වය හේතුවෙන් හා ඒවායේ නිලධාරීන් විසින් ගනු ලබන තීන්දු, තීරණ නිසා යම් අවස්ථාවලදී අසාධාරණයට පත්වන මහජනතාවට සිය දුක්ගැනවිලි ඉදිරිපත් කර, සහන ලබා ගැනීම සඳහා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව පිහිටුවා ඇත. මේ අනුව, ව්‍යවස්ථාදායකය තුළ මහජනතාව විසින් තමන්ට සිදු වූ අසාධාරණයන් වෙනුවෙන් සහන ලබා ගැනීම සඳහා සෘජුවම ගනුදෙනු කරන එක් කාරක සභාවක් ලෙස මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව හැඳින්විය හැක. එසේම වර්තමානය වන විට පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් කාරක සභාව පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය ඉහළ ගොස් ඇති බව මන්ත්‍රීවරුන් හරහා යොමු වන විශාල පෙත්සම් ප්‍රමාණය අනුව නිරීක්ෂණය වේ.

2013.01.01 සිට 2015.06.26 දක්වා කාල සීමාව තුළ සභාපතිවරුන් ලෙස කටයුතු කළ,

- හිටපු නියෝජ්‍ය අමාත්‍ය ගරු ලලිත් දිසානායක මහතාට (2012 මාර්තු සිට 2015 පෙබරවාරි දක්වා) සහ
- ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මියටද (2015 පෙරවාරි සිට 2015 ජූනි දක්වා)

එම වකවානුවේදී කාරක සභාවේ තාවකාලික සභාපතිවරුන් වශයෙන් කටයුතු කළ,

- ගරු ගාමිණී ලොකුගේ මහතා
- ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
- ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
- ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
- අභාවප්‍රාප්ත ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා සහ
- ගරු තලතා අතුකෝරළ මහත්මියටද

8 වැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සැසිවාරය තුළ 2015.09.01 මේ දක්වා 2016.08.31 දක්වා කාල සීමාව තුළ සභාපතිවරුන් ලෙස කටයුතු කළ,

- ගරු සුසන්ත පුංචිනිලමේ මහතාට
- ගරු නිහාල් ගලප්පත්ති මහතාට සහ
- ගරු බිමල් රත්නායක මහතාටද

කාරක සභාවේ කටයුතු කරගෙන යාමට දැක්වූ දායකත්වය වෙනුවෙන් මගේ ස්තූතිය පිරිනමමි.

එසේම එවකට කාරක සභික මන්ත්‍රීවරුන් මෙන්ම වත්මන් කාරක සභාවේ මන්ත්‍රීවරුන්ද කාරක සභාවේ කටයුතුවලට සක්‍රීයව දායක වෙමින් ලබාදුන් සහයෝගයද මෙහිදී කෘතවේදීව සිහිපත් කරමි.

එමෙන්ම කාරක සභික මන්ත්‍රීවරයෙකු නොවුවද බොහෝ කාරක සභා රැස්වීම්වලට පැමිණ පෙත්සම්කරුවන්ට සහන ලබාදීම සඳහා තම අදහස් දැක්වූ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එස්. සී. මුතුකුමාරණ මහතාටද මගේ විශේෂ ස්තුතිය පිරිනමමි. එමෙන්ම සියළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අප කාරක සභාව කටයුතු කරන ආකාරය පිළිබඳව අදහසක් ගැනීම සඳහා රැස්වීම්වලට සහභාගි වන මෙන් විවෘත ආරාධනාවක් කිරීමට මම මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගනිමි.

2013.01.01 - 2015.06.26 කාල සීමාව තුළ මහජන පෙත්සම් කාරක සභාව රැස්වීම් වාර 96ක් පවත්වා ඇති අතර පෙත්සම් 935ක් විමර්ශනය කර ඇති අතර ඒ අතරින් පෙත්සම් 390ක් සඳහා සහන නිර්දේශ ලබාදීමට පෙත්සම් කාරක සභාව කටයුතු කර ඇත. එසේම එකී නිර්දේශ අතරින් පෙත්සම්කරුවන් 92 දෙනෙකුගේ සහන නිර්දේශ ක්‍රියාත්මක කර ඇති බව එකී අදාළ අමාත්‍යාංශ විසින් කාරක සභාව දැනුවත් කර ඇත.

තවද 8 වන පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව 2015.11.14 දින ගරු කථානායකතුමා විසින් පත්කරන ලද අතර එහි පළමු රැස්වීම 2015.12.02 දින පවත්වා ඇත. එදින සිට 2016.08.31 දක්වා රැස්වීම වාර 14 ක් පවත්වා ඇති අතර පෙත්සම් 123ක් විමර්ශනය කර තිබේ. එහිදී පෙත්සම් 70කට අදාළව සහන නිර්දේශ ඉදිරිපත් කර ඇති අතර මේ වන විට පෙත්සම්කරුවන් 8දෙනෙකුට පමණක් එම නිර්දේශිත සහන ලැබී ඇති බව කණගාටුවෙන් දන්වමි. ඉතිරි සියළු ගොනු සඳහා සිහිකැඳවීම් කර ඇති බව වැඩිදුරටත් දන්වා සිටිමි.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට ලැබෙන පෙත්සම් විභාග කිරීම සඳහා පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා වෙතද යොමු කළ හැකි අතර, ඒ අනුව මෙම වාර්තාවට අදාළ වන 2013.01.01 සිට 2016.08.31තෙක් පෙත්සම් 216 ක් විභාග කිරීම සඳහා එතුමා වෙත යොමු කර තිබේ. එම පෙත්සම් කාර්යක්ෂමව විභාග කරමින් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා කාරක සභාවට ලබා දුන් සහයෝගය සම්බන්ධයෙන් එතුමන්ටත්, එතුමාගේ කාර්ය මණ්ඩලයටත් ස්තුති කිරීමට ද මම මෙය අවස්ථාවක් කර ගනිමි.

එමෙන්ම පෙත්සම් කාරක සභාවට ලබාදුන් හා ලබාදෙන සහයෝගය සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරුන්ට මෙන්ම ඔවුන්ගේ කාර්ය මණ්ඩලයන්ට මෙම කාරක සභාවේ වත්මන් සභාපතිවරයා වශයෙන් මම ස්තුතිවන්ත වන අතර ඔවුන්ගේ සහාය නොලැබෙන්නට කාරක සභාවට මෙම කාර්යයන් ඉටුකිරීමට නොහැකි බවද නිහතමානීව පවසමි. එවකට තැපැල්, මුදල් හා ක්‍රම සම්පාදන, විදුලිබල හා බලශක්ති, සමූපකාර හා අභ්‍යන්තර වෙළෙඳ, ඉඩම් හා ඉඩම් සංවර්ධන වැනි අමාත්‍යාංශ භාර අමාත්‍යවරුන් කාරක සභාවේ ඉල්ලීම පරිදි අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කරමින් පෙත්සම්කරුවන්ට සහන ලබා දීම සඳහා ඉදිරිපත්වීම ද මා කෘතවේදීව සිහිපත් කරමි. එසේම රාජ්‍ය සේවා කොමිෂන් සභාව, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, ආයතන අධ්‍යක්ෂ ජනරාල් සහ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වැනි ආයතන ද කාරක සභාව සමඟ ඉතා සහයෝගයෙන් කටයුතු කරන බව ද සඳහන් කළ යුතුය.

රාජ්‍ය සේවා කොමිසම කාරක සභාව සමඟ සහයෝගයෙන් කටයුතු කරන නමුත් ඔවුන්ගේ කාර්ය පටිපාටික රීති අනුව ඔවුන් වරක් විසඳූ අභියාචනයන් නැවත විමසීමට නොහැකි වීම මත කාරක සභාවෙන් සානුකම්පිත පදනම මත ලබාදෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට යාමේදී ඔවුන්ට ගැටළු උද්ගතව ඇති බැවින් රාජ්‍ය සේවා කොමිසම සම්බන්ධ මෙම ගැටළුවද, අධිකරණ සේවා කොමිසම සම්බන්ධයෙන් කාරක සභාවට පැන නැඟී ඇති ගැටළුවද විසඳා ගත යුතුව ඇති බව සඳහන් කරමි.

කාරක සභාව ඉදිරියට පැමිණෙන සැමටම සහන ලබා දීමට නොහැකි බව අප සැම දෙනාම පිළිගත යුතු අතර කාරක සභාවේ සාමාජිකයන් ලෙස පෙත්සම්කරුට සහන ලබා දීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පෙත්සම් කාරක සභාවට ලැබී ඇති බලතල අනුව නිර්දේශ කරනු ලබන සහනයන් නිලධාරීන්ට ක්‍රියාවට නැගිය හැකි විය යුතු බව කාරක සභික මන්ත්‍රීන් අවබෝධ කර ගත යුතුව ඇත. ක්‍රියාත්මක කිරීමට නොහැකි අසාධාරණ තීරණ කාරක සභාව විසින් ලබා නොදෙන අතර, එලෙස ලබා දුනහොත් අප විසින්ම කාරක සභාව හෑල්ලුවට ලක් කිරීමක් කර ගන්නා අතර ඒ තුළින් පාර්ලිමේන්තුවේ උත්තරීතර භාවය හා විශ්වාසනීයත්වය පිළිබඳවද ගැටළුවක් මහජනතාවට ඇති වන බැවින් ද, කාරක සභාව ඒ පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වා කටයුතු කරන බව හා කළයුතු බව සඳහන් කරමි. කෙසේ වුවද, කාරක සභාව පෙත්සම්කරුවන්ගේ ගැටළු දෙස මානුෂිකව සලකා බලා, කාරක සභාවේ ප්‍රතිපාදන තුළ ඔවුනට හැකි පමණ සහන සැලසීමට පියවර ගන්නා බව ද සඳහන් කරමි.

එසේම, පාර්ලිමේන්තුවේ මහලේකම්තුමාටත්, කාරක සභාවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ඉතා උනන්දුවෙන් හා කැපවීමෙන් කටයුතු කරන මහජන පෙත්සම් පිළිබඳ කාරක සභා කාර්යාංශයේ කාර්ය මණ්ඩලයටත්, පාර්ලිමේන්තුවේ කථා පරිවර්තක අංශයටත්, සෙසු කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තූතිය පිරිනැමීමටද මෙය අවස්ථාවක් කර ගනිමි.

තවද, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා සභික මන්ත්‍රීවරුන්ගේ හා පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ සහාය වත්මන් කාරක සභාවේ සභාපතිවරයා වශයෙන් ඉදිරියටත් මම අපේක්ෂා කරමි.

**ස්තූතියි.**

**සුජීව සේනසිංහ, පා.ම.**
**ජාත්‍යන්තර වෙළෙඳ රාජ්‍ය අමාත්‍ය**
**සභාපති - මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව**
**2016.11.29**

## 1. පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව

රාජ්‍ය ආයතනවල නිලධාරීන් විසින් සමහර අවස්ථාවලදී ගනු ලබන තීරණ අසාධාරණ හා අයුක්ති සහගත විය හැකි වන අතර, එවැනි අවස්ථාවලදි මහජනතාවට ඒ සම්බන්ධයෙන් සිය දුක්ගැනවිලි ඉදිරිපත් කළ හැකි වැදගත් ස්ථානයක් වන්නේ පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවයි.

එම කාරක සභාව,

(i) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්)

(ii) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභාව

(iv) පරිපාලන විනිශ්චය අධිකාරිය

වැනි මහජනතාවට පිළිසරණ වන ආයතනවලට වැඩිමනත්ව හෝ ඒවාට සමාන්තරව හෝ ක්‍රියාත්මක වන්නේය.

## 2. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ ආරම්භය සහ එහි විකාශය

1833 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයකට මෙහි පැමිණි කෝල්බෲක් සාමි විසින්ද ඉන්පසු පැමිණි ඩොනමෝර් සාමි සහ 1947 හඳුන්වා දුන් සෝල්බරි ව්‍යවස්ථාවේද බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමයේ ආභාෂය අනුව යමින් මහජන දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා යම්කිසි ක්‍රියාමාර්ගයන් තිබී ඇති බව සිතිය හැකි වන්නේ 1946 දී පාර්ලිමේන්තුවේ සභා ගර්භයේ කටයුතු නිසියාකාරව පවත්වා ගැනීම සඳහා සකසන ලද ස්ථාවර නියෝගයන්හි අංක 27-30 දක්වා පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව පිළිබඳව සඳහන් වන බැවිනි. ස්ථාවර නියෝගයන්ට පසුව කරන ලද සංශෝධනයන්හිදී ද අපට එම ප්‍රතිපාදනයන් දැකිය හැකි අතර එකල සිටම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව සම්බන්ධයෙන් ප්‍රතිපාදන තිබුන ද ලිපි ගොණු හෝ ඒ බව සඳහන් මූලාශ්‍ර සොයා ගැනීමට නොහැකි වූ බැවින් එය ක්‍රියාත්මක වී ඇති ආකාරය පිළිබඳ පැහැදිලි තොරතුරු ලබා දීමට අපහසු වී ඇත. කෙසේවුවද මුල් කාලවලදී කාරක සභාවේ සභාපති ලෙස ගරු කථානායකතුමා කටයුතු කර ඇති බව 1981.11.12 දිනැති හැන්සාඩ් වාර්තාවේ සඳහන් තොරතුරු අනුව පෙනී යයි.

1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 74 ව්‍යවස්ථාව මගින් පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු විධිමත්ව කිරීම සඳහා ද, පාර්ලිමේන්තුවේ රැස්වීම්වලදී විනය ආරක්ෂා කිරීම සඳහා ද ස්ථාවර නියෝග පැනවීමට පාර්ලිමේන්තුවට බලය දී ඇත. ඒ අනුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් එතෙක් පැවති ස්ථාවර නියෝග වැඩි දියුණු කොට 1979.05.01 දින සිට ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග පනවා ඇත. කෙසේවුවද මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට අදාළ වූ ස්ථාවර නියෝගවල මහජන පෙත්සම් පිළිබඳ කාරක සභා කාර්යාංශය ක්‍රියා කළ යුතු ආකාරය නිසි පරිදි අර්ථ දක්වා නැති බැවින් පසුව 1981 නොවැම්බර් මස 03 දින එය සවිස්තර වන පරිදි අදාළ ස්ථාවර නියෝග සංශෝධනය කර ඇත. එතැන් පටන් එම නියෝගද කාරක සභාව විසින් වරින්වර කාලානුරූපීව ඇති කරගත්තාවූ රීතිද උපයෝගී කර ගනිමින් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවේ කාරක සභා කාර්යාංශයේ අනුකාරක සභාවක් ලෙස සිය කටයුතු වඩා විධිමත්ව සිදු කර ඇත.

පසුව එම කාර්යාංශයට ලැබුනු පෙත්සම් ප්‍රමාණය වසරින් වසර වැඩි වූ බැවින් ගරු මන්ත්‍රීවරුන් විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන පෙත්සම්වලට අදාල ලේකම් කාර්යාලීය කටයුතු, පසු විපරම් කටයුතු, සිහි කැඳවීම් ලිපි යැවීම්, ලිපිගොනු හා බහාලුම් සකස් කිරීම ආදියට කාරක සභා කාර්යාංශයට අතිරේක නිලධාරීන් අවශ්‍ය බවට පෙනී ගොස් ඇති අතර, මෙයට අමතරව අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා පෙත්සම් ඉදිරිපත් කරන මන්ත්‍රීවරුන් මෙන්ම පෙත්සම්කරුවන්ද නිරන්තරයෙන් ලේකම් කාර්යාලයෙන් ඒ පිළිබඳව විමසීම නිසා ලේකම් කාර්යාලයට පැවරුණු අධික කාර්ය භාරය කාර්යක්ෂමව ඉටුකර ගැනීම සඳහා මහජන පෙත්සම් සඳහා වෙනම කාර්යාංශයක් පිහිටුවිය යුතු බවට 1990 දී මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් යෝජනා කර ඇත. 2000 දශකය ආරම්භ වීමෙන් පසුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන පෙත්සම් ප්‍රමාණය සීඝ්‍රයෙන් වැඩි වී ඇති අතර, වෙනම කාර්යාංශයක් පිහිටුවීමේ අවශ්‍යතාව නැවතත් 2007 වසරේදීද යෝජනා කර ඇත.

මෙම යෝජනාව සඳහා පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල උපදේශක කාරක සභාවේ අනුමැතිය ලැබීමෙන් පසුව 2008 ඔක්තෝබර් මස 22 වැනි දින මහජන පෙත්සම් පිළිබඳ කාරක සභා කාර්යාංශය පිහිටුවන ලදුව, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කටයුතු වඩාත් කාර්යක්ෂමව කිරීමට කටයුතු සම්පාදනය කරන ලදි.

## 3. <u>කාරක සභාවේ සංයුතිය</u>

පාර්ලිමේන්තුවේ සියළුම දේශපාලන පක්ෂ නියෝජනය වන පරිදි තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලැබූ මන්ත්‍රීවරුන් දස දෙනෙකුගෙන් සමන්විත වන පරිදි හා ගණපූරණය 03 දෙනෙකු වන පරිදි මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව පිහිටුවා ඇත.

1981 න් පසුව එළැඹි කාල සීමාව තුළදී පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ යෝජනා මගින් ඒ ඒ කාරක සභාවල සාමාජික සංඛ්‍යාව වරින්වර වෙනස් කර ඇති අතර, ඒ අනුව 2008.02.05 හා 2009.06.10 දිනවලදී පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ යෝජනා මගින් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සාමාජික සංඛ්‍යාව 31 හා ඉන් අනතුරුව 33 දක්වා ද වැඩි කර ගෙන ඇත.

<u>2013.01.01 සිට 2015.06.26 දක්වා කාලය තුළ කාරක සභාව</u>

i. ගරු ලලිත් දිසානායක මහතා, සභාපති (2015.01.20 දින දක්වා)
ii. ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය, (2015.02.18 දින සිට කාරක සභාවේ සභාපතිනිය ලෙස)
iii. ගරු පවිත්‍රා දේවි වන්නිආරච්චි මහත්මිය
iv. ගරු ගාමිණී ලොකුගේ මහතා
v. ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
vi. ගරු කුමාර වෙල්ගම මහතා
vii. ගරු මුත්තු සිවලිංගම් මහතා
viii. ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
ix. ගරු ටී. බී. ඒකනායක මහතා
x. ගරු නිරූපමා රාජපක්ෂ මහත්මිය

xi. ගරු එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන මහතා
xii. ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
xiii. ගරු අචල ජාගොඩගේ මහතා
xiv. ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
xv. ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා (2013.05.31 දින දක්වා)
xvi. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
xvii. ගරු ෆයිසාල් කාසිම් මහතා
xviii. ගරු පොන් සෙල්වරාසා මහතා
xix. ගරු ගයන්ත කරුණාතිලක මහතා
xx. ගරු ඒ. විනයාගමූර්ති මහතා
xxi. ගරු තලතා අතුකෝරල මහත්මිය
xxii. ගරු අජිත් කුමාර මහතා
xxiii. ගරු දයාසිරි ජයසේකර මහතා (2013.07.29 දින දක්වා)
xxiv. ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
xxv. ගරු වසන්ත අලුවිහාරේ මහතා
xxvi. ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා
xxvii. ගරු සුජීව සේනසිංහ මහතා
xxviii. ගරු රෝසි සේනානායක මහත්මිය
xxix. ගරු හුනෛයිස් ෆාරුක් මහතා
xxx. ගරු අජිත් පී. පෙරේරා මහතා (2013.11.22 දින සිට)
xxxi. ගරු බුද්ධික පතිරණ මහතා (2013.11.22 දින සිට)

8 වන පාර්ලිමේන්තුවේ පළමුවන සැසිවාරය ආරම්භයේදී 2015.11.14 දින මහජන පෙත්සම් කාරක සභාවේ සාමාජික සංඛ්‍යාව 20 ක් විය යුතු බවට පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ යෝජනාව නැවත 2016.02.26 දිනැති යෝජනාව මගින් 22 දක්වා වැඩි කර ඇත.

<u>2015.11.14 සිට 2016.02.26 කාලය තුළ කාරක සභාව</u>

i. ගරු සුජීව සේනසිංහ මහතා, සභාපති
ii. ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
iii. ගරු ඩග්ලස් දේවානන්ද මහතා
iv. ගරු සාලින්ද දිසානායක මහතා
v. ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
vi. ගරු නිහාල් ගලප්පත්ති මහතා
vii. ගරු බිමල් රත්නායක මහතා
viii. ගරු රංජිත් අලුවිහාරේ මහතා
ix. ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
x. ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

xi. ගරු ක. තුරෙයිරත්නසිංහම් මහතා

xii. ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

xiii. ගරු විදුර වික්‍රමනායක මහතා

xiv. ගරු කනක හේරත් මහතා

xv. ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

xvi. ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

xvii. ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

xviii. ගරු චමින්ද විජේසිරි මහතා

xix. ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය

xx. ගරු එස්. සිවමෝහන් මහතා

2016.07.22 දින සිට ඉහත කාරක සභික මන්ත්‍රීන් 20 දෙනාට අමතරව ගරු වජිර අබේවර්ධන මහතා කාරක සභික මන්ත්‍රීවරයෙකු ලෙස පත්කර ඇති අතර ඒ අනුව අද වනවිට කාරක සභික මන්ත්‍රීන් 21දෙනෙක් කාරක සභාවේ සේවය කරන්නේය.

## 4. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ බලතල

1981 නොවැම්බර් මස 03 වන දින ස්ථාවර නියෝගවලට කරන ලද දෙවන සංශෝධනය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 25 අ පනවා ඇති අතර ඒ අනුව මන්ත්‍රීවරයෙකු විසින් පෙත්සමක් පාර්ලිමේන්තුවට පිළිගැන්වීමෙන් පසු එය මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන අතර, ස්ථාවර නියෝග අංක 128 අනුව එහි ඉදිරි කටයුතු කාරක සභාව විසින් සිදු කරනු ලබයි.

සංශෝධිත 1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ (මින්පසු වරප්‍රසාද පනත නම් වන) 10 වැනි වගන්තිය අනුව, ඕනෑම පුද්ගලයකු කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඔහු සතුව හෝ ඔහුගේ පාලනය යටතේ පවතින ලේඛනයක් ගෙන්වා ගැනීමේ බලය ද පාර්ලිමේන්තුවට හා/හෝ එය මගින් නිසි ලෙස ස්ථාපිත කර ඇති කාරක සභාවලට ඇති අතර, එම පනතේ 12 වන වගන්තිය අනුව වාචික පරීක්ෂණයක් මගින් ඔවුන්ගෙන් සාක්ෂි ලබා ගැනීමේ බලතල ද ලබා දී ඇත. ඒ අනුව ස්ථාවර නියෝග 128(7) පනවා එම බලය අනුව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කටයුතු පවත්වාගෙන යනු ලැබේ.

ස්ථාවර නියෝග 128 (4) හා (5) අනුව කාරක සභාව විසින් පෙත්සම් පිළිබඳ ස්වකීය මතය හා ඒ පෙත්සම් සම්බන්ධයෙන් නිර්දේශ කිරීමට සුදුසුයැයි තමන් කල්පනා කරන අනෙකුත් අදහස් කලින් කලට පාර්ලිමේන්තුවට වාර්තා කිරීම කළ යුතු වේ.

වරප්‍රසාද පනතේ 16 හා 17 වගන්ති අනුව කාරක සභා ඉදිරියේ සාක්ෂි දෙනු ලබන පුද්ගලයන් හා එම සාක්ෂි ආරක්ෂා කරන අතර, එම පනතේ 14 වගන්තිය යටතේ සාක්ෂි දෙන පුද්ගලයන්ට යුතුකම් පවරා ඇත.

කාරක සභාවේ රැස්වීම්වලට හේතු නොදක්වා නොපැමිණෙන හා/හෝ අදාල ලේඛන ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන නිලධාරීන් සම්බන්ධයෙන් ඉහත සඳහන් පනතේ උපලේඛනයේ "ආ" කාණ්ඩය යටතේ පාර්ලිමේන්තුව මගින් හෝ ශ්‍රේෂ්ඨාධිකරණය මගින් දඬුවම් කළ හැක.

කාරක සභාවට නිර්දේශ පමණක් කිරීමට හැකි අතර එම නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාවක් නොමැති බැවින් එහි කටයුතු පාර්ශ්ව එකඟතාව යන සංසිද්ධිය උපයෝගි කොට ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන අතර ඒ සඳහා එකඟතාවයන් අනුව කටයුතු කිරීම පසුව ප්‍රතික්ෂේප කිරීම, පාර්ලිමේන්තුව ඉදිරියේ අසත්‍ය ප්‍රකාශ කිරීම යටතේ වරප්‍රසාද පනතේ උප ලේඛනයේ "අ" කොටස යටතේ ***ශ්‍රේෂ්ඨාධිකරණය මගින් දඬුවම් කළ හැකි වරදක්*** යන ප්‍රතිපාදනය කාරක සභාව ගෙනහැර දක්වන්නීය. බොහෝ අවස්ථාවලදී පරිපාලනමය තීරණවල දරදඬු ස්වභාවය ලිහිල් කිරීමට කාරක සභාව කටයුතු කරන අතර, හැකි සෑමවිටම නීතිමය රාමුවට පමණක් සීමා නොවී මානුෂීය ලෙස ගැටළු දෙස බැලීමට කාරක සභාව උත්සාහ දරයි. පාර්ශ්ව එකඟතාව මත පෙත්සම්කරුවන්ට සහන ලබා දීමට උත්සාහ දරන කාරක සභාව එහිදී සමථකරුවකුගේ කාර්ය භාරය ඉටු කරයි. කෙසේ වුවද, පාර්ශවයන් එකඟතාවලට නොඑළඹෙන අවස්ථාවලදී කාරක සභාවට සාධාරණයැයි හැඟෙන නිර්දේශ ලබා දීමටද කාරක සභාව පසුබට නොවෙයි.

පෙත්සම්වල අන්තර්ගත කරුණු ප්‍රසිද්ධ නොකරන අතර කාරක සභාව විසින් ගනු ලබන සාක්ෂි කිසිවක් ජනමාධ්‍යවලට විවෘත කරනු නොලැබේ.

පෙත්සම්කරුවනට තම කරුණු නිසි පරිදි ගොනු කර කාරක සභාව ඉදිරියේ ප්‍රකාශ කිරීමට අපහසු වේ නම්, ඔවුනට රැකවරණ නිලධාරියකුගේ සහාය ලබා ගැනීමේ අවකාශය කාරක සභාව ලබා දී ඇති අතර, කෙසේ වෙතත්, එලෙස රැකවරණ නිලධාරියකු සමග පැමිණීම කාරක සභාව දිරිමත් නොකරනුයේ පෙත්සම්කරුට අනවශ්‍ය වියදමක් ඒ සඳහා දැරීමට සිදුවන බැවිනි.

කාරක සභාව විසින් පරීක්ෂණ පැවැත්වීමේ ක්‍රියා පටිපාටිය නම්‍යශීලී වන අතර පරීක්ෂණයේ විවිධ අවස්ථා සම්බන්ධව විශේෂිත කාලසීමා පනවා නොමැති වුවද හැකි ඉක්මණින් පෙත්සම් විමර්ශනයකොට සාධාරණ නිර්දේශ ලබා දීම කාරක සභාවේ අභිප්‍රාය වේ.

## 5. <u>ගරු මන්ත්‍රීවරු විසින් පෙත්සම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම</u>

මේ පිළිබඳ ක්‍රියා පටිපාටිය ස්ථාවර නියෝග 25 අ හි දැක්වේ (ස්ථාවර නියෝග 25 අ පරිශිෂ්ඨයක් ලෙස පෙන්වා ඇත.) ඒ අනුව පෙත්සම ගරු කථානායකතුමා අමතා තිබිය යුතු අතර, එය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු මගින් එවිය යුතුය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා පෙත්සමෙහි ඉහළින් අත්සන් කොට තිබීම මේ සඳහා අවශ්‍ය වේ. තවද, පෙත්සම්කරු විසින් තමාට සිදු වූ අයුක්තිය හෝ අසාධාරණය පැහැදිලිව හා ඉතාමත් කෙටියෙන් පෙත්සමෙහි සඳහන් කළ යුතු අතර, තමා විසින් ඉල්ලා සිටිනු ලබන සහනය කුමක්ද යන්න පැහැදිලිව පෙත්සමෙහි අවසානයේ සඳහන් කර තිබිය යුතුය. පෙත්සම්කරු හෝ පෙත්සම්කරුවන් විසින් පෙත්සමෙහි අත්සන් තබා තිබිය යුතු අතර, ලිවීමට නොහැකි අයෙකු තම මහපටැඟිලි සළකුණ සාක්ෂිකරුවෙකු ඉදිරියේ තබා තිබිය යුතුය. පෙත්සමක ආදර්ශයක් උපලේඛන 1 හි දක්වා ඇති අතර පෙත්සමක් ප්‍රතික්ෂේප කිරීමට අදාළ වන හේතු උපලේඛන 2 හි දැක්වේ. පෙත්සමට වෙනත් කුමන ආකාරයක හෝ ලේඛන සහ දිවුරුම් පත්‍රිකා අමුණා නොතිබිය යුතුය.

මෙලෙස ලැබෙන පෙත්සම්, පාර්ලිමේන්තුවේ මහ ලේකම් කාර්යාලයේ පෙත්සම් කාරක සභා කාර්යාංශය විසින් පරීක්ෂා කොට, එම පෙත්සම් අදාළ ස්ථාවර නියෝගවලට අනුකූල නම්, ඒවා පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා මගින් ගරු කථානායකතුමාගේ අනුමැතියට ඉදිරිපත් කරනු ලැබේ. ගරු කථානායකතුමාගේ අනුමැතිය ලැබුණු පෙත්සම් අදාළ මන්ත්‍රීවරයා විසින් සභා ගර්භයේදී පිළිගන්වනු ලබයි. එසේ පිළිගන්වන ලද පෙත්සම් ගරු කථානායකතුමා විසින් ඉදිරි කටයුතු සඳහා නැවත මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලබයි.

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට දිනපතා විශාල වශයෙන් පෙත්සම් ලැබෙන අතර එම පෙත්සම්වලින් 25%ක් පමණ ස්ථාවර නියෝගවලට අනුකූල නොවීම හා කාරක සභාව විසින් කලින් කල ගන්නා තීරණ මත ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ.

## 6. <u>මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කාර්ය භාරය</u>

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව පෙත්සමක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසු එය පහත දෙආකාරයට විමර්ශනය කිරීමට කාරක සභාවට අභිමතය ඇත.

(අ) කාරක සභාව විසින්ම විමර්ශනය කිරීම

(ආ) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත යවා ඔහුගේ නිශ්චයන් ලබාගෙන එම නිශ්චයන් විමර්ශනය කිරීම

### (අ) <u>කාරක සභාව විසින්ම විමර්ශනය කිරීම</u>

පෙත්සම අදාළ අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමුකොට වාර්තාවක් ලබා ගැනීමෙන් පසු එම වාර්තාවේ උද්ධෘතය සම්බන්ධව පෙත්සම්කරුගේ අදහස් ලබා ගැනීම සඳහා ඔහු වෙත යවයි. එම අදහස් ලද පසු පෙත්සම, කාරක සභාව ඉදිරියේ විමර්ශනයට සූදානම් අතර, විමර්ශනයට දින නියම කර පෙත්සම්කරුට ද, අදාල අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ද, අදාළ නිලධාරීන් වෙත ද රැස්වීමට පැමිණෙන ලෙස දන්වා කැඳවීමේ ලිපි යවනු ලැබේ. පෙත්සමට අදාල වන අනෙකුත් නිලධාරීන් වේ නම් ඔවුන් ද, අදාල වන ලේඛන ද රැගෙන නියමිත දින රැස්වීමට පැමිණීම ඒම අමාත්‍යාංශයේ ලේකම්ගේ වගකීමක් වන අතර එහිදී ලිපිගොනු පරීක්ෂා කරමින්, නිලධාරීන්ගෙන් හරස් ප්‍රශ්න අසමින් කරුණු පැහැදිලි කර ගනිමින් පෙත්සම් විමර්ශනය කොට පෙත්සම්කරුට සහනයක් ලබා දීම සඳහා පාර්ශවයන් අතර එකඟතාවයක් ඇති කිරීමට කාරක සභාව ප්‍රයත්න දරන අතර එලෙස එකඟතාවයන් ඇති වූ කල්හි එය ක්‍රියාත්මකකොට පෙත්සම්කරුට සහන සැලසීම අමාත්‍යාංශ ලේකම්ගේ වගකීමක් ලෙස කාරක සභාව සලකනු ලබයි.

### (ආ) <u>පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්ගේ (ඔම්බුඩ්ස්මන්) නිශ්චයන් ලබා ගැනීම</u>

රජයේ නිලධරයන් විසින් සහ අර්ධ රාජ්‍ය සහ සංස්ථාවල, පළාත් පාලන ආයතනවල හා එවැනි වෙනත් ආයතනවල නිලධරයන් විසින් සිදු කරනු ලබන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සහ වෙනත් අසාධාරණ ක්‍රියා ගැන කරනු ලබන පැමිණිලි හෝ චෝදනා නීතියේ විධිවිධානවලට අනුකූලව හා යටත්ව පරීක්ෂා කර බලා වාර්තා කිරීමේ කාර්ය භාරය ඉටු කිරීම සඳහා පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) ධූරය ඇති කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් නීතියේ විධිවිධාන සැලැස්විය යුතු බවට වූ 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ අංක 156 වැනි ව්‍යවස්ථාව අනුව 1981 අංක 17 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනත පාර්ලිමේන්තුව විසින් නීතිගත කර ඇත.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමන් විසින් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයෙකු (ඔම්බුඩ්ස්මන්) පත් කරන අතර 1981 අංක 17 දරන ඔම්බුඩ්ස්මන් පනතේ 10 වන වගන්තිය අනුව පාර්ලිමේන්තුවට ලැබෙන පෙත්සම්වලින් යම් ප්‍රමාණයක් ඔහු වෙත යොමු කරන එම පෙත්සම් විමර්ශනයකොට එම පනතේ 17 වන වගන්තිය අනුව ඔම්බුඩ්ස්මන්ගේ නිශ්චය කිරීම් එම නිශ්චයනට හේතු සමග කාරක සභාව වෙත ලබාදේ. මෙලෙස ලැබෙන නිශ්චයන් පාර්ශව කැඳවීමකින් තොරව කාරක සභාවේදී නැවත විමර්ශනය කරන අතර එම නිශ්චයන් සමග කාරක සභාව එකඟ වේ නම් ඒ බව දන්වමින් හා එම නිශ්චයන් ක්‍රියාත්මක කරන ලෙස දන්වමින් අදාල පාර්ශවයන් වෙත ලිපි යොමු කිරීම කාර්යාංශය මගින් සිදු කරයි.

ඔම්බුඩ්ස්මන් විසින් නිශ්චයන් නොකොට එවනු ලබන පෙත්සම් ද, ඔම්බුඩ්ස්මන්ගේ නිශ්චයන් හා තවදුරටත් විමර්ශනය කල යුතු බවට කාරක සභාව අදහස් කරන විටක එම පෙත්සම් සම්බන්ධයෙන්ද කාරක සභාව ඉහත අංක (අ) හි සඳහන් ආකාරයට නැවත කටයුතු කරයි.

මහජන පෙත්සම් කාරක සභාව විසින් යොමු කරන පෙත්සම් සම්බන්ධයෙන් ඔම්බුඩ්ස්මන්වරුන් කාරක සභාව සමඟ ඉතා සහයෝගයෙන් කටයුතු කළ අතර 1981 වසරේ සිට 2016.08.31 දින දක්වාම එකී ධූරයේ කටයුතු කළ/කරන ඔම්බුඩ්ස්මන්වරුන්ගේ නාම ලේඛනය පහත දක්වා ඇත.

| | |
|---|---|
| 1. සැම් විජේසිංහ මහතා | 1982 - 1991 |
| 2. එල්. එච්. අල්විස් මහතා | 1991 - 1993 |
| 3. ජී. අබේගුණසේකර මහතා | 1993 - 1995 |
| 4. මහාචාර්ය බී. ඊ. එස්. ජේ. බැස්ටියන්පිල්ලේ මහතා | 1995 - 2001 |
| 5. ආචාර්ය ආර්. බී.රණරාජා මහතා | 2001 - 2010 |
| 6. එල්. ඒ. තිස්ස ඒකනායක මහතා | 2010 සිට |

## 7. 1981 වර්ෂයේ සිට මේ දක්වා කාලය තුළ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවන්හි සේවය කළ සභාපතිවරුන් සහ අදාළ නිලධාරීන්

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සේවය කළ/ කරන සභාපතිවරුන්ගේ නාමලේඛනය සහ ඔවුන් යෝජනා හා ස්ථිර කරන ලද ගරු මන්ත්‍රීවරුන් :—

| **1.** ගරු අල්හාජ් අබ්දුල් බාකීර් මාකර් මහතා | | **1983** - 1988 |
|---|---|---|
| 1983.03.10 | යෝජනා කළේ | ගරු එම්. සිවසිදම්පරම් මහතා |
| | ස්ථිර කළේ | ගරු ඒ.එම්.ආර්.බී. අත්තනායක මහතා |
| 1984.03.08 | යෝජනා කළේ | ගරු ඩබ්ලිව්. දහනායක මහතා |
| | ස්ථිර කළේ | ගරු මෙරිල් කාරියවසම් මහතා |
| 1985.03.05 | යෝජනා කළේ | ගරු ඩබ්ලිව්. දහනායක මහතා |
| | ස්ථිර කළේ | ගරු ආර්.පී. විජේසිරි මහතා |
| 1986.03.05 | යෝජනා කළේ | ගරු මෙරිල් කාරියවසම් මහතා |
| | ස්ථිර කළේ | ගරු එම්. හලීම් ඉෂාක් මහතා |
| 1987.02.25 | යෝජනා කළේ | ගරු ඩබ්ලිව්. දහනායක මහතා |
| | ස්ථිර කළේ | ගරු එම්. හලීම් ඉෂාක් මහතා |
| 1988.03.01 | යෝජනා කළේ | ගරු මෙරිල් කාරියවසම් මහතා |
| | ස්ථිර කළේ | ගරු ඊ. පී. පෝල් පෙරේරා මහතා |

| **2.** ගරු ස්ටැන්ලි තිලකරත්න මහතා | | **1989 - 1990** |
|---|---|---|
| 1989.03.23 | යෝජනා කළේ | ගරු මහින්ද රාජපක්ෂ මහතා |
| | ස්ථිර කළේ | ගරු ගීතාංජන ගුණවර්ධන මහතා |

| **3.** ගරු චන්ද්‍රා රණතුංග මහතා | | **199**0 - 1994 |
|---|---|---|
| 1990.05.21 | යෝජනා කළේ | ගරු ස්ටැන්ලි තිලකරත්න මහතා |
| | ස්ථිර කළේ | ගරු මහේන් ගුණසේකර මහතා |
| 1991.05.16 | යෝජනා කළේ | ගරු ආතාවුද සෙනෙවිරත්න මහතා |
| | ස්ථිර කළේ | ගරු ස්ටැන්ලි තිලකරත්න මහතා |
| 1993.06.17 | යෝජනා කළේ | ගරු ආතාවුද සෙනෙවිරත්න මහතා |
| | ස්ථිර කළේ | ගරු සෝමසාර දසනායක මහතා |

| | | |
|---|---|---|
| **4.** ගරු මහින්ද විජේසේකර මහතා | | **1995** - 1999 |
| 1995.02.22 | යෝජනා කළේ | ගරු සුරනිමල රාජපක්ෂ මහතා |
| | ස්ථිර කළේ | ගරු සුමිතා ප්‍රියංගනී අබේවීර මහත්මිය |
| 1996.03.19 | යෝජනා කළේ | ගරු නන්දමිත්‍ර ඒකනායක මහතා |
| | ස්ථිර කළේ | ගරු තිලක් කරුණාරත්න මහතා |
| **5.** ගරු චමල් රාජපක්ෂ මහතා | | 1999 - 2001 |
| 1999.08.03 | යෝජනා කළේ | ගරු සුරනිමල රාජපක්ෂ මහතා |
| | ස්ථිර කළේ | ගරු කේසරලාල් ගුණසේකර මහතා |
| **6.** ගරු හරින්ද්‍ර ජේ. කොරයා මහතා | | **2001- 2002** |
| 2001.05.10 | යෝජනා කළේ | ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා |
| | ස්ථිර කළේ | ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා |
| **7.** ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා | | 2002 - 2003 |
| 2002.03.05 | යෝජනා කළේ | ගරු නිහාල් ගලප්පත්ති මහතා |
| | ස්ථිර කළේ | ගරු කේ. වේලියුදම් මහතා |
| 2003.12.15 | යෝජනා කළේ | ගරු අජිත් කුමාර මහතා |
| | ස්ථිර කළේ | ගරු නිහාල් ගලප්පත්ති මහතා |
| **8.** ගරු ඩිව් ගුණසේකර මහතා | | **2004** - 2005 |
| 2004.09.23 | යෝජනා කළේ | ගරු පියසේන ගමගේ මහතා |
| | ස්ථිර කළේ | ගරු ජෝසප් මයිකල් පෙරේරා මහතා |
| **9.** ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා | | 2006 - 2010 අප්‍රේල් |
| 2006.06.20 | යෝජනා කළේ | ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා |
| | ස්ථිර කළේ | ගරු ඩිව් ගුණසේකර මහතා |
| 2008.07.23 | යෝජනා කළේ | ගරු වජිර අබේවර්ධන මහතා |
| | ස්ථිර කළේ | ගරු සුසන්ත පුංචිනිලමේ මහතා |

| **10.** ගරු ජානක බණ්ඩාර මහතා | | 2010 ජූලි - **2012** ජනවාරි |
|---|---|---|
| 2010.07.03 | යෝජනා කළේ | ගරු ටී. බී. ඒකනායක මහතා |
| | ස්ථිර කළේ | ගරු සුසන්ත පුංචිනිලමේ මහතා |

| **11.** ගරු ලලිත් දිසානායක මහතා | | 2012 මාර්තු - 2015 පෙබරවාරි |
|---|---|---|
| 2012.03.22 | යෝජනා කළේ | ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා |
| | ස්ථිර කළේ | ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා |

| **12.** ගරු (වෛද්‍ය) සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය | | 2015 පෙබරවාරි සිට |
|---|---|---|
| 2015.02.18 | යෝජනා කළේ | ගරු ඒ. විනායගමූර්ති මහතා |
| | ස්ථිර කළේ | ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා |

| **13.** ගරු සුජීව සේනසිංහ මහතා | | 2015 දෙසැම්බර් සිට |
|---|---|---|
| 2015.12.02 | යෝජනා කළේ | ගරු සුසන්ත පුංචිනිලමේ මහතා |
| | ස්ථිර කළේ | ගරු නිහාල් ගලප්පත්ති මහතා |

පාර්ලිමේන්තුවේ මහ ලේකම් නිල බලයෙන් කාරක සභාවේ ලේකම් වේ. ඒ අනුව 1981 සිට හිටපු මහ ලේකම්වරුන් වන එස්.එන්. සෙනෙවිරත්න මහතා, බී.එස්.බී තිත්තවැල්ල මහතා, ප්‍රියානි විජේසේකර මහත්මිය, ධම්මික කිතුල්ගොඩ මහතා මෙන්ම වත්මන් පාර්ලිමේන්තුවේ මහ ලේකම් ඩබ්ලිව්.බී.ඩී. දසනායක මහතා ද පාර්ලිමේන්තුවේ මහ ලේකම් නියෝජනය කරමින් මහජන පෙත්සම් කාරක සභාවේ කාරක සභාවේ ලේකම් ලෙස කටයුතු කිරීමට මහජන පෙත්සම් කාරක සභා කාර්යාංශයේ සහකාර අධ්‍යක්ෂකවරුන්ට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. එසේම නියෝජ්‍ය මහ ලේකම් සහ සහකාර මහ ලේකම්වරුන් විසින් අවශ්‍ය අවස්ථාවන්හීදී පාර්ලිමේන්තුවේ මහ ලේකම්ට සහාය ලබා දෙමින් කාරක සභාවේ කටයුතු අධීක්ෂණය කරනු ලබයි.

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ නියමයෙන් පහත දැක්වෙන නිලධාරීන් ඒ ඒ වකවානුවලදී මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ ලේකම්වරුන් වශයෙන් සේවය කර ඇත.

1. කේ. ටී . එන්. ද සිල්වා මහතා - 1981
2. එම්. එස්. එම්. සී. බී. සකලසූරිය මහතා - 1985
3. ඩබ්ලිව්. පල්ලියගුරුගේ මහතා - 1986
4. රොනල්ඩ් ඒ. ද සොයිසා මහතා - 1987
5. ටී. එච් .ඒ. එල්. ද සිල්වා මහතා - 1991
6. යූ. විජේසිංහ මහතා - 1995

7. ජේ.ආර්. ගජවීර ආරච්චිගේ මහතා - 2000
8. ජේ.සමරවීර මහතා - 2002
9. එන්.එස්.කේ.වෛද්‍යරත්න මහතා - 2006
10. ඩබ්ලිව්.එම්.පී. ද සිල්වා මහතා - 2008
11. රමණී ජයවර්ධන මහත්මිය - 2011
12. ශ්‍යාමා එම්. ප්‍රනාන්දු මහත්මිය - 2013 සිට

## 8. හත්වන පාර්ලිමේන්තුවේ එනම් 2013.01.01 දින සිට 2015.06.26 දින තෙක් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කටයුතු

හය වන පාර්ලිමේන්තුව 2010.02.05 දින විසුරුවා හැර 2010.04.08 දින පැවැත්වූ පාර්ලිමේන්තු මහා මැතිවරණයෙන් පසුව පිහිටුවන ලද හත්වැනි පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේදී ඇති කර ගත් විශේෂ යෝජනා සම්මතයක් අනුව හයවැනි පාර්ලිමේන්තුව තුළදී කාරක සභාවට ලැබුණු පරීක්ෂණ කටයුතු අවසන් කිරීමට නොහැකි වූ පෙත්සම් හත්වැනි පාර්ලිමේන්තුව තුළදී සලකා බලන ලදී. එසේම සලකා බැලීම සඳහා හත්වැනි පාර්ලිමේන්තුවට අළුතින් ලැබුණු පෙත්සම්ද විශාල ප්‍රමාණයක් විය.

මීට අමතරව කාරක සභා කාර්යාංශයේ යෝජනාවක් පරිදි සෑම කාරක සභා රැස්වීම් දිනකම පෙත්සම්කරුවන් කැඳවා පෙත්සම් සාකච්ඡා කර අවසන් වූ පසු කාරක සභා තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් එදිනට නියමිත අමාත්‍යාංශයේ හා අනෙකුත් නිලධාරීන්ගෙන් කාරක සභාවේදී එම අමාත්‍යාංශය සම්බන්ධයෙන් විමසා ඇති පෙත්සම් සම්බන්ධ එකඟතා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය විමසා බැලීමට කටයුතු කළ අතර මේ ආකාරයට එක් දිනකට පෙත්සම් 5-10 අතර ප්‍රමාණයක් පසු විපරම් කිරීමට හැකිවීමෙන් කාර්යක්ෂමතාවය ඉහල නංවන ලදී.

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් කාරක සභාවට යොමු කරනු ලබන පෙත්සම් ඔවුන් විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී ඒ බව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දැනුවත් කරන ලද්දේ ලිපියක් මාර්ගයෙන් වුවද එලෙස දැනුම්දෙන දිනය ඔවුනට පහසු නොවන අවස්ථාවලදී පෙත්සම් ඉදිරිපත් කිරීමට ඔවුන් නොපැමිණීමෙන් යම් ප්‍රමාදයක් සිදුවිය. එබැවින් දූරකථනය මාර්ගයෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සෘජුවම සම්බන්ධ කර ගැනීමෙන් පෙත්සම් ඉදිරිපත් කිරීමට ඔවුනට පහසු දිනයක් වෙන් කර ගැනීම තුළින් ඉහත ප්‍රමාදය අවම කර ගැනීමට කාරක සභාව සමත් විය.

විවිධාකාර අන්දමින් අසාධාරණයට ලක්වන කාන්තාවන්ගේ ගැටළු පිළිබඳ ඉදිරිපත් වන පෙත්සම් කඩිනමින් හා කාර්යක්ෂම ලෙස නිරාකරණය කිරීම සඳහා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගෙන් සමන්විතව 2014.03.06 වන දින පත් කරන ලද අනු කාරක සභාව මගින් පෙත්සම් 61ක් විමර්ශනය කිරීමට කටයුතු කරන ලදි.

**9.** <u>2015.06.26 දින සිට 2015.09.01 දින තෙක් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ කටයුතු :—</u>

හත්වන පාර්ලිමේන්තුව විසුරුවා හරින ලද 2015.06.26 දින සිට අටවන පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරය ආරම්භ කළ 2015.09.01 දින තෙක් කාලය තුළ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව පහත සඳහන් කර්තව්‍යයන්හි නිරතවී ඇත.

(i) ඉදිරියේදී පාර්ලිමේන්තුව විසුරුවා හැරීමක් සිදුවුවහොත්, කාරක සභාව වෙත යොමු කර ඇති පෙත්සම් සම්බන්ධයෙන් තවදුරටත් කටයුතු කිරීමට නොහැකි වීමෙන් පෙත්සම්කරුවන්ට සිදුවන අසාධාරණය වැළැක්වීම පිණිස එවන් පෙත්සම් විමර්ශනය සඳහා පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්) වෙත යොමු කිරීම සුදුසු යැයි 2015.06.12 දින පැවති මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේදී එළඹි තීරණය අනුව 2015.06.26 වන දින පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් අනතුරුව පෙත්සම් 100ක් පමණ විමර්ශන කටයුතු සඳහා ඔම්බුඩ්ස්මන්වරයා වෙත යොමු කරන ලදි.

(ii) හත්වන පාර්ලිමේන්තුව 2015.06.26 දින විසුරුවා හැරීම හේතුවෙන් සියලු පෙත්සම්වල කටයුතු අවසන් වූ බැවින් එතෙක් කාරක සභාව හමුවේ විමර්ශනය වෙමින් පැවති පෙත්සම් වෙනුවෙන් 8 වැනි පාර්ලිමේන්තුවට නව පෙත්සමක් ඉදිරිපත්කරන ලෙස අදාළ සියලු පෙත්සම්කරුවන්ට ලිඛිතව දන්වා යවන ලදී.

10. <u>මහජන පෙත්සම් පිළිබඳ කාරක සභා කාර්යාංශය විසින් මෙම කාල සීමාව තුළ ලෙස ඇති ප්‍රතිපත්තිමය තීරණ :—</u>

(i) පෙත්සම් ඉදිරිපත් කිරීමේ පොදු ආකෘතියක් සකස් කිරීමට සහ එහිදී සලකා බලන කරුණු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මාර්ගයෙන් මහජනතාවට දැනුම් දීමට,

(ii) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පෙත්සම් ඉදිරිපත් කිරීමේදී පොදු ආකෘතියක් යටතේ ඉදිරිපත් කිරීමටත් එම ආකෘතිය සියලුම මහජන නියෝජිතයන් හරහා මහජනතාවට දැනුම්දීමට, (මෙහි පළමුවන උපලේඛනය යටතේ පෙත්සම් ඉදිරිපත් කිරීමේ පොදු ආකෘතිය ඉදිරිපත් කර ඇත.)

(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තාක්ෂණික කරුණක් මත වරක් ප්‍රතික්ෂේප කර ඇති පෙත්සම්වලදී පෙත්සම්කරුවන්ට පැහැදිලිවම අසාධාරණයක් සිදු වී ඇතිනම්, එවැනි පෙත්සම් අමාත්‍යාංශයේ හිතකර නිර්දේශද සමඟ නැවත සලකා බැලීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අවධානයට යොමු කිරීමට,

(iv) කාරක සභාව විසින් කරනු ලබන නිර්දේශවලට කාරක සභාවේදී එකඟතාවයකට පැමිණ පසුව එම එකඟතාව උල්ලංඝනය කරනු ලබන අමාත්‍යාංශ නිලධාරීන් නිසා පෙත්සම් කාරක සභාව හැල්ලුවට ලක් වන බැවින් එබඳු නිලධාරීන්ට පාර්ලිමේන්තු බලතල හා වරප්‍රසාද පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව සහ දණ්ඩ නීති සංග්‍රහයේ 190 වැනි වගන්තිය යටතේ දඬුවම් පැනවීමට අවකාශ තිබුනද එම ක්‍රියා මාර්ගය දුරස්ථ හා ප්‍රායෝගික වශයෙන් ක්‍රියාත්මක කිරීමට අපහසු එකක් බවද කාරක සභාව විසින්

නිරීක්ෂණය කරන ලදි. තවද නිලධාරින් කාරක සභාව හමුවේ එකඟ වූ කරුණු ක්‍රියාත්මක කිරීමේදී ඔවුන්ට මුහුණ දීමට සිදුවන නෛතික හා දෙපාර්තමේන්තුමය ගැටළු සැලකිල්ලට ගත් කාරක සභාව එවන් ගැටළු මතුවන අවස්ථාවලදී කාරක සභාවේ එකඟතාවය මත නැවත විමර්ශනය කොට අවශ්‍ය සංශෝධන කිරීමට ද, (කෙසේ වුවද, එකඟතාවලට එළැඹීමේදී නිලධාරීන් මීට වඩා වගකීමකින් කටයුතු කළ යුතු බවට)

(v) අධිකරණ සේවා කොමිෂන් සභාවේ විෂය පථය යටතට ගැනෙන පෙත්සම් සම්බන්ධයෙන් වාර්තා එවීම එම කොමිෂම විසින් ප්‍රතික්ෂේප කර ඇති බැවින් ඒ සම්බන්ධයෙන් තීරණයක් ගන්නා තෙක් එම පෙත්සම් සම්බන්ධයෙන් කටයුතු නොකිරීමට,

(vi) පාසැල්වල පළමු වසරට ළමුන් ඇතුළත් කර නොගැනීම සම්බන්ධයෙන් යොමු කර ඇති පෙත්සම් සලකා නොබැලීමට, (2011.06.08 දිනැති කාරක සභා තීරණය)

(vii) මානව හිමිකම් කොමිෂන් සභාව, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්වරයා) හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඉදිරියේ වර්තමානයේ විමර්ශනය වෙමින් පවතින පෙත්සම්, එම ආයතනවල විමර්ශනය අවසන් වූ පසු සලකා බැලීමට,

(viii) කාරක සභාව විසින් තීරණයක් ලබා දී නිෂ්ප්‍රභ කරන ලද පෙත්සම් නැවතත් තවත් සහන ලබා දෙන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කර ඇති අවස්ථාවලදී එවැනි පෙත්සම් නැවත සලකා නොබැලීමට,

(ix) රාජ්‍ය ප්‍රතිපත්ති හා ගැටෙන කරුණුවලට අදාළ පෙත්සම් සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග පෙත්සම්කරු නොකැඳවා කාරක සභාව හමුවේ සාකච්ඡාවට ගැනීමට,

(x) රාජ්‍ය මූල්‍ය ආයතන සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයකින් ඔප්පු වී ඇති මූල්‍ය වංචා හා සම්බන්ධව ලැබෙන පෙත්සම් සලකා නොබැලීමට, (2012.11.20. දිනැති කාරක සභා තීරණය) සහ

(xi) කාරක සභාවට අදාළව දැනට ක්‍රියාත්මක වන ස්ථාවර නියෝගවල බලාත්මකභාවය සම්බන්ධයෙන් ගැටළු මතු වී ඇති බැවින් හා මෙම තත්ත්වය තුළ පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව පිළිබඳව ජනතා විශ්වාසය බිඳ වැටෙන බැවින් බලාත්මක නියෝගයක් කිරීමේ හැකියාව කාරක සභාවට ඇතිවන සේ ස්ථාවර නියෝගයන් සංශෝධනය කිරීම සඳහා ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ සභාපති වෙත යෝජනා කර ඇත.

(xii) තවද, කාරක සභා කාර්යාංශයේ යෝජනාවක් අනුව කාරක සභාව විසින් වරක් විමර්ශනය කර නිර්දේශයක් ලබා දී ඇති පෙත්සමක් වෙනුවෙන් නැවත වරක් කාරක සභාව විසින් සලකා බැලීමට ප්‍රථම පළමුවර කාරක සභාව විසින් ලබා දුන් නිර්දේශය ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය පිළිබඳ විමසීමක් කිරීමට කටයුතු කරන ලදී.

11. <u>මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ 5 වන වාර්තාවේ සඳහන් ඉලක්කයන් පිළිබඳ පසු විපරමක්.</u>

(i) **පෙත්සම ගරු මන්ත්‍රීවරයෙකු විසින් පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කිරීමෙන් පසු හැකි ඉක්මණින් පෙත්සමෙහි විමර්ශන කටයුතු අවසන් කිරීම**

(ii) **පෙත්සම්කරුට සහන ලබාදීම සම්බන්ධයෙන් විවිධ අමාත්‍යාංශ සහ ආයතන සමග ඇති කර ගනු ලබන එකඟතාවයන් හැකි ඉක්මණින් ක්‍රියාත්මක කරවා ගැනීම**

(iii) **පසුගිය පාර්ලිමේන්තුවලදී එකඟතාවයන්ට පැමිණ එහෙත් මේ වනතෙක් අමාත්‍යාංශ විසින් සහන ලබා දී නොමැති පෙත්සම්කරුවන්ට සහන සැලසීම සඳහා කටයුතු කිරීම**

ඉහත ඉලක්කයන් තුනම සපුරා ගැනීම සඳහා කාරක සභාව ගනු ලැබූ ක්‍රියාමාර්ගය වූයේ පෙත්සමක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් වීමෙන් පසු ආරම්භ වන එම පෙත්සමේ කටයුතු අවසන් වන තෙක්ම එක් නිලධාරියෙක් පමණක් විසින්ම සිදු කිරීමය. ඒ තුළින් අදාළ පෙත්සම සම්බන්ධයෙන් සියළු කරුණු හා පෙත්සමට සම්බන්ධ පාර්ශ්ව සම්බන්ධයෙන් නියමිත නිලධාරියා නිරන්තරයෙන්ම දැනුවත් වී තිබීම මත අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු පහසු කරගෙන ඇති අතර, එළැඹි එකඟතාවයන් හැකි ඉක්මණින් ක්‍රියාත්මක කරවා ගැනීම හෝ පෙත්සමෙහි විමර්ශන කටයුතු අවසන් කිරීම එමගින් යම්තාක් දුරට කාර්යක්ෂම වී ඇත.

තවද කාරක සභාව විසින් පෙත්සම් විමර්ශනය කිරීමෙන් පසු ලබා දෙන නිර්දේශයන් ක්‍රියාත්මක නොවන බව ජනාධිපති ලේකම් වෙත වාර්තා වී තිබීම මත ජනාධිපති ලේකම් විසින් 2014.10.10 දිනැතිව අංක E&O/AC/1/8/6 දරන චක්‍රලේඛය නිකුත් කිරීමෙන් ඉහත කාරණය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරිමට කටයුතු කිරීම තුළින් කාරක සභාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ ආයතනවල අවධානය යොමු වනු ඇති බවට කාරක සභාව අපේක්ෂා කරන ලදී. (උපලේඛනය 3)

(iv) **රාජ්‍ය සේවා කොමිෂන් සභාව වරක් විමසා අවසන් කළ එහෙත් කාරක සභාවේ විමර්ශනයට යොමුකොට ඇති එකී පෙත්සම් පිළිබඳ අභියාචනා නැවත සලකා බැලිය හැකි වන සේ නීතිය සකස් කිරීම**

ගරු කථානායකතුමාගේ ප්‍රධානත්වයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපති ඇතුළු සාමාජිකයන් සහ කාරක සභාවේ සභාපති ඇතුළු සභික මන්ත්‍රීන්ගේ සහභාගීත්වයෙන් 2014.07.23 වන දින පවත්වන්නට යෙදුනු සාකච්ඡාවේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විමසා අවසන් කළ පෙත්සම් සම්බන්ධයෙන් කාරක සභාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමේදී ඇති වන ගැටළු සම්බන්ධයෙන්ද, එම ගැටළු අවම කර ගැනීමට දෙපාර්ශ්වයෙන්ම අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන්ද අදහස් හුවමාරු කර ගත් අතර කාරක සභාව විසින් නැවත විමසා බලන ලෙස ඉල්ලමින් එවන පෙත්සම් සම්බන්ධයෙන් අවශ්‍ය පරිදි වැඩිදුර කටයුතු කිරීමට එකඟවන ලදී.

(v) **විදේශ රටවල පාර්ලිමේන්තු පෙත්සම් කාරක සභාවල ක්‍රියාකාරීත්වයන් අධ්‍යයනයකොට අප කාරක සභාවේ කාර්යක්ෂමතාව නංවා ගැනීමට එම අත්දැකීම් උපයෝගී කර ගැනීම**

දෙස්/විදෙස් පුහුණු සැසි සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නම් කිරීමේදී මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරුන් සම්බන්ධයෙන්ද සලකා බලන ලෙස කාරක සභාවේ සභාපති විසින් 2014.03.18 දිනැතිව ගරු කථානායකතුමා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී. (උපලේඛනය 4)

12. <u>හත්වන පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් කාරක සභාවේ ඉලක්කයන් හා නිර්දේශයන්</u>

(i) රක්ෂණ ඔම්බුඩ්ස්මන්ගේ සහ මුදල් ඔම්බුඩ්ස්මන්ගේ සහයෝගය මහජන පෙත්සම් විමර්ශනය සඳහා ලබා ගැනීමට කටයුතු කිරීම;

(ii) ශ්‍රී ලංකාවේ පළාත් සභාවල ක්‍රියාත්මක වන පෙත්සම් කාරක සභා සමග සහයෝගයෙන් කටයුතු කිරීමෙන් පෙත්සම්කරුවන් වැඩි ප්‍රමාණයකට සහන ලබාදීමට අවස්ථාව ලැබෙන බැවින් එලෙස කටයුතු කිරීම;

(iii) 1981/17 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනතේ 11 වන වගන්තිය මගින් ඔහුගේ අධිකරණ බලය සීමා කර ඇති බවට විවේචන ඇති බව 1981 සිට 1990 දක්වා වූ කාලයට අදාළව 1994 වසරේදී ඉදිරිපත් කළ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාවේ සඳහන් වී ඇති බැවින් ඔම්බුඩ්ස්මන් පනතෙහි එම වගන්තිය සංශෝධනය විය යුතු ද යන්න විමසීම සඳහා ඔම්බුඩ්ස්මන්ගේද අදහස් ගෙන නීති කෙටුම්පත් සම්පාදක වෙත යෝජනාවක් ඉදිරිපත් කළ යුතු බවට ද, එමෙන්ම උක්ත වාර්තාවේ යෝජනා කර ඇති පරිදි ඔම්බුඩ්ස්මන් විසින් පෙත්සම් විමර්ශනය කර ලබාදෙන සහන නිර්දේශයන් සත්‍ය වශයෙන්ම ක්‍රියාත්මක වී ඇතිදැයි පසුවිපරම් කිරීමට ඔම්බුඩ්ස්මන්ට බලය දිය යුතු බවට නිර්දේශ කිරීම;

(iv) 1994/26 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (සංශෝධන) පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 17 (3)(ඇ) වගන්තිය අනුව නිර්දේශයන් ලබා දුන්නද ඒවා ක්‍රියාත්මක කරමින් පෙත්සම්කරුවන්ට සහන නොසළසන අවස්ථාවලදී ඒ සම්බන්ධව ජනාධිපතිට හා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ඔම්බුඩ්ස්මන්වරයාගේ වාර්තාව පෙත්සම් කාරක සභාව මගින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළද ඉන්පසු ඒ පිළිබඳ ඉදිරි කටයුතු කිරීමේ ක්‍රියා මාර්ගයක් හඳුන්වා දී නොමැති බැවින් ඒ සඳහා සුදුසු ක්‍රියා මාර්ගයක් හඳුන්වා දිය යුතු බව නිර්දේශ කිරීම; සහ

(v) 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ විධිවිධාන ප්‍රකාරව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් විමර්ශනය කර සහන ලබා දී ඇතත් ඒවා අදාළ ආයතන විසින් ක්‍රියාත්මක නොකරන අවස්ථාවන්හිදී එම කොමිසම විසින් උක්ත පනතේ 15(8) වගන්තිය ප්‍රකාරව ඒ කරුණ පිළිබඳව සඳහන් කොට ගරු ජනාධිපතිතුමා වෙත යොමු කරනු ලබන වාර්තා ජනාධිපති කාර්යාලය මගින් ගරු කථානායකතුමා වෙත යොමු කොට එමගින් පෙත්සම් කාරක සභාව වෙත යොමු කරනු ලැබුවද, එම වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම හැර ඒ සම්බන්ධයෙන් වැඩිදුරටත් කටයුතු කිරීමේ ක්‍රියා මාර්ගයක් දක්වා නොමැති බැවින් ඒ සඳහා ද සුදුසු ක්‍රියා මාර්ගයක් හඳුන්වා දිය යුතු බව නිර්දේශ කිරීම.

**13**. <u>හත්වන පාර්ලිමේන්තුවේ ඉලක්කයන් සඳහා අටවන පාර්ලිමේන්තුවේදී ගැනීමට නියමිත පියවර</u>

(i) රක්ෂණ ඔම්බුඩ්ස්මන් හා මුදල් ඔම්බුඩ්ස්මන් කැඳවා සාකච්ඡා කිරීම.

(ii) පළාත් සභාවල පෙත්සම් කාරක සභාවන්හි සභාපතිවරුන් හා ලේකම්වරුන් කැඳවා සුහද සාකච්ඡාවක් පැවැත්වීම.

(iii) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනතේ 17 වැනි වගන්තිය සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15(8) වගන්තිය අනුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන වාර්තා පාර්ලිමේන්තුව විසින් කාරක සභාවට යොමු කරනු හැකිවන පරිදි රීති සකස් කරන ලෙස ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවට දන්වා සිටීම සහ ඒ බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ රාජ්‍ය සේවය පිළිබඳ අනු කාරක සභාවේ වාර්තාවට ඇතුළත් කිරීම.

**14**. <u>අටවන පාර්ලිමේන්තුවේ ඉලක්කයන්</u>

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ස්වාධීන ආයතනයක් වන අධිකරණ සේවා කොමිෂන් සභාවෙහි මැදිහත්වීමක් අවශ්‍යවන පෙත්සම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ කාරක සභාවට පැහැදිලි අදහස් ලබා ගත නොහැකි වූ අතර ඒ පිළිබඳව ගතයුතු ක්‍රියාමාර්ග සලකා බැලිය යුතුව ඇත.

(ii) විදෙස් රටවල මහජන පෙත්සම් කාරක සභාවල කටයුතු සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යාපන චාරිකාවක් සඳහා වන අනුමැතිය ගරු කථානායකතුමාගෙන් ඉල්ලීම.

(iii) එසේම අමාත්‍යාංශ සමග කටයුතු කිරීමේදී ඇතිවන ප්‍රමාදයන් අවමකර ගනිමින්, පෙත්සම් කාරක සභාවේ කටයුතු වඩාත් කාර්යක්ෂම කරනු පිණිස පෙත්සම් ආශ්‍රිත කටයුතු සම්බන්ධීකරණය සඳහා එක් එක් අමාත්‍යාංශය මට්ටමින් නිලධාරියෙකු පත් කරගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.

## 15. 7 වන පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරයේ 2013.01.01 සිට 2015.06.26 දක්වා කාල සීමාවේ විමර්ශනය කළ පෙත්සම් පිළිබඳ සාරාංශය

(අ) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව ලද පෙත්සම් පිළිබඳ සාරාංශයක්

| | | |
|---|---|---|
| 1 | මහජන පෙත්සම් කාරක සභාවට ලැබුණු පෙත්සම් සංඛ්‍යාව | 1366 |
| 2 | ස්ථාවර නියෝගවලට අනුකූල නොවූ බැවින් කාරක සභාව විසින් ප්‍රතික්ෂේප කළ පෙත්සම් සංඛ්‍යාව | 334 |
| 3 | පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඉදිරි කටයුතු කළ පෙත්සම් සංඛ්‍යාව | 1061 |
| 4 | ඔම්බුඩ්ස්මන් වෙත යොමු කළ පෙත්සම් සංඛ්‍යාව | 184 |
| 5 | කාරක සභාව පැවැත්වූ වාර ගණන | 96 |
| 6 | කාරක සභාව සාකච්ඡාවට ගත් පෙත්සම් — | |
| | 7 වන පාර්ලිමේන්තුවට අදාළ පෙත්සම් සංඛ්‍යාව | 848 |
| | 6 වන පාර්ලිමේන්තුවට අදාළ පෙත්සම් සංඛ්‍යාව | 87 |
| 7 | සහන ලැබූ පෙත්සම්කරුවන් සංඛ්‍යාව — | |
| | 7 වන පාර්ලිමේන්තුවට අදාළ පෙත්සම්වලින් | 85 |
| | 6 වන පාර්ලිමේන්තුවට අදාළ පෙත්සම්වලින් | 7 |
| 8 | විමර්ශනය කිරීමෙන් පසු නිෂ්ප්‍රභ කළ පෙත්සම් සංඛ්‍යාව — | |
| | 7 වන පාර්ලිමේන්තුවට අදාළ සංඛ්‍යාව | 424 |
| | 6 වන පාර්ලිමේන්තුවට අදාළ සංඛ්‍යාව | 16 |
| 9 | ඉහත නිෂ්ප්‍රභ කළ පෙත්සම් අතරින් කාරක සභාවේ මූලික විමර්ශනයෙන් පසුව සහන ලබාදීමට නොහැකි බව තීරණය කර, නිෂ්ප්‍රභ කළ පෙත්සම් — | |
| | 7 වන පාර්ලිමේන්තුවට අදාළ පෙත්සම් සංඛ්‍යාව | 289 |
| | 6 වන පාර්ලිමේන්තුවට අදාළ පෙත්සම් සංඛ්‍යාව | 9 |
| • | සමහර පෙත්සම් එක් වරකට වඩා වැඩි වාර ගණනක් කාරක සභාවේ සාකච්ඡාවට ලක්කරන ලදී. ඒ අනුව කාරක සභාවේ සාකච්ඡාවට ලක්කල සමස්ත පෙත්සම් සංඛ්‍යාව — | |
| | 7 වන පාර්ලිමේන්තුවට අදාළ පෙත්සම් සංඛ්‍යාව | 1202 |
| | 6 වන පාර්ලිමේන්තුවට අදාළ පෙත්සම් සංඛ්‍යාව | 127 |

(ආ) ලබා දුන් සහන අනුව සාරාංශය

| | අදාළ අමාත්‍යාංශය හා ගොනු අංකය | සහන ලැබී ඇති පෙත්සම් |
|---|---|---|
| 1. නැවත සේවයේ පිහිටුවීම් | | 13 |
| | අධ්‍යාපන - (856) | |
| | සෞඛ්‍යය - (1946) | |
| | නීතිය හා සාමය - (627) | |
| | පළාත් පාලන හා පළාත් සභා - (1161, 1162) | |
| | යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන - (1552) | |
| | තැපැල් සේවා - (214, 311) | |
| | කෘෂිකර්ම - (166) | |
| | විදුලිබල හා බලශක්ති - (1630) | |
| | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු - (1194, 1618) | |
| | මුදල් හා ක්‍රම සම්පාදන - (1653) | |
| 2. උසස්වීම් ලබා දීම/සක්‍රිය සේවා කාලය ලබාදී උසස්වීම් යථාවත් කිරීම | | 13 |
| | සමූපකාර හා අභ්‍යන්තර වෙළෙඳ - (1189) | |
| | අධ්‍යාපන - (1013, 1258, 2071) | |
| | මුදල් හා ක්‍රම සම්පාදන - (44, 45, 46, 47, 802) | |
| | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු - (887) | |
| | කෘෂිකර්ම (1109) | |
| | නීතිය හා සාමය (901) | |
| | සෞඛ්‍යය (1656) | |
| 3. නිවැරදි විශ්‍රාම වැටුප හෝ හිඟ සේවක අර්ථසාධක අරමුදල් ලබාදීම | | 11 |
| | සමූපකාර හා අභ්‍යන්තර වෙළෙඳ - (606) | |
| | අධ්‍යාපන - (256, 677) | |
| | සෞඛ්‍යය - (621, 622) | |
| | නීතිය හා සාමය - (1221) | |
| | උසස් අධ්‍යාපන - (779) | |
| | පළාත් පාලන හා පළාත් සභා - (921) | |
| | මුදල් හා ක්‍රම සම්පාදන (2080) | |
| | විදුලිබල හා බලශක්ති - (639) | |
| | ආරක්ෂක හා නාගරික සංවර්ධන - (1298) | |

| | අදාළ අමාත්‍යාංශය හා ගොනු අංකය | සහන ලැබී ඇති පෙත්සම් |
|---|---|---|
| 4. වැටුප් වර්ධක/හිඟ වැටුප් ලබා දීම | | 5 |
| | අධ්‍යාපන - (27, 943) | |
| | ගොවිජන සේවා හා වනජීවී - (725) | |
| | නීතිය හා සාමය - (2133) | |
| | මුදල් හා ක්‍රම සම්පාදන - (1814) | |
| 5. වන්දි ලබා දීම | | 8 |
| | සමූපකාර හා අභ්‍යන්තර වෙළෙඳ - (469) | |
| | මුදල් හා ක්‍රම සම්පාදන - (610, 800, 1736, 2051) | |
| | විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන - (1441) | |
| | ප්‍රවාහන - (121) | |
| | පළාත් පාලන හා පළාත් සභා - (110) | |
| 6.සේවය ස්ථිර කිරීම | | 4 |
| | පළාත් පාලන හා පළාත් සභා - (491, 1099) | |
| | පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ - (1049) | |
| | කෘෂිකර්ම - (727) | |
| 7. උසස්වීම්/පත්වීම් පෙරදාතම් කිරීම | | 1 |
| | මුදල් හා ක්‍රම සම්පාදන - (1028) | |
| 8. නව පත්වීමක් ලබා දීම | | 9 |
| | මුදල් හා ක්‍රම සම්පාදන - (1274) | |
| | තැපැල් සේවා - (208, 769) | |
| | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු - (1909) | |
| | අධ්‍යාපන - (432, 1190) | |
| | සෞඛ්‍ය - (1935, 2204) | |
| | පළාත් පාලන හා පළාත් සභා - (1139) | |
| 9. ආදේශක පත්වීම ලබා දීම | | 2 |
| | තැපැල් සේවා - (425) | |
| | ප්‍රවාහන - (351) | |

| | අදාළ අමාත්‍යාංශය හා ගොනු අංකය | සහන ලැබී ඇති පෙත්සම් |
|---|---|---|
| 10. ස්ථාන මාරු ලබා දීම | | 1 |
| | යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන - (1683) | |
| 11. හිමි ගෙවීම් ලබා දීම | | 2 |
| | රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන - (541) | |
| | ප්‍රවාහන - (1235) | |
| 12. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ලබා දීම | | 1 |
| | මුදල් හා ක්‍රම සම්පාදන - (604) | |
| 13. ලාභාංශ හා දිරි දීමනා හිඟ පොලී සමග ලබා දීම | | 1 |
| | විදුලිබල හා බලශක්ති - (1254) | |
| 14. විදුලි සැපයුම ලබා දීම | | 1 |
| | විදුලිබල හා බලශක්ති - (1431) | |
| 15. ඉඩම් ඔප්පු හෝ බලපත්‍ර ලබාදීම | | 3 |
| | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ - (282, 1141) | |
| | ජනාධිපති ලේකම් - (114) | |
| 16. ක්‍රමවත් ජල ප්‍රවාහන පද්ධතියක් ලබා දීම | | 1 |
| | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ - (1053) | |
| 17. පරිසරයට හානිකර ව්‍යාපෘති නතර කිරීම | | 1 |
| | පළාත් පාලන හා පළාත් සභා - (1432) | |
| 18. විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබා දීම | | 1 |
| | උසස් අධ්‍යාපන - (1101) | |
| 19. රක්ෂණ හිමිකම ලබා දීම | | 1 |
| | මුදල් හා ක්‍රම සම්පාදන - (1850) | |
| 20. විකල්ප මාර්ග ලබාදීම | | 1 |
| | ඉඩම් හා ඉඩම් සංවර්ධන - (246) | |
| 21. ණය මුදල් පියවීමේදී සහන සැලසීම | | 1 |
| | මුදල් හා ක්‍රම සම්පාදන - (1510) | |
| 22. මගී ප්‍රවාහන බලපත්‍රය බලාත්මක කිරීම | | 1 |
| | පුද්ගලික ප්‍රවාහන සේවා - (437) | |
| | එකතුව | 82 |

(ඇ) පෙත්සම් විමර්ශනය සිදුකළ අමාත්‍යාංශය අනුව සාරාංශයක්

| අනු අංකය | අමාත්‍යාංශය | කාරක සභාව වෙත ලැබී ඇති පෙත්සම් ගණන | කාරක සභාව විසින් අමාත්‍යාංශ වෙත යොමු කළ පෙත්සම් ගණන | කාරක සභාව විමසන ලද පෙත්සම් ගණන | කාරක සභාව සහන ලබා දෙන ලෙස නිර්දේශ කළ පෙත්සම් ගණන | එම නිර්දේශ මත සහන දුන් පෙත්සම් ගණන | නිර්දේශ කළ පෙත්සම් අතරින් සහන ලද ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|---|
| 1 | ගොවිජන සේවා හා වනජීවී | 0 | 0 | 6 | 2 | 1 | 50 |
| 2 | කෘෂිකර්ම | 9 | 8 | 20 | 12 | 3 | 25 |
| 3 | බුද්ධ ශාසන හා ආගමික කටයුතු | 0 | 0 | 1 | 0 | 0 | - |
| 4 | සිවිල් ගුවන් සේවා | 2 | 2 | 2 | 0 | 0 | - |
| 5 | සමූපකාර හා අභ්‍යන්තර වෙළෙඳ | 5 | 5 | 16 | 8 | 3 | 38 |
| 6 | පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන | 2 | 1 | 2 | 2 | 0 | 0 |
| 7 | ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් | 4 | 2 | 7 | 2 | 0 | 0 |
| 8 | සංස්කෘතික හා කලා | 1 | 1 | විමසා නැත | 0 | 0 | - |
| 9 | ආරක්ෂක හා නාගරික සංවර්ධන | 46 | 44 | 31 | 6 | 1 | 17 |
| 10 | ආර්ථික සංවර්ධන | 25 | 19 | 11 | 9 | 0 | 0 |
| 11 | අධ්‍යාපන | 93 | 84 | 108 | 38 | 10 | 21 |
| 12 | පරිසර හා පුනර්ජනනීය | 5 | 4 | විමසා නැත | - | - | - |
| 13 | විදේශ කටයුතු | 1 | 1 | විමසා නැත | - | - | - |
| 14 | මුදල් හා ක්‍රම සම්පාදන | 196 | 44 | 98 | 44 | 17 | 26 |
| 15 | ධීවර හා ජලජ සම්පත් | 3 | 2 | 4 | 0 | 0 | - |
| 16 | විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන | 2 | 2 | 1 | 1 | 1 | 100 |
| 17 | සෞඛ්‍ය | 34 | 33 | 46 | 26 | 6 | 23 |
| 18 | උසස් අධ්‍යාපන | 5 | 4 | 6 | 2 | 2 | 100 |

| අනු අංකය | අමාත්‍යාංශය | කාරක සභාව වෙත ලැබී ඇති පෙත්සම් ගණන | කාරක සභාව විසින් අමාත්‍යාංශ වෙත යොමු කළ පෙත්සම් ගණන | කාරක සභාව විමසන ලද පෙත්සම් ගණන | කාරක සභාව සහන ලබා දෙන ලෙස නිර්දේශ කළ පෙත්සම් ගණන | එම නිර්දේශ මත සහන දුන් පෙත්සම් ගණන | නිර්දේශ කළ පෙත්සම් අතරින් සහන ලද ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|---|
| 19 | මහාමාර්ග, වරාය හා නාවික | 16 | 14 | 14 | 4 | 0 | 0 |
| 20 | දේශීය වෛද්‍ය | 6 | 4 | 5 | 2 | 0 | 0 |
| 21 | කර්මාන්ත හා වාණිජ | 13 | 10 | 10 | 5 | 0 | 0 |
| 22 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ | 17 | 15 | 24 | 14 | 3 | 21 |
| 23 | අධිකරණ | 7 | 5 | 1 | - | - | - |
| 24 | කම්කරු හා කම්කරු සබඳතා | 4 | 3 | 5 | 4 | 0 | 0 |
| 25 | ඉඩම් හා ඉඩම් සංවර්ධන | 20 | 17 | 17 | 8 | 1 | 12 |
| 26 | නීතිය හා සාමය | 102 | 77 | 97 | 26 | 4 | 15 |
| 27 | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන | 1 | 1 | 5 | 1 | 0 | 0 |
| 28 | පළාත් පාලන හා පළාත් සභා | 42 | 36 | 45 | 22 | 8 | 36 |
| 29 | ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති | 6 | 5 | 9 | 3 | 0 | 0 |
| 30 | සුළු අපනයන භෝග ප්‍රවර්ධන | 1 | 1 | විමසා නැත | - | - | - |
| 31 | ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු | 3 | 2 | 3 | 1 | 0 | 0 |
| 32 | ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා | 1 | 1 | විමසා නැත | - | - | - |
| 33 | පාර්ලිමේන්තු කටයුතු | 1 | 1 | විමසා නැත | - | - | - |
| 34 | ඛනිජ තෙල් කර්මාන්ත | 4 | 4 | 1 | 1 | 0 | 0 |
| 35 | වැවිලි කර්මාන්ත | 4 | 1 | 1 | - | - | - |
| 36 | තැපැල් සේවා | 21 | 18 | 34 | 17 | 5 | 29 |
| 37 | විදුලිබල හා බලශක්ති | 22 | 22 | 29 | 12 | 4 | 25 |

| අනු අංකය | අමාත්‍යාංශය | කාරක සභාව වෙත ලැබී ඇති පෙත්සම් ගණන | කාරක සභාව විසින් අමාත්‍යාංශ වෙත යොමු කළ පෙත්සම් ගණන | කාරක සභාව විමසන ලද පෙත්සම් ගණන | කාරක සභාව සහන ලබා දෙන ලෙස නිර්දේශ කළ පෙත්සම් ගණන | එම නිර්දේශ මත සහන දුන් පෙත්සම් ගණන | නිර්දේශ කළ පෙත්සම් අතරින් සහන ලද ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|---|
| 38 | පුද්ගලික ප්‍රවාහන සේවා | 1 | 1 | 1 | 1 | 1 | 100 |
| 39 | ඵලදායිතා ප්‍රවර්ධන | 0 | 0 | 1 | 0 | 0 | - |
| 40 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු | 48 | 40 | 64 | 15 | 4 | 27 |
| 41 | පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ | 13 | 9 | 13 | 4 | 1 | 25 |
| 42 | සමාජ සේවා | 2 | 2 | 1 | 1 | 0 | 0 |
| 43 | ක්‍රීඩා | 1 | 1 | 2 | 0 | 0 | - |
| 44 | රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන | 2 | 2 | 5 | 2 | 1 | 50 |
| 45 | සීනි කර්මාන්ත | 1 | 1 | විමසා නැත | - | - | - |
| 46 | තාක්ෂණ හා පර්යේෂණ | 1 | 1 | විමසා නැත | - | - | - |
| 47 | විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ | 1 | 0 | 9 | 5 | 0 | 0 |
| 48 | සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන | 2 | 1 | විමසා නැත | - | - | - |
| 49 | ප්‍රවාහන | 33 | 26 | 57 | 19 | 3 | 16 |
| 50 | ජල සම්පාදන හා ජලාපවාහන | 3 | 3 | 3 | 2 | 0 | 0 |
| 51 | යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන | 4 | 4 | 4 | 4 | 2 | 50 |
| 52 | ජනාධිපති ලේකම් | 1 | 1 | 6 | 2 | 1 | 50 |
| 53 | නීතිපති | 0 | 0 | 1 | 1 | 0 | 0 |
| 54 | ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | 1 | 0 | 1 | 0 | 0 | - |
| | එකතුව | 838 | 585 | 827 | 328 | 82 | 25 |

**(ඈ) 6** වන පාර්ලමේන්තු කාල සීමාවේදී කාරක සභාවට ලැබී 2013.01.01-2015.06.26 කාල සීමාවේදී විමර්ශනය කළ පෙත්සම් පිළිබඳ අමාත්‍යාංශය අනුව සාරාංශය

| අනු අංකය | අමාත්‍යාංශය | කාරක සභාව විමසන ලද පෙත්සම් ගණන | කාරක සභාව සහන ලබා දෙන ලෙස නිර්දේශ කළ පෙත්සම් ගණන | එම නිර්දේශ මත සහන දුන් පෙත්සම් ගණන | නිර්දේශ කළ පෙත්සම් අතරින් සහන දුන් පෙත්සම් % ලෙස |
|---|---|---|---|---|---|
| 1 | ආරක්ෂක හා නාගරික සංවර්ධන | 2 | 2 | 1 | 50 |
| 2 | ආර්ථික සංවර්ධන | 1 | 0 | - | - |
| 3 | අධ්‍යාපන | 2 | 2 | 0 | 0 |
| 4 | මුදල් හා ක්‍රම සම්පාදන | 4 | 1 | 1 | 100 |
| 5 | සෞඛ්‍ය | 5 | 4 | 1 | 25 |
| 6 | මහාමාර්ග, වරාය හා නාවික | 3 | 1 | 0 | 0 |
| 7 | කර්මාන්ත හා වාණිජ | 2 | 2 | 0 | 0 |
| 8 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ | 41 | 41 | 2 | 5 |
| 9 | ඉඩම් හා ඉඩම් සංවර්ධන | 2 | 2 | 1 | 50 |
| 10 | නීතිය හා සාමය | 3 | 1 | 0 | 0 |
| 11 | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන | 1 | 0 | - | - |
| 12 | ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති | 1 | 1 | 0 | 0 |
| 13 | තැපැල් සේවා | 3 | 2 | 0 | 0 |
| 14 | තැපැල් හා විදුලි සංදේශ | 1 | 0 | - | - |
| 15 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු | 3 | 2 | 0 | 0 |
| 16 | ප්‍රවාහන | 2 | 1 | 0 | 0 |
| 17 | යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන | 1 | 0 | - | - |
| 18 | ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | 3 | 0 | - | - |
| | එකතුව | 80 | 62 | 6 | 10 |

(ඉ) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාට (ඔම්බුඩ්ස්මන්) අදාළ පෙත්සම් පිළිබඳ සාරාංශය

| | | |
|---|---|---|
| **2013.01.01 – 2015.06.26 දක්වා වූ කාල සීමාව තුළදී:—** | | |
| පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් වෙත යොමු කළ පෙත්සම් සංඛ්‍යාව | | 184 |
| 2013.01.01 – 2015.06.26 කාලය තුළ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් වෙත යොමු කළ පෙත්සම් අතරින් කාරක සභාව විභාග කළ සංඛ්‍යාව: | | |
| | 7 වන පාර්ලිමේන්තුවට අදාළ පෙත්සම් සංඛ්‍යාව | 21 |
| | 6 වන පාර්ලිමේන්තුවට අදාළ පෙත්සම් සංඛ්‍යාව | 7 |
| පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් විසින් නිර්දේශ කළ සහන ලැබී ඇති පෙත්සම් :— | | |
| | 7 වන පාර්ලිමේන්තුවට අදාළ පෙත්සම් සංඛ්‍යාව | 3 |
| | 6 වන පාර්ලිමේන්තුවට අදාළ පෙත්සම් සංඛ්‍යාව | 1 |
| පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් විසින් නිෂ්ප්‍රභ කළ පෙත්සම් සංඛ්‍යාව | | 19 |

## 16. කාරක සභාව විසින් සහන සලසා දුන් පෙත්සම්

**(1) සී.එම්. චන්ද්‍රදාස මහතා**

**වතුවත්ත, දුම්මලසූරිය**

**සීඔඑම්/පීපී/2012/1431**

තම ව්‍යාපාරික ස්ථානය සඳහා තොග විදුලිය ලබා ගැනීම වෙනුවෙන් උපදෙස් පරිදි අදාළ මුදල ගෙවා අවුරුදු 1 මාස 9ක් පසු වී ඇති නමුත් විදුලි පහසුකම් ලැබී නොමැති හෙයින් තමාට සහනයක් ලබා දෙන ලෙස ඉල්ලමින් පෙත්සම්කරු පෙත්සම ඉදිරිපත් කර ඇත.

මෙම පෙත්සම්කරු ඉල්ලා ඇති පරිදි මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවෙන් කළ විමසුමට ප්‍රතිචාර දක්වමින් ඔහුගේ ඉල්ලීම ඉටු කරලීමට ලංකා විදුලිබල මණ්ඩලය පියවර ගෙන ඇත.

**(2) චන්ද්‍රලතා මාගමමුදලි මහත්මිය**

**අංක 18, ආටිගල නිවස, කැස්බෑව, පිළියන්දල**

**සීඔඑම්/පීපී/2011/606**

තමා 1973.03.01 දින සේවක පිරිස් මහජන සම්බන්ධතා කළමනාකරු, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් හා ප්‍රධාන ලිපිකරු තනතුරට පත්වීම් ලද බවත්, 1980.12.24 දිනැති 102/80 වැටුප් චක්‍රලේඛය අනුව තම තනතුර පරිපාලන කළමනාකරු ලෙස පරිවර්තනය විය යුතු වුවද තමාට එම තනතුර හෝ වැටුප් ලබා නොදුන් බවත්, තමාව ඊට පහළ පිරිස් කළමනාකාර ලෙස අනියම් තනතුරකට පත් කර ඇති බවත්, විශ්‍රාම යාමට පෙර ගත් අවසාන වැටුප පදනම් කරගෙන තම විශ්‍රාම පාරිතෝෂික දීමනාව ගෙවා තමාට සාධාරණයක් කරන ලෙස ඉල්ලමින් පෙත්සම්කාරිය පෙත්සම ඉදිරිපත් කර ඇත.

පෙත්සම්කාරියගේ ඉල්ලීම සාධාරණ බව පිළිගෙන පෙත්සම්කාරියට පරිපාලන කළමනාකරු තනතුර ප්‍රදානය කිරීමටත්, ඇයගේ අවුරුදු 34ක සේවා කාලය සලකා පාරිතෝෂිකය, හිඟ වැටුප් සහ 2002 වසරේ සිට දඩ පොළිය ලෙස රු. 529,372.24 ක මුදලක් ලබා දීමටත් සමූපකාර සේවා කොමිෂන් සභාව තීරණය කර ඇති බවත්, මුල් වාරිකය ලෙස ලක්ෂ 3ක මුදලකුත්, ඉතිරි මුදල වාරික 2කින් 2013 වසරේ ජූනි මස 01 දින හා සැප්තැම්බර් මස 01 දින ගෙවීමට තීරණය කර මේ වන විටත් ලක්ෂ 3ක චෙක්පතක් පෙත්සම්කාරිය වෙත ලබා දීමට කටයුතු කර ඇති බවත් දන්වා ඇත.

**(3) ඒ. එම්. ශ්‍රේෂන් අශෝක මහතා**

**"සුමිහිරි", කිඹිල්ල, හලාවත**

**සීඔඑම්/පීපී/2012/1189**

පෙත්සම්කරු තමා දැනට වයඹ පළාත් සභාවේ සමූපකාර සමිති පරීක්ෂකවරයෙකු ලෙස සේවය කරන අතර 1996.01.01 දින සමූපකාර සමිති පරීක්ෂක "අ" ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළ අතර එම තනතුරේ වසර 10ක් සේවය කර ඇත්නම් පළමුවෙනි ශ්‍රේණියට උසස් කළ යුතු වුවත් තමාගේ උසස්වීම මේ දක්වා ලබා දී නැති බැවින් තම උසස්වීම ලබා දී සාධාරණය ඉටුකරන ලෙස ඉල්ලා පෙත්සම්කරු පෙත්සම ඉදිරිපත් කර ඇත.

පෙත්සම්කරු ඉල්ලා ඇති පරිදි සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපිය මගින් දන්වා ඇත්තේ ඔහුට පළමු පන්තියට උසස්වීම ලබා දීමට කටයුතු කර ඇති බවය.

**(4) ටී.සී. ඩේරියස් ද සා මහතා**

**අංක 85, හරිස්චන්ද්‍ර මාවත, අනුරාධපුරය**

**සීඔඑම්/පීපී/2011/725**

වස්ගමුව, කිරිඔය මාර්ගය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව අනුව ඉදිකිරීමේ කටයුතු කර ඇති නමුත් ඉටුකල වැඩ සඳහා මුදල් නොගෙවා, ආයතනයේ පරිපාලනය මගින් සිදු වූ වරදට තමාගෙන් ප්‍රමාද ගාස්තු ලෙස මුදල් රඳවාගෙන ඇති බැවින් තමා ඉමහත් අසීරුතාවයට පත් වී ඇති බවත් මේ බව ICTAD ආයතනයට දන්වා සිටිය ද තමාට සහනයක් නොලැබුණු බවත් පවසමින් තම කොටස් ගෙවීම්, රඳවා ගැනීමේ මුදල හා ප්‍රමාද ගාස්තු ලෙස සඳහන් මුදල් තමාට නිදහස් කර දෙන ලෙස ඉල්ලා පෙත්සම්කරු පෙත්සම ඉදිරිපත් කර ඇත.

කාරක සභාව මෙම පෙත්සම සලකා බැලීමෙන් පසු ලබා දුන් තීරණය මත පෙත්සම්කරු ඉල්ලා සිටි අතිරේක වැඩ ගාස්තු ලෙස රු. 437,850.62 ක මුදලක්ද ප්‍රමාද ගාස්තු ලෙස රු. 845,916.00ක මුදලක් හා රඳවාගත් මුදල් ලෙස රු. 488,205.72 ක මුදලක් නිදහස් කර පෙත්සම්කරුට සහන ලබා දී ඇත.

**(5) ඩබ්ලිව්.එච්.එස්. ප්‍රනාන්දු මහතා**

**අංක 174, මල්වත්ත පාර, මාතලේ.**

**සීඔඑම්/පීපී/2010/282**

ජල යෝජනා ක්‍රම සඳහා ඉදිකල ජලාශය හේතුවෙන් පෙත්සම්කරුගේ මැටල් කර්මාන්තය පවත්වාගෙන යාම තහනම් කර ඇති බැවින් එම කර්මාන්තය සඳහා තමාට ලබා දුන් ඉඩමට කර්මාන්තය පවත්වාගෙන යාම සඳහා දීර්ඝ කාලීන බලපත්‍රයක් ලබා දෙන ලෙස ඉල්ලමින් පෙත්සම්කරු පෙත්සම ඉදිරිපත් කර ඇත.

මෙම පෙත්සම වැඩිදුර විමර්ශන කටයුතු සඳහා ඔම්බුඩ්ස්මන් වෙත යොමු කරන ලදුව එම දීර්ඝ කාලීන බලපත්‍රය ලබා දෙන ලෙස ඔහු විසින් නිර්දේශ කර ඇත. ඒ අනුව මධ්‍යම පරිසර අධිකාරිය සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශයේ අනුමැතිය සහ මහවැලි අධිකාරියේ චක්‍රලේඛයට යටත්ව කර්මාන්තය පවත්වා ගෙන යාම සඳහා පෙත්සම්කරුට වාර්ෂික බලපත්‍රය ලබා දී ඇති අතර, සංවර්ධන කටයුතුවල ප්‍රගතිය අනුව රජයේ ඉඩම් ආඥාපනත යටතේ දීර්ඝ කාලීන බලපත්‍රය නිකුත් කිරීමට කටයුතු කරන බව දැනුම් දී ඇත.

**(6) එන්. ප්‍රියංගිකා නිල්මිණි මහත්මිය**

**අංක 333, ජයන්ත වත්ත, කළුතර උතුර.**

**සීඔඑම්/පීපී/2010/114**

කළුතර, නාගොඩ පිහිටි පෙම්බෲක් වත්ත ඉඩමෙන් ඉඩම් කොටසක් ඉල්ලා අත්තිකාරම් මුදල් ගෙවූ අතර මහජන පෙත්සම් කාරක සභා නිර්දේශයට අනුව තමාට ඉහත ඉඩමෙන් පර්චස් 24.78ක ප්‍රමාණයක් ලබා දීමට අවශ්‍ය දිවුරුම් ප්‍රකාශ ලබා ගත්තද, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මෙතෙක් තමාට අදාළ ඉඩම පවරා නොදුන් බැවින් උක්ත ඉඩම පදිංචිය සඳහා ලබා දෙන ලෙස ඉල්ලමින් පෙත්සම්කාරිය පෙත්සම ඉදිරිපත් කර ඇත.

ඒ අනුව, 2003 වර්ෂය පදනම් කර ගෙන රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් කරන ලද තක්සේරු වටිනාකම පෙත්සම්කාරිය විසින් ගෙවීමෙන් පසු අංක 4982 හා 2011.11.25 දිනැති ඔප්පුව ඇය වෙත නිකුත් කිරීමට කටයුතු කර ඇත.

**(7) ඉන්ද්‍රානි ගල්පාත මහත්මිය**

**අංක B/66, කුරුඳු වත්ත, අඟුරුවැල්ල, රුවන්වැල්ල.**

**සීඔඑම්/පීපී/2012/1099**

පෙත්සම්කාරිය සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ලිපිකාරිනියක ලෙස වසර 26 ක් සේවය කර ඇති නමුත් ඇයගේ පත්වීම ස්ථිර කර නොතිබීම හේතුවෙන් විශ්‍රාම වැටුප් හිමිකම අහිමිව ඇති බැවින් තම පත්වීම ස්ථිර කර දෙන ලෙස ඉල්ලමින් පෙත්සම්කාරිය පෙත්සම ඉදිරිපත් කර ඇත.

ඒ අනුව, ඇයගේ දීර්ඝ කාලීන සේවය පිළිබඳව සානුකම්පිතව සලකා බලා ඇයට පමණක් පෞද්ගලික වන සේ ඇයගේ සෞඛ්‍ය ලිපිකරු පත්වීම ස්ථිර කිරීමට කටයුතු කරන ලෙස කාරක සභාව ලබා දුන් උපදෙස් පරිදි පෙත්සම්කාරියගේ වසර 26ක දීර්ඝ, යහපත් සේවා කාලය සලකා ඇයට පමණක් පෞද්ගලික වන සේ විශ්‍රාම වැටුප් සකස් කිරීමේ කාර්යයට පමණක් සීමා වන පරිදි මුල් පත්වීම් දිනය වූ 1985.10.01 දිනට සේවය ස්ථිර කර සේවය අවසන් කර ඇති බැවින් ඒ අනුව ඇයව සේවයෙන් විශ්‍රාම ගැන්වීමට කටයුතු කර ඇත.

**(8) ඩී.ජී. විමලසේන මහතා**

**අංක 4218, සමගිපුර, විහාරගල, සූරියවැව**

**සීඔඑම්/පීපී/2012/1141**

තමාට මහවැලි ඉඩම් කච්චේරිය මගින් ලැබුණු ඉඩමෙන් කොටසක් වෙනත් අයෙකු විසින් අසාධාරණ ලෙස ලබාගෙන ඇති බව සඳහන් කරන පෙත්සම්කරු තමාට ඉඩමේ පූර්ණ අයිතිය නීත්‍යානුකූල ලෙස ලබා දෙන ලෙස ඉල්ලමින් පෙත්සම ඉදිරිපත් කර ඇත.

බලපත්‍ර ලබා දීමේ ප්‍රගතිය පිළිබඳව කාරක සභාව විසින් විමසීමේදී එකම ඉඩම් කොටසකට බලපත්‍ර දෙකක් නිකුත් වී තිබීම වැරැද්දක් බව පිළිගත් නිලධාරීන්, පෙත්සම්කරුට වෙනම ඉඩමක් ලබා දී එය යථා තත්ත්වයට පත් කර ඔහුට ඉඩමේ ඔප්පුව ලබා දීමට කටයුතු කර ඇති බව දන්වා සිටින ලදි.

**(9) එන්. පී. එස්. රත්නායක මහතා**

**ගොඩගම, පැල්මඩුල්ල**

**සීඔඑම්/පීපී/2012/1053**

පෙත්සම්කරුගේ පුල්ලන්ද නැමැති ඉඩමට ජලය සැපයූ සිරිත් ඇල හා පෝටාව කඩා දමා ජලය ලබා දීම අවහිර කර ඇති බැවින් තමාට සාධාරණය ඉෂ්ඨ කර දෙන ලෙස ඉල්ලමින් පෙත්සම්කරු තම පෙත්සම ඉදිරිපත් කර ඇත.

මෙම පෙත්සම කාරක සභාව විසින් විමසීමේදී රක්ෂිතය ආරක්ෂා කර ගැනීම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී හා ප්‍රාදේශීය ලේකම්වරයාගේ කාර්යයක් බැවින් ඒ සම්බන්ධයෙන් කටයුතු නොකිරීම තම රාජකාරී පැහැර හැරීමක් ලෙස නිරීක්ෂණය කරමින් එම රක්ෂිතය නිදහස් කර ගැනීමට කටයුතු කරන ලෙස දැනුම් දී, පෞද්ගලික වාද බේද විසඳා වගා කටයුතු කරන ලෙස පෙත්සම්කරුට උපදෙස් සපයමින්ද, වගාවට අවශ්‍ය සහයෝගය මෙම පෙත්සම්කරුට ලබා දෙන ලෙස ඉහත නිලධාරීන්ට දන්වා සිටින ලදී.

**(10) අයි.පී.කේ.එච්.කේ. ධර්මසිරි මහතා**

**අංක 576, පැල්පිටිය, ඇහැලියගොඩ.**

**සීඔඑම්/පීපී/2012/1274**

ලංකා බැංකුව විසින් පවත්වන ලද ලංකා බැංකු කාර්ය මණ්ඩල සහකාර (පුහුණු) තනතුරු සඳහා වූ ලිඛිත විභාගය සමත්ව සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට ඇති පෙත්සම්කරු, තමාට රාජ්‍ය, පෞද්ගලික හා සංස්ථා අංශයේ දළ වශයෙන් 3% රැකියා අවස්ථාවන් ආබාධිත පුද්ගලයන් සඳහා වෙන් කර තැබීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 04/0766/027/006 යටතේ වන සහනය ලබා දෙන ලෙස ඉල්ලමින් පෙත්සම ඉදිරිපත් කර ඇත.

කාරක සභාව විසින් ඉහත කැබිනට් තීරණය මත ලබා දී ඇති සහනය ආබාධිත පෙත්සම්කරු වෙත ලබා දෙන ලෙස දුන් උපදෙස් අනුව පෙත්සම්කරු 2013.01.01 දින සිට අභ්‍යාසලාභී මාණ්ඩලික සහකාර තනතුරට බඳවා ගැනීමට කටයුතු කර ඇත.

(11) **කේ. ලොකුලියන මහතා**

**අංක 44/9, පන්සල පාර, මොරටුමුල්ල, මොරටුව.**

**සීඕඑම්/පීපී/2011/779**

මෙම පෙත්සම්කරු බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණක වශයෙන් සේවය කර අවුරුදු 55 සම්පූර්ණ කිරීමට ආසන්නව තිබියදී සේවයෙන් ඉල්ලා අස් වී ඇති අතර තමාට මාස 3 ක් තුළ ගෙවිය යුතුව තිබූ අර්ථ සාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවන ලද්දේ මාස 15ක් ගත වූ පසු බව සඳහන් කරයි. එම නිසා ප්‍රමාද වූ කාලය සඳහා තමාට ගෙවිය යුතු පොලිය ගෙවන ලෙස හා විශ්‍රාමික පාරිතෝෂික මුදල ලබා දෙන ලෙස ඉල්ලමින් පෙත්සම ඉදිරිපත් කර ඇත.

මේ සම්බන්ධයෙන් කාරක සභාව විමර්ශනය කර ලබා දුන් නිර්දේශය අනුව බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය විසින් පෙත්සම්කරුට අදාළ ගෙවීම කර ඇත.

(12) **කේ.එන්.ජී.එන්. පෙරේරා මහතා**

**අංක 225, ශ්‍රී ඥාණමෝලි මාවත, 11 වෙනි පටුමග, මාකොල උතුර, මාකොල.**

**සීඕඑම්/පීපී/2011/610**

ලිපිකරුවෙකු ලෙස සේවයට බැඳුනු මෙම පෙත්සම්කරුට වසර ගණනාවකදීම උසස්වීම් ලබා නොදුන් නමුත් වර්ෂ 17කට පසු 3 වන ශ්‍රේණියේ III වන පන්තියට උසස් කරන ලද බවත්, මේ සම්බන්ධව තමා දේශපාලන පළිගැනීම් කමිටුවට අභියාචනයක් ඉදිරිපත් කළ බවත්, 1995.06.01 දින සිට බල පැවැත්වෙන පරිදි 3 වන ශ්‍රේණියේ I වන පන්තියට වන උසස්වීම ලබා දෙන ලෙස නිර්දේශ කළ ද එය නොලැබුණු බැවින් පැවති මානසික අසහනයක් නිසා විශ්‍රාම ගිය බැවින් මේ පිළිබඳ සළකා බලා තමාට යුක්තිය ඉටු කර දෙන ලෙස ඉල්ලමින් පෙත්සම ඉදිරිපත් කර ඇත.

පෙත්සම්කරුට කාරක සභාවෙන් සාකච්ඡා කොට පළමුව රු. 200,000.00ක මුදලක්ද, දෙවනුව රු. 350,000.00 ක මුදලක් ද සානුකම්පිත පදනම මත ලබා දීමට එකඟ වූ නමුත්, පෙත්සම්කරු එය භාරගැනීමට අකමැති වූ හෙයින් පෙත්සම්කරුට පමණක් පෞද්ගලික වන සේ සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා තිබීම මත කාරක සභාවට ගරු කිරීමක් ලෙස සානුකම්පිත දීමනාවක් ගෙවීමට එකඟ වී බැවින් එම මුදල ලබා ගන්නා ලෙස පෙත්සම්කරුට දැනුම් දෙන ලදි.

(13) **ඒ. සිරිපාල මහතා**

**අංක 363, දාගොන්න, මීගමුව හරහා.**

**සීඕඑම්/පීපී/2012/1221**

විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 12 වන වගන්තියට යටත්ව තමාව විශ්‍රාම ගන්වා ඇති බවත්, තමාට එරෙහිව වූ නඩුව 2011.11.30 දින තමා නිදොස්කොට නිදහස් කිරීමෙන් අවසන් වුවද, තමන්ට හිමි උප පොලිස් පරීක්ෂක තනතුරට උසස්වීම ලබා දී සාමාන්‍ය පරිදි විශ්‍රාම නොගැන්වීමෙන් තමාට විශ්‍රාම වැටුප් අහිමි වී අගතියක් වී ඇති බැවින් සහනයක් ලබා දෙන ලෙස ඉල්ලමින් පෙත්සම්කරු පෙත්සම ඉදිරිපත් කර ඇත.

මෙම පෙත්සම කාරක සභාව විසින් විමර්ශනය කිරීමෙන් අනතුරුව ලබා දුන් උපදෙස් අනුව පෙත්සම්කරුගේ විශ්‍රාමය සාමාන්‍ය විශ්‍රාමයක් බවට සංශෝධනය කර ඔහුට උප පොලිස් පරීක්ෂක උසස්වීම ලබා දීමට කටයුතු කර ඇත.

**(14) ඩබ්ලිව්.එස්. පීරිස් මහතා**

**අංක 41/1, ඩී.එස්.ෆොන්සේකා පාර, තිඹිරිගස්යාය, කොළඹ 05.**

**සීඔඑම්/පීපී/2011/541**

පෙත්සම්කරු තමා විශ්‍රාම ගොස් ඇති බවත්, 2005 අංක 36 දරන අයවැය දීමනාවේ 2005.08.01 සිට 2008.07.01දක්වා මාස 36ක මුදලක් තමාට ලැබීමට තිබූ බවත්, ඉන් කොටසක් ගෙවා ඇති බැවින් එම මුදලේ ඉතිරි කොටස ලබාදෙන ලෙසත්, 2007 ජූලි සිට 2009 අප්‍රේල් දක්වා සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ හිමිකම් ඇතත් මෙම කාල සීමාවේදී මාස දෙකක හැර ආයතනය විසින් එහි දායක මුදල් ගෙවා නොමැති හෙයින් එම මුදල් තම සේවක අර්ථසාධක අරමුදල් ගිණුමට බැර කරන ලෙසත් ඉල්ලා පෙත්සම්කරු පෙත්සම ඉදිරිපත් කර ඇත.

කාරක සභාවේ නිර්දේශය පරිදි පෙත්සම්කරුට අදාළ ගෙවීම් කර ඇති බව සඳහන් කරන ලද අතර පෙත්සම්කරු ද මේ බව තහවුරු කරමින් කාරක සභාව වෙත ලිපියක් යොමුකර ඇත.

**(15) මතුගමගේ ප්‍රේමරත්න මහතා**

**අංක 344, දොඩම්කුඹුර වත්ත, දොඩම්කුඹුර, අලව්ව**

**සීඔඑම්/පීපී/2011/856**

ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන ගුරුවරයෙකු වූ පෙත්සම්කරු, කොළඹ 14, ග්‍රෑන්ඩ්පාස් හි කො/ශාන්ත ජෝශප් පිරිමි විද්‍යාලයේ සේවය කරමින් සිටියදී අසනීප හේතු මත සේවයට වාර්තා කිරීමට නොහැකි බව විද්‍යාලපති සහෝදරතුමා දැනුවත් කර තිබියදීත් සේවය හැර ගිය සේ සලකා කටයුතු කර ඇති බැවින් නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලමින් පෙත්සම ඉදිරිපත් කර ඇත.

පෙත්සම්කරු තමා සේවයේ නොමැති කාලය සඳහා වැටුප් ලබා දෙන ලෙස කාරක සභාවෙන් නැවත ඉල්ලීමක් කර තිබුනද, ඔහු නැවත සේවයේ පිහිටුවන ලෙස දන්වමින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ඔහු වෙත නිකුත් කර ඇති 2012.03.28 දිනැති ලිපියේ 5 වන කොන්දේසිය වන, නැවත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා නොබලන බවට වූ කොන්දේසියට එකඟව ඔහු විසින් නැවත සේවය ලබා ගෙන ඇත.

(16) **එස්.ඒ. ජේමලතා මහත්මිය**

**අංක 95/15, කාක්කැලේවත්ත, පල්ලෙවෙල**

**සීඔඑම්/පීපී/2011/621**

දේශපාලන හේතු මත සේවය අහිමි වූ පෙත්සම්කාරියව 1996.06.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 1978.08.10 දින සිට නැවත සේවයේ පිහිටුවා ඇති නමුත් විශ්‍රාම වැටුප් ගණනය කිරීමේදී පෙර සේවා කාලය ඇතුළත් කර නොමැති බව පවසා පෙත්සම්කාරිය පෙත්සම ඉදිරිපත් කර ඇත.

කාරක සභාව පෙත්සම විමර්ශනය කිරීමෙන් අනතුරුව සේවයේ නොසිටි කාලය විශ්‍රම වැටුප් කාර්යය සඳහා අදාළ කර විශ්‍රාම වැටුප් සංශෝධනය කරන ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු නිලධාරීන්ට ලබා දුන් උපදෙස් අනුව පෙත්සම්කාරියගේ විශ්‍රාම වැටුප නිවැරදි ලෙස ගණනය කර විශ්‍රාම වැටුප ලබා දී ඇත.

**(17) කේ. සීලන් මහත්මිය**

**අංක 68/42, නීලම්මහර, බුත්පිටිය**

**සීඔඑම්/පීපී/2011/622**

දේශපාලන හේතු මත සේවය අහිමි වූ පෙත්සම්කාරියව 1996.06.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 1978.08.10 දින සිට නැවත සේවයේ පිහිටුවා ඇති නමුත් විශ්‍රාම වැටුප් ගණනය කිරීමේදී පෙර සේවා කාලය ඇතුළත් කර නොගෙන ඇතැයි පවසා පෙත්සම්කාරිය පෙත්සම ඉදිරිපත් කර ඇත.

කාරක සභාව පෙත්සම විමර්ශනය කිරීමෙන් අනතුරුව සේවයේ නොසිටි කාලය විශ්‍රාම වැටුප් කාර්යය සඳහා අදාළ කර විශ්‍රාම වැටුප් සංශෝධනය කරන ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු නිලධාරීන්ට ලබා දුන් උපදෙස් අනුව පෙත්සම්කාරියගේ විශ්‍රාම වැටුප නිවැරදි ලෙස ගණනය කර විශ්‍රාම වැටුප ලබා දී ඇත.

(18) **එච්.එම්. විජේරත්න බණ්ඩාර මහතා**

**අංක 62, හුලංදාව දකුණ, මොණරාගල**

**සීඔඑම්/පීපී/2010/311**

මොණරාගල උප තැපැල් කාර්යාලයේ තැපැල් ආදේශකයෙකු ලෙස තමා සේවය කරන කාලයේ තම බිරිඳ මොණරාගල තැපැල් කාර්යාලයෙන් පාලනය වන හුලංදාව දකුණ උප තැපැල් කාර්යාලයේ උප තැපැල් ස්ථානාධිපතිනිය ලෙස පත්වීම ලැබීම හේතුවෙන් තමා එම තැපැල් කාර්යාලයේම සේවයේ යෙදවීම සුදුසු නොවන බව පවසමින් වෙනත් තැපැල් කාර්යාලයක සේවයේ නොයොදවා ව්‍යාජ චෝදනා මත තම රැකියාව අහිමි කළ බැවින් අවලංගු කරන ලද තම පත්වීම සක්‍රීය කර ගත වූ කාලයට අදාළ උසස්වීම් නාමිකව ලබා දී වර්තමානයට හිමිවන තනතුර ලබා දෙන ලෙස ඉල්ලමින් පෙත්සම්කරු පෙත්සම ඉදිරිපත් කර ඇත.

කාරක සභාවේ නිර්දේශය අනුව සානුකම්පිත පදනම මත පෙත්සම්කරුගේ වයස පිළිබඳව නොසලකා ඔහුව මොණරාගල තැපැල් කාර්යාලයෙහි ජ්‍යෙෂ්ඨතා ලේඛනයෙහි අන්තිමයා ලෙස තබා ලියාපදිංචි ආදේශක පත්වීම ලබා දී ඇත.

**(19) දිසානායක පද්මසිරි මහතා**

**දිසානායක ස්ටෝර්ස්, ජනපදය, නාකියාදෙනිය.**

**සීඔඑම්/පීපී/2010/213**

මෙම පෙත්සම්කරු ගාල්ල තැපැල් කාර්යාලයේ ලියාපදිංචි ආදේශක තනතුරෙහි සේවය කරමින් සිටියදී තම රාජකාරී අත්හිටුවා පසුව පැවති විධිමත් විනය පරීක්ෂණයේදී විනය නියෝගය ලෙස තම ලියාපදිංචි ආදේශකත්වය අවලංගු කිරීමෙන් සිදු වූ අසාධාරණය වෙනුවෙන් තමාව නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලමින් පෙත්සම්කරු පෙත්සම ඉදිරිපත් කර තිබුණි.

කාරක සභාවේ ඉල්ලීම පරිදි මෙම පෙත්සම්කරු සම්බන්ධයෙන් සානුකම්පිතව බලා ඔහුට විශ්‍රාම වැටුප් හිමිකම රහිතව ලියාපදිංචි ආදේශක පත්වීම ලබා දී ඇත.

**(20) එම්.ආර්.ජේ. ධයනාලි සුභාෂිනී ප්‍රේමචන්ද්‍ර මහත්මිය**

**"සමන්පාය", පුස්සැල්ල,පරකඩුව.**

**සීඔඑම්/පීපී/2010/208**

තමාට ලැබිය යුතුව තිබූ පුස්සැල්ල-මිල්ලවිටිය වැඩ බලන උප තැපැල් ස්ථානාධිපති තනතුර සඳහා පත්වීම තහනමකට ලක් වූ බවත්, නැවත වරක් එම තනතුර ගැසට් කර ඇති බැවින් තමාට එම පත්වීම ලබා දෙන ලෙසත් ඉල්ලමින් පෙත්සම්කාරිය පෙත්සම ඉදිරිපත් කර ඇත.

මෙම පත්වීම ලබා දීමට නැවත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වූ අතර ජී. සුරේඛා ලක්මිණී පෙරේරා මහත්මිය එහි පළමු ස්ථානයට පත් වූ බැවින් ඒ අනුව ඇයට පුස්සැල්ල-මිල්ලවිටිය උප තැපැල් කාර්යාලයේ වැඩබලන උප තැපැල් ස්ථානාධිපති තනතුර ලබා දීමට කටයුතු කිරීමේදී ඇය සහ මෙම පෙත්සම්කාරිය යන දෙදෙනාම කාරක සභාව ඉදිරියට පැමිණීම නිසා පත්වීම ලබා දී නොමැත.

පසුව නව බඳවා ගැනීම් පරිපාටිය අනුව දෙවන සම්මුඛ පරීක්ෂණයේදී ඉහළ ලකුණු ලබා ගෙන ඒ වන විට ද කාර්යාලය සකසා ගෙන සිටි ජී. සුරේඛා ලක්මිණී පෙරේරා මහත්මියට පුස්සැල්ල-මිල්ලවිටිය වැඩ බලන උප තැපැල් ස්ථානාධිපති තනතුරද, එම්. ආර්. ජේ. ඩී. සුභාෂිණී ප්‍රේමචන්ද්‍ර මහත්මියට එම දිස්ත්‍රික්කයේම සුදුසු ස්ථානයක පත්වීම ලබා දීමටද කටයුතු කර ඇත.

(21) **ජී. සුරේඛා ලක්මිණී පෙරේරා මහත්මිය**

**"වාසනා", පුස්සැල්ල,පරකඩුව**

**සීඔඑම්/පීපී/2011/769**

පුස්සැල්ල - මිල්ලවිටිය නමින් පවත්වාගෙන ගිය උප තැපැල් කාර්යාලයේ උප තැපැල් ස්ථානාධිපති තනතුර සඳහා පැවති පරීක්ෂණයෙන් වැඩිම ලකුණුලාභියා ලෙස තමා තේරුණු අතර තම පත්වීම අමාත්‍යාංශයෙන් අනුමත වී එනතුරු මාස 1½ පමණ තමා කුරුවිට තැපැල් කාර්යාලායේ පුහුණුවීම්වල නිරත වූ බවත්, තම ස්වාමිපුරුෂයා සතුව තිබූ ණය මුදලක් වැය කර තමා තේරී පත් වූ තැපැල් කාර්යාලය ද නවීකරණය කළ නමුත්, අමාත්‍යාංශයෙන් එම තැපැල් කාර්යාලය සඳහා වෙනත් අයෙකු පත් කළ බවත් සඳහන් කරන පෙත්සම්කාරිය තමාට සාධාරණය ඉටු කර දෙන ලෙස ඉල්ලමින් පෙත්සම ඉදිරිපත් කර ඇත.

දෙවන සම්මුඛ පරීක්ෂණයේදී ජී. සුරේඛා ලක්මිණී පෙරේරා මහත්මිය ඉහළ ලකුණු ලබා තිබීම මත ඇය මෙම තනතුර සඳහා වඩාත්ම සුදුසුකම් ලබන බැවින්ද, පෙත්සම්කාරිය තම කාර්යාලය සඳහා සුදුසු ස්ථානයක් සකසා ගෙන ඇති බැවින්ද ඇයට අදාළ තනතුර ලබා දී ඇත.

(22) **ඩී.කේ.එච්. වසන්තා මහත්මිය**

**අංක 7/19, ගල්වලලන්ද මාවත, මකුළුදූව, පිළියන්දල**

**සීඔඑම්/පීපී/2010/27**

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ උපදේශිකාවක් ලෙස සේවය කර ඇති පෙත්සම්කාරිය පසුව ගුරු සේවයට අන්තර්ග්‍රහණය වී ඇති අතර තමාගේ පෙර සේවා කාලය විශ්‍රාම වැටුපට අදාළ කර ගන්නා ලෙසත්, ආයතන සංග්‍රහයේ vii වන පරිච්ඡේදයේ 9 වන වගන්තියට අනුව වැටුප් වර්ධක වාසි ලබා දෙන ලෙසත් ඉල්ලමින් පෙත්සම්කාරිය පෙත්සම ඉදිරිපත් කර ඇත.

කාරක සභාව විසින් මෙම පෙත්සම විමර්ශනය කිරීමෙන් පසු පෙත්සම්කාරියට සහන ලබා දෙන ලෙස නිර්දේශ කර ඇති අතර පෙත්සම්කාරිය ගුරු පත්වීම ලබා ගන්නා අවස්ථාවේදී ආයතන සංග්‍රහය අනුව වැටුප් වර්ධක වාසි ලබා දීමට කටයුතු කර ඇත.

**(23)** **පී.පී. ධර්මදාස මහතා**

**බෝවත්ත, මුදුකටුව, මාරවිල**

**සීඔඑම්/පීපී/2010/256**

1977 මහ මැතිවරණයෙන් පසු තමා දේශපාලන පළිගැනීම්වලට ලක්වූ බවත්, ජීවිතාරක්ෂාව පතා විදේශගත වී විශ්‍රාම ගැනීමේ අයදුම්පතක් ඉදිරිපත් කළ බවත්, ඒ හේතුවෙන් තම විශ්‍රාම වැටුප අඩු වූ බවත් පවසන පෙත්සම්කරු තම රෝගී තත්ත්වය සලකා දේශපාලන පළිගැනීම්වලට ලක්වූ සෙසු ගුරුවරුන්ට ලබා දී ඇති සහන තමාටද ලබා දෙන ලෙස ඉල්ලමින් පෙත්සම ඉදිරිපත් කර ඇත.

පෙත්සම්කරුගේ විශ්‍රාම වැටුප රා.පරි.ව. 7/96 හා 7/96(1) යටතේ සංශෝධිත විශ්‍රාම වැටුපක් ලබා දෙන ලෙස කාරක සභාව නිර්දේශ කර ඇති අතර ඒ අනුව පෙත්සම්කරු අවුරුදු 60 තෙක් සේවය කළ සේ සලකා, විශ්‍රාම ගන්වා විශ්‍රාම වැටුප සංශෝධනය කර ඇත.

(24) **ඩී. ඒ. දයා බණ්ඩාර මහතා**

**"දස්කොන් සෙවන", ගමගොඩ, කළුතර.**

**සීඔඑම්/පීපී/2011/627**

පොලිස් කොස්තාපල්වරයෙක් ලෙස සේවය කර ඇති පෙත්සම්කරුට හදිසියේ ඇති වූ අසනීප තත්ත්වයක් මත ප්‍රතිකාර ගැනීමට සිදුවූ බවත්, ඒ බව තම ආසන්නතම ප්‍රධානියා වෙත වාචිකව හා ලිඛිතව දන්වා සිටියදීත් සේවය හැරගිය අයෙකු ලෙස සැලකූ බැවින් නැවත සේවයේ පිහිටුවා හිඟ වැටුප් ලබා දෙන ලෙස ඉල්ලමින් පෙත්සම්කරු පෙත්සම ඉදිරිපත් කර ඇත.

කාරක සභාව විසින් මෙම පෙත්සම විමර්ශනය කිරීමේදී පෙත්සම්කරුව නැවත සේවයේ පිහිටුවා ඇති බව පෙත්සම්කරු හා නිලධාරින් කාරක සභාවට දන්වා සිටින ලදි.

**(25) අනුර පී. පොල්වත්ත මහතා**

**ස්වශක්ති නිවස, ශ්‍රී ගුණපාලතිස්ස මාවත, නෑබඩ.**

**සීඔඑම්/පීපී/2012/1510**

කළුතර ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ශාඛා කළමනාකරුවකු ලෙස සේවය කර ඇති පෙත්සම්කරු ගනුදෙනුකරුවෙකුට උදව් කළේයැයි පවසමින් වැඩ තහනම් කර, අසාධාරණ ලෙස විනය පරීක්ෂණයක් පවත්වා රැකියාව අහිමි කළ බැවින් නැවත තම රැකියාව ලබා දෙන ලෙස ඉල්ලමින් මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත.

කාරක සභාව විසින් පෙත්සම විමර්ශනය කිරීමේදි නැවත රැකියාව ලබා දීමට නොහැකි බව තීරණය කළ නමුත්, ඔහුගේ ණය මුදල් සම්බන්ධයෙන් සහනයක් ලබා දීමට කටයුතු කරන ලෙස බැංකුව වෙත ලබා දුන් නිර්දේශය මත ණය මුදල් පියවීම සම්බන්ධයෙන් පෙත්සම්කරුට සහන ලබා දී ඇත.

(26) **එස්. එම්. රෝහිණී දයාකාන්ති මහත්මිය**

**අංක 5/16, නාමල් දෙනිය, පරකඩුව**

**සීඔඑම්/පීපී/2012/1161**

සබරගමුව පළාත් සභාවේ, කුරුවිට පැරඩයිස් රජයේ භාර ගැනීමේ ළමා නිවාසයේ, "නිවාස මාතා" තනතුරේ කොන්ත්‍රාත් පදනම මත සේවය කරමින් සිටි පෙත්සම්කාරියන් දෙදෙනාගේ සේවය ඔවුන්ගේ රැකවරණය යටතේ සිටි දරුවකුගේ මරණය හේතුවෙන් සිදු වූ පරීක්ෂණවල ප්‍රතිඵලයක් වශයෙන් අවසන් කරන ලද බැවින් එම තනතුරේ සේවය කිරීමට නැවත අවස්ථාවක් සලසා දෙන ලෙස ඉල්ලමින් පෙත්සම්කාරිය පෙත්සම ඉදිරිපත් කර ඇත.

කාරක සභාව විසින් පෙත්සම විමර්ශනය කරන ලද දෙවන අවස්ථාවේදී නිර්දේශ කරන ලද්දේ පෙත්සම්කාරියව කුමන පදනමකින් හෝ නැවත සේවයට බඳවා ගන්නා ලෙසය. ඒ අනුව පෙත්සම්කාරියව නැවත කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවා ගැනීමට කටයුතු කර ඇත.

**(27) ටී.එච්. ඉන්ද්‍රානි ජයසිංහ මහත්මිය**

**අංක 26, මඩල, ඇල්ල ගාව**

**සීඔඑම්/පීපී/2012/1162**

සබරගමුව පළාත් සභාවේ, කුරුවිට පැරඩයිස් රජයේ භාර ගැනීමේ ළමා නිවාසයේ, "නිවාස මාතා" තනතුරේ කොන්ත්‍රාත් පදනම මත සේවය කරමින් සිටි පෙත්සම්කාරියන් දෙදෙනාගේ සේවය ඔවුන්ගේ රැකවරණය යටතේ සිටි දරුවකුගේ මරණය හේතුවෙන් සිදුවූ පරීක්ෂණවල ප්‍රතිඵලයක් වශයෙන් අවසන් කරන ලද බැවින් එම තනතුරේ සේවය කිරීමට නැවත අවස්ථාවක් සලසා දෙන ලෙස ඉල්ලමින් පෙත්සම්කාරිය පෙත්සම ඉදිරිපත් කර ඇත.

කාරක සභාව විසින් පෙත්සම විමර්ශනය කරන ලද දෙවන අවස්ථාවේදී නිර්දේශ කරන ලද්දේ පෙත්සම්කාරියව කුමන පදනමකින් හෝ නැවත සේවයට බඳවා ගන්නා ලෙසය. ඒ අනුව පෙත්සම්කාරියව නැවත කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවා ගැනීමට කටයුතු කර ඇත.

**(28) සී.කේ. මණ්ඩලවත්ත මහතා**

**අංක 76, මානිගෙවත්ත, ඉහළ කිඹිය, ගාල්ල**

**සීඔඑම්/පීපී/2011/1552**

පෙත්සම්කරු ඇතුළු පිරිසක් යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික විද්‍යාලවල වඩුකාර්මික, වැද්දුම්කරු, විදුලි කාර්මික වැනි තනතුරුවලට බඳවා ගත් නමුත් මාස 3කින් පසු වැටුප් ලබා නොදුන් බවත්, නැවත සුදුසුකම් පරීක්ෂා කිරීමක් කර සේවයෙන් ඉවත් කරන ලද බැවින් නැවත රැකියා ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම්කරු පෙත්සම ඉදිරිපත් කර ඇත.

කාරක සභාව විසින් මෙම පෙත්සම විමර්ශනය කිරීමේදී අමාත්‍යාංශ නිලධාරීන් දන්වා සිටියේ මෙම පිරිසගේ සුදුසුකම් පරීක්ෂා කර ඒ අනුව ක්ෂේත්‍ර සහකාර සේවක තනතුරු ප්‍රදානය කර ඇති බවයි.

**(29)** එම්. ගනේෂ්රාජා මහතා

පුලියවත්ත දෙමළ මහ විද්‍යාලය, දික්ඔය

සීඔඑම්/**පීපී/2014/2071**

පෙත්සම්කරු විදේශීය පාඨමාලාවකට සහභාගී වී සිටින අතර විදුහල්පති සේවයේ පළමු ශ්‍රේණියට උසස් කිරීම සඳහා පැවැති සම්මුඛ පරීක්ෂණයට සහභාගීවීමට නොහැකිවූ බැවින් තමාට එම උසස්වීම අහිමිවී ඇති බවත්, අදාළ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට වෙනත් දිනයක් ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලද නමුත් නිසි ප්‍රතිචාරයක් නොලද බවත් සඳහන් කරමින් තමාට හිමි උසස්වීම ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙතින් මෙම පෙත්සම පිළිබඳ වාර්තාවක් කැඳවා ඇති අතර ඊට පිළිතුරු ලෙස අමාත්‍යාංශයේ ලේකම් විසින් වාර්තා කර ඇත්තේ පෙත්සම්කරුට උසස්වීම ප්‍රදානය කර ඇති බවය.

**(30) යූ.එස්.එස්. ප්‍රනාන්දු මහතා ඇතුළු පිරිස**

**"සුරංග", ශාන්ත සේවියර් පාර, උල්හිටිය, වෙන්නප්පුව**

**සීඔඑම්/පීපී/2011/802**

ලංකා බැංකුවේ 2010 වර්ෂයේ පැවැති නිලධාරී පුහුණුවන්නන් බඳවා ගැනීම සඳහා පැවැති සම්මුඛ පරීක්ෂණයේදී රචනා හා අවබෝධය ප්‍රශ්න පත්‍රය 2010/48 චක්‍රලේඛයට පරිබාහිරවූවක් බැවින් තමන්ට අදාළ උසස්වීම් ලබා ගැනීමට නොහැකි වූ බැවින් සාධාරණයක් ඉටු කර දෙන ලෙස ඉල්ලමින් පෙත්සම ඉදිරිපත් කර ඇත.

පෙත්සම්කරුවන්ට අසාධාරණයක් වී ඇති බැවින් අදාළ විභාගයට පෙනී සිට උසස්වීම් ලබා දුන් අනෙකුත් අපේක්ෂකයන්ට උසස්වීම් පිරිනැමූ දින සිට පෙත්සම්කරුවන්ටද පෙර දාතම් කර උසස්වීම් ලබා දෙන ලෙස කාරක සභාව ලබා දුන් නිර්දේශය පරිදි කටයුතු කර ඇත.

**(31) ඩී.ඩී. විජේසේන මහතා**

**අංක 83/ඒ, පමුණුගම, අළුබෝමුල්ල**

**සීඔඑම්/පීපී/2010/469**

බණ්ඩාරගම විවිධ සේවා සමුපකාර සමිතියේ සේවය කර ඇති පෙත්සම්කරුට සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් ගෙවිය යුතුයැයි නිර්දේශ කළ හිඟ වැටුප් හා වන්දි මුදල් ගෙවීම තම සමුපකාර සමිතිය විසින් පැහැරහැර ඇති බැවින් සමුපකාර සේවක කොමිෂන් සභාවේ නියෝගයට අනුව හිමිවිය යුතු හිඟ වැටුප් හා වන්දි මුදල් ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම්කරු පෙත්සම ඉදිරිපත් කර තිබුනි.

පෙත්සම්කරුට අදාළ ගෙවීම් කරන ලෙස සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණය අනුව ක්‍රියාත්මක වන බවට නිලධාරීන් දැක්වූ කරුණු අනුව පෙත්සම්කරුට සියලු මුදල් ගෙවා නිම කර ඇත.

**(32) කේ.එච්. නිහාල් මහතා**

**පතිරගොඩ, ගනේගොඩ, අක්මීමන.**

**සීඑම්/පීපී/2011/491**

පෙත්සම්කරු දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ වසර 17 ක් පමණ අනියම් පදනමින් සේවය කරමින් සිටින බවත්, අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා තිබෙන බවත් පවසමින් සේවයේ ස්ථිර කර දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත.

මෙම පෙත්සම පෙත්සම්කරුද සමඟින් පළමුවරට විමර්ශනයට ගත් අවස්ථාවේදී කාරක සභාව පෙත්සම්කරු සේවයේ ස්ථිර කිරීමට කටයුතු කරන ලෙස නිලධාරීන්ට කරන ලද දැනුම් දීම අනුව පෙත්සම්කරුගේ සේවය ස්ථිර කර ඇත.

**(33) ඊ.එම්. සන්ධ්‍යා මහත්මිය**

**අංක 48, ඉඳිගහලන්ද, උඩවත්තගොඩ පාර, කළුතර**

**සීඑම්/පීපී/2012/1028**

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සේවය කරමින් සිටි පෙත්සම්කාරිය ප්‍රසූත නිවාඩු ගොස් සිටින අතරතුර තම සේවය නතර කළ අතර ඇය ඉදිරිපත් කළ අභියාචනය අනුව සේවයට නැවත බඳවා ගත්තද තම පෙර සේවා කාලය නොසලකා ස්ථිර කිරීම නිසා සිදුවූ අසාධාරණය වෙනුවෙන් ස්ථිර පත්වීම ලබා දෙන ලෙස ඉල්ලමින් පෙත්සම ඉදිරිපත් කර ඇත.

කාරක සභාව පෙත්සම විමර්ශනය කරමින් එළැඹි එකඟතාවය අනුව පෙත්සම්කාරියගේ පත්වීම පෙරදාතම කර එදින සිට වැටුප් වර්ධක ලබා දී හිඟ වැටුප් රහිතව නියමිත වැටුප් පරිමාණයෙහි අදාළ වැටුප් පියවරෙහි පිහිටුවා ඇත.

**(34) එම්.ටී.ඒ. මන්සූර් මහතා**

**අංක 277/ඒ, කෙළින් වීදිය, ඇහැලියගොඩ**

**සීඑම්/පීපී/2011/677**

උපගුරුවරයෙකු ලෙස සේවය කරමින් සිටි පෙත්සම්කරුට ඇති වූ මානසික රෝගී තත්ත්වයක් මත සේවයට වාර්තා කිරීමට නොහැකි වී ඇති අතර තම වසර 18ක සේවා කාලය සලකා විශ්‍රාම වැටුප ලබා දෙන ලෙස ඉල්ලමින් පෙත්සම්කරු පෙත්සම ඉදිරිපත් කර ඇත.

පෙත්සම්කරුට සේවය හැරයාමේ නියෝගයක් නිකුත් කර නැති බැවින් ආයතන සංග්‍රහය අනුව කටයුතු කර නොතිබීම පෙත්සම්කරුට සහන ලබා දීමට අවස්ථාවක් කර ගනිමින් විශ්‍රාම වැටුප් ලබා දෙන ලෙස වූ කාරක සභාවේ නිර්දේශය අනුව පෙත්සම්කරුට විශ්‍රාම වැටුප් ලබා දීමට අවශ්‍ය කටයුතු කර ඇත.

**(35) වී. සුන්දරමූර්ති මහතා**

**අංක 79, වින්ටර්න් වේ, හැරෝ, මිඩ්ල්සෙක්ස්, HA2 ORZ, ලන්ඩන්, එක්සත් රාජධානිය**

**සීඔඑම්/පීපී/2011/800**

මහජන බැංකුවේ ශාඛා කළමනාකරු ලෙස සේවය කර ඇති පෙත්සම්කරු ජීවිත ආරක්ෂාව පතා වැටුප් රහිත නිවාඩු මත විදේශගත වී ඇති අතර විශ්‍රාම ගන්වන ලෙස ඉල්ලීම් කළද ඊට ප්‍රතිචාර නොලද බැවින් විශ්‍රාම වැටුප ලබා දෙන ලෙස ඉල්ලමින් පෙත්සම්කරු පෙත්සම ඉදිරිපත් කර ඇත.

පෙත්සම්කරුට සේවය හැරයාමේ නියෝග නිකුත් කර ඇති බැවින් විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීමට නොහැකි නමුත් කාරක සභාවට ගරු කිරීමක් ලෙස විකල්ප සහනයක් ලෙස රු.750,000/- ක මුදලක් පෙත්සම්කරුට ගෙවීමට බැංකුව කටයුතු කර ඇත.

**(36) එස්. ඩබ්ලිව්. ඒ. කරුණාසිරි මහතා**

**තල්පාවිල, කැකණදුර**

**සීඔඑම්/පීපී/2011/887**

පෙත්සම්කරු කළමනාකරණ සේවයේ අධි පන්තියේ සීමිත තරඟ විභාගය සමත් වී ඇති අතර පුරප්පාඩු පැවතියද තමාට උසස්වීම ලබා නොදුන් බැවින් සාධාරණයක් ඉටු කර දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත.

මෙම පෙත්සම සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙතින් වාර්තාවක් කැඳවා ඇති අතර සානුකම්පිතව සලකා බලා තමා වෙත උසස්වීම ලබා දී ඇති බව පෙත්සම්කරු කාරක සභාවට දන්වා ඇත.

**(37) එච්.ඒ. ජයරත්න මහතා**

**අංක 67/2, දියගම, කිරිවත්තුඩුව**

**සීඔඑම්/පීපී/2012/1254**

ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය කර ඇති පෙත්සම්කරු සේවයෙන් ඉවත් කර ඇති අතර අධිකරණ තීන්දුව අනුව සේවා කඩවීමකින් තොරව නැවත සේවයේ පිහිටුවා ඇති නමුත් අධිකරණ තීන්දුව පරිදි තමාට හිමිවිය යුතු ගෙවීම් නොකළ බැවින් එම දීමනා ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත.

කාරක සභාව විසින් මෙම පෙත්සම විමර්ශනය කර ලබා දුන් නිර්දේශය අනුව අධිකරණ තීන්දුව පරිදි පෙත්සම්කරු වෙත ඔහුට හිමි සියලු දීමනා ගෙවීමට ලංකා විදුලිබල මණ්ඩලය කටයුතු කර ඇත.

**(38) ජේ.එම්.පී. බණ්ඩාර මහතා**

**"සංඛ", හෙට්ටිහෙරලියගහවත්ත, පල්ලේපේරුව, හීල්ඔය, බණ්ඩාරවෙල**

**සීඑම්/පීපී/2012/1258**

විදුහල්පති සේවයේ 2-I ශ්‍රේණියේ නිලධාරියෙක් වන පෙත්සම්කරුට වසර 27ක සේවා කාලයක් ඇතිව විදුහල්පති I ශ්‍රේණියට පත්වීමට සුදුසුකම් ලද නමුත් තමාට එම පත්වීම ලබා නොදෙන බැවින් එම විදුහල්පති I ශ්‍රේණියට උසස්වීම ලබා දෙන ලෙස ඉල්ලමින් පෙත්සම්කරු පෙත්සම ඉදිරිපත් කර ඇත.

මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් වාර්තාවක් කැඳවූ අවස්ථාවේදී පෙත්සම්කරුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියට උසස්කර ඇති බව අමාත්‍යාංශය විසින් වාර්තා කර ඇත.

**(39) එම්.ඩබ්ලිව්. සරණපාල මහතා**

**අංක 20/3, පීරිස් මාවත, මොරගස්මුල්ල, රාජගිරිය**

**සීඑම්/පීපී/2013/1909**

වයස අවුරුදු 58 මාස 6ක් වූ පෙත්සම්කරු විවාහ රෙජිස්ටාර් තනතුර සඳහා අයදුම් කරන ලද අතර එම තනතුර සඳහා සුදුසුකම් ලෙස වයස අවුරුදු 60ට අඩු විය යුතු වූ නමුත් තමාගේ වයස අවුරුදු 60ට ආසන්න බැවින් එම තනතුර තමන්ට ලබා නොදුන් බැවින් අදාළ තනතුර ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම්කරු පෙත්සම ඉදිරිපත් කර ඇත.

මේ පිළිබඳව කාරක සභාව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් වාර්තාවක් කැඳවීමේදී පත්වීම ලබාදීමට කටයුතු කර ඇති බව අමාත්‍යාංශය දන්වා සිටි අතර තමන්ට පත්වීම ලද බව පෙත්සම්කරු ද කාරක සභාවට වාර්තා කරන ලදි.

**(40) යූ.ජී.එල්.ටී. නිරෝෂනී මෙනෙවිය**

**කන්දවත්ත, කරදන, රත්නපුර**

**සීඑම්/පීපී/2012/1049**

සුදුසුකම් මත බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සුභ සාධක නිලධාරී (II පෙළ - අනියම්) තනතුර සඳහා බඳවා ගෙන ඇති පෙත්සම්කාරියව ස්ථිර කිරීමට සලකා බැලීමේදී උස අඟල් 1 ½ ක් අඩු බව සඳහන් කරමින් ස්ථිර නොකළ බවත්, එය මෙම තනතුරට අදාළ නොවන බැවින් පත්වීම ස්ථිර කර දෙන ලෙස ඉල්ලා පෙත්සම්කාරිය පෙත්සම ඉදිරිපත් කර ඇත.

අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන පෙත්සම්කාරියගේ පත්වීම ස්ථිර කිරීමට පියවර ගන්නා ලෙස කාරක සභාව ලබා දී ඇති තීරණය අනුව කටයුතු කර පෙත්සම්කාරියගේ පත්වීම ස්ථිර කර ඇත.

**(41) කේ.ආර්. නිමලාවතී මහත්මිය**

**නානවල, ගෝවින්න**

**සීඔඑම්/පීපී/2013/1946**

පවුල් සෞඛ්‍ය සේවිකාවක ලෙස වසර 15ක් සේවය කර ඇති තමන් වැඩ තහනමට ලක්වූ බවත්, ඒ වන විටද සේවයේ ස්ථිර කර නොතිබූ බවත් පවසන පෙත්සම්කාරිය තමා නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත.

මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් වාර්තාවක් කැඳවා ඇති අතර පෙත්සම්කාරිය වෙත නිකුත් කර ඇති විනය නියෝගය අනුව කොන්දේසි 4ක් සහිතව ඇයව නැවත සේවයේ පිහිටුවා ඇති බව අමාත්‍යාංශය දන්වා සිටින ලදි.

**(42) වම්මි මනෝජ් ද සිල්වා මහතා**

**කටුකුරුදුගහලන්ද, පයාගල**

**සීඔඑම්/පීපී/2012/1441**

විදේශ රැකියා හා සුභසාධන අමාත්‍යාංශයේ සේවකයෙකු වූ පෙත්සම්කරු රාජකාරියේ යෙදී සිටියදී සිදු වූ රිය අනතුරකින් ආබාධිත තත්ත්වයට පත්වී ඇති අතර තමා අනියම් සේවකයෙකු සේ සලකා වැටුප් හෝ වන්දි ලබා නොදුන් බැවින් සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත.

කාරක සභාව විසින් විමර්ශනය කිරීමෙන් පසු සම්පූර්ණයෙන්ම ආබාධිත තත්ත්වයට පත්ව සිටින පෙත්සම්කරුට හිමි වන්දි මුදල් හා විශ්‍රාම වැටුප ලබා දෙන ලෙස කර ඇති නිර්දේශය අනුව වන්දි මුදල් ගෙවා ඇති අතර විශ්‍රාම වැටුප් හිමිකම සම්බන්ධයෙන් කටයුතු කෙරෙමින් පවතී.

**(43) එන්.ඩී. ස්වර්ණමාලි විජේසූරිය**

**පින්නගොල්ලවත්ත, වැලිගොඩපිටිය, පොල්ගහවෙල**

**සීඔඑම්/පීපී/2013/1935**

සනීපාරක්ෂක කම්කරු ලෙස සේවය කර ඇති පෙත්සම්කාරිය රාජකාරියේ නියුතුව සිටියදී මුහුණ දීමට සිදුවූ සිදුවීමක් හේතුවෙන් අසනීපව රෝහල්ගතවී ප්‍රතිකාර ගැනීම නිසා සේවයට වාර්තා කිරීමට නොහැකි වී ඇති අතර රැකියාවේ වගකීම හා වටිනාකම සම්බන්ධයෙන් තමා අතින් වරදක් සිදුවී ඇති බව පිළිගන්නා බැවින් නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත.

පෙත්සම්කාරියට සිදුව ඇති අපහසුතාවය සානුකම්පිතව සලකා බලා නවක සේවිකාවක ලෙස පත්වීම ලබා දෙන ලෙස වූ කාරක සභාවේ නිර්දේශය අනුව ඇයව කොළඹ සොයිසා කාන්තා රෝහලේ සේවයේ පිහිටුවා ඇත.

**(44)** **ධනපාල විජයශේඛරා මහතා**

**දිනුජය ෆිෂින් කම්පනි, අංක 12, පාසල්වත්ත, ගුරුබැවිල, වැලිගම**

**සීඔඑම්/පීපී/2014/2051**

ධීවර කාර්මිකයෙක් වන පෙත්සම්කරුගේ බහුදින ධීවර යාත්‍රාව විනාශයට පත්වූ බවත්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ රක්ෂණය කර ඇති එම යාත්‍රාව සඳහා වන්දි මුදල් ලබා දීම ප්‍රතික්ෂේප කර ඇති බැවින් රක්ෂණ වන්දි ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත.

පෙත්සම්කරුට පැහැදිලිවම හානියක් සිදුව ඇති බව තීරණය කළ කාරක සභාව ඔහුගේ යාත්‍රාව සඳහා රක්ෂණ වන්දි ලබා දෙන ලෙස වූ නිර්දේශය අනුව පෙත්සම්කරුට රු. 33,10,000.00 ක වන්දි මුදලක් ලබා දීමට කටයුතු කර ඇත.

**(45)** **ඒ. පී. හර්ෂී තනූජා මෙනෙවිය**

**අංක 294, අග්බෝපුර, කන්තලේ**

**සීඔඑම්/පීපී/2011/432**

ස්වේච්ඡා ගුරුවරුන් ස්ථිර කිරීමේදී වලංගු විය යුතු වසර 3ක අඛණ්ඩ සේවා කාලය නොතිබීම මත තනතුර ස්ථිර නොවූ බැවින් තම ස්වේච්ඡා ගුරු තනතුර ස්ථිර කර දෙන ලෙස ඉල්ලා පෙත්සම්කාරිය පෙත්සම ඉදිරිපත් කර ඇත.

මෙම පෙත්සම නිරීක්ෂණය කළ කාරක සභාව පෙත්සම්කාරියට ස්ථිර ගුරු තනතුර ලබා දීමට හැකියාවක් නොමැති බැවින් අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පත්වීමක් ලබා දෙන ලෙස ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කළ අතර ඊට ප්‍රතිචාර වශයෙන් පෙත්සම්කාරිය වෙත පාසල් කාර්යාල කාර්ය සහායක තනතුරක් ලබා දීමට කටයුතු කර ඇත.

**(46)** **බී.කේ. ගුණරත්න මහතා**

**"චාන්දනී", නාන්නපුරාව, බිබිලේ**

**සීඔඑම්/පීපී/2010/121**

පෙත්සම්කරු මොණරාගල ඩිපෝවේ රියදුරකු ලෙස සේවය කරමින් සිටියදී වෙනත් රියදුරෙකුගේ වරදකින් සේවා ස්ථානයේදී වූ අනතුරකින් රෝගාතුරව ප්‍රතිකාර ලබාගැනීමට සිදුවූ බවත්, ඒ සඳහා ආයතනයෙන් කිසිදු සහනයක් නොලද බවත්, ඒ අතරතුර වෛද්‍ය වාර්තා ඉදිරිපත් කළ ද තම සේවය අහිමි කර ඇති අතර ආබාධිත තත්ත්වයෙන් පසු වන තමාට හිඟ වැටුප් හා ශාරීරික හානිය වෙනුවෙන් රුපියල් ලක්ෂ තුනක වන්දි මුදලක් ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත.

කාරක සභාවේ තීරණය අනුව පෙත්සම්කරුට අනතුරු වන්දි ලෙස රු. 250,000/-ක මුදලක් රු.50,000/- බැගින් වූ වාරික 5කින් ගෙවීමට ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය එකඟ වෙමින් ඒ අනුව වාරික 4ක් ගෙවා ඇති බවද, අවසාන වාරිකය ගෙවා අවසන් කරන බවද නිලධාරීන් කාරක සභාවට දන්වා සිටින ලදි.

**(47) එන්.ඡ්. පෙරේරා මහතා**

**අංක 186 ඩී, ගොවිජනපදය, වතුපිටිවල**

**සීඔඑම්/පීපී/2011/921**

වතුපිටිවල මූලික රෝහලේ 1974 සිට අනියම් කම්කරුවකු වශයෙන් පෙත්සම්කරු සේවය කළ ද සේවයේ ස්ථිර කරන ලද 1988 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා පමණක් සේවය කළා සේ සලකා විශ්‍රාම වැටුප් ගණනය කර තිබීමෙන් ඉතා අඩු විශ්‍රාම වැටුපක් ලබන බැවින් එය නිවැරදි කර නිවැරදි විශ්‍රාම වැටුප සකස් කර දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත.

අනියම් සේවා කාලයෙන් 2/3 ක් විශ්‍රාම වැටුප ගණනය කිරීමේ කාර්යය සඳහා ගෙන නිවැරදි කර පරිවර්තිත පාරිතෝෂිකය හා සංශෝධිත විශ්‍රාම වැටුප ගෙවා ඇත.

**(48) එච්. එල්. විරංජිත් ලසන්ත මහතා**

**"සමන් සෙවන" කරුවලගස් පාර, වල්ගම, මාතර**

**සීඔඑම්/පීපී/2011/1101**

බාහිර ක්‍රියාකාරකම් ක්ෂේත්‍රයන්ගෙන් නිපුණතාවයක් දැක්වූ සිසුන්ට ප්‍රමුඛතාවයක් හිමිවන ක්‍රමයක් පැවැතිය බැවින් එකී කාණ්ඩය ඔස්සේ පෙත්සම්කරුටද විශ්ව විද්‍යාලයක පාඨමාලාවකට ඇතුළත් විය හැකි වුවද බාහිර ක්‍රියාකාරකම් යටතේ හිමිවිය යුතුව තිබූ ලකුණු නොලැබී යාමෙන් අසාධාරණයක් වූ බව පවසමින් පෙත්සම ඉදිරිපත් කර ඇත.

පෙත්සම්කරු 2010/2011 අධ්‍යයන වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ භෞතික විද්‍යා පාඨමාලාවට තෝරා ගෙන ඇත.

**(49) එම්.ටී. නිව්ටන් පෙරේරා මහතා**

**කටුදෙනිය, බෝපිටිය**

**සීඔඑම්/පීපී/2012/1432**

පන්නල, කටුදෙනිය, මුරුගම්පල වත්තෙහි "නෙම්" පුද්ගලික ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන ගල් කොරියක් හේතුවෙන් පළාත් වාසීන්ගේ දේපල හා ජීවිතවලට තර්ජනයක් එල්ලවී ඇති බව සඳහන් කරමින් එම ව්‍යාපෘතිය නවතාලීමට කටයුතු කර දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් වී ඇත.

මෙම ගැටළුව සම්බන්ධයෙන් අමාත්‍යාංශ වාර්තාව අනුව පෙත්සම්කරු ඇතුළු පිරිස ගොනු කරන ලද නඩුවකට අනුව කළු ගල් කැඩීම නතර කිරීමටත් ගල් ඇඹරීම සහ ගල් තාර සැකසීමේ කටයුතු පමණක් සිදු කිරීමටත් එම කටයුතු ද සති දෙකකට පමණක් සීමා කිරීමටත් අධිකරණය නියෝග කර ඇති බවත්, ව්‍යාපෘතියට ලබා දී තිබූ බලපත්‍රවල කාලය ඉකුත් වී තිබීම හේතුවෙන් සියලුම කටයුතු අත්හිටුවීමටත් කටයුතු කර ඇත. මේ සම්බන්ධයෙන් පෙත්සම්කරුගෙන් විමසීමේදී ප්‍රතිචාරයක් නොදැක්වූ බැවින් ඔවුන් අපේක්ෂා කළ පරිදි ව්‍යාපෘතියේ කටයුතු ඒ වන විටද නැවතී ඇති බවට නිගමනය කරමින් පෙත්සමේ කටයුතු අවසන් කරන ලදි.

(50) **එච්.වී. නන්දසිරි මහතා**

**දූවගොඩ, පොරවගම**

**සීඔඑම්/පීපී/2010/166**

පෝද්දල දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේ ස්ථිර කම්කරුවකු ලෙස සේවය කර ඇති පෙත්සම්කරු සොරකමක් සම්බන්ධයෙන් රිමාන්ඩ් කර සිටි අවස්ථාවේදී සේවය හැරගියා සේ සලකා ඇති බැවින් නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත.

පෙත්සම්කරුව නැවත සේවයේ පිහිටුවන ලෙස ලබා දී ඇති කාරක සභාවේ තීරණය ක්‍රියාත්මක කරන ලෙස කළ දැනුම්දීම අනුව පෙත්සම්කරුව නැවත සේවයේ පිහිටුවීමට කටයුතු කර ඇත.

**(51) ටී.එන්.ඩී.එස්. වීරක්කොඩි මහතා**

**අංක 08, පාර්ක් වීදිය, කොළඹ 05**

**සීඔඑම්/පීපී/2013/1850**

තම ත්‍රී රෝද රථය සඳහා සොරකිය රක්ෂණ ආවරණය ලබා තිබියදී තමාට හිමි රක්ෂණ හිමිකම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ලබා නොදීම නිසා රක්ෂණ මුදල, වන්දි හිමිකම හා අනෙක් සහනයන් ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත.

මෙම පෙත්සම අවසන්වරට කාරක සභාව විසින් විමර්ශනය කරන ලද අවස්ථාවේදී පෙත්සම්කරු සතුව වාහනය තිබූ බැවින් එය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට නීත්‍යානුකූලව පැවරීමට අවශ්‍ය කටයුතු සිදු කොට, පෙත්සම්කරුගේ අලාභය ලෙස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් තක්සේරු කොට ගෙවීමට තීරණය කොට ඇති රු. 125,000.00ක මුදල ලබා ගන්නා ලෙස පෙත්සම්කරුට දන්වා සිටින ලදි.

**(52) ජේ.එච්. සුමනසිරි මහතා**

**"සිරිසඳ", තලල්ල - දකුණ**

**සීඔඑම්/පීපී/2011/1013**

කුසලතාවය හා ජ්‍යෙෂ්ඨත්වය මත විදුහල්පති සේවයේ 1 පන්තියට උසස් කිරීම සඳහා පැවති සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි නමුත් අවශ්‍ය සුදුසුකම් සපුරා තිබියදී උසස්වීම ලබා නොදුන් බැවින් එය ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත.

පුරප්පාඩු පවතින බව නිරීක්ෂණය කළ කාරක සභාව පෙත්සම්කරු වෙත උසස්වීම ලබා දෙන ලෙස නිර්දේශ කර ඇති අතර ඒ අනුව ඔහුව විදුහල්පති සේවයේ 1 පන්තියට උසස් කිරීමට කටයුතු කර ඇත.

(53) **ආර්.ඒ.ටී. හරිස්චන්ද්‍ර මහතා**

**පොලිස් රිය පැදවීම් පාසල, ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලය, කළුතර**

**සීඔඑම්/පීපී/2014/2133**

ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ රිය පාසලට අනුයුක්තව රාජකාරි කරන උප පොලිස් පරීක්ෂකවරයෙක් වන පෙත්සම්කරු දැනට ආබාධිත තත්ත්වයේ පසුවන අතර 2000 වර්ෂයේ සිට 2007 වර්ෂය අතර කාලය තුළ එක් වැටුප් වර්ධකයක් සකස් කර නොතිබීමෙන් අසාධාරණයක් සිදුවූ බව පවසමින් තම වැටුප් වර්ධකය ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත.

මේ සම්බන්ධයෙන් නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයෙන් වාර්තාවක් කැඳවීමෙන් ලද වාර්තාව අනුව පෙත්සම්කරුගේ වැටුප් වර්ධකය සකස් කර හිඟ මුදල් සමග ගෙවීමට කටයුතු කර ඇත.

**(54) කේ. සී. මාතරආරච්චි මහතා**

**කොළවත්ත, වේයන්ගොඩ**

**සීඔඑම්/පීපී/2013/1630**

විදුලි අධිකාරිවරයකු ලෙස සේවය කළ පෙත්සම්කරුගේ රැකියාව අත්තනෝමතිකව අහිමි කරන ලද බැවින් රැකියාව නැවත ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත.

කාරක සභාව විසින් ලබා දුන් නිර්දේශය පරිදි පෙත්සම්කරුව නවක සේවකයකු ලෙස නැවත සේවයේ පිහිටුවා ඇත.

**(55) බී. වයි. එන්. පෙරේරා මහත්මිය**

**අංක 1508, කොට්ටාව, පන්නිපිටිය**

**සීඔඑම්/පීපී/2014/2204**

රිජ්වේ ආර්යා ළමා රෝහලෙහි හෙදියක ලෙස සේවය කළ පෙත්සම්කාරිය දරු ප්‍රසූතියෙන් පසු මුහුණපෑමට සිදුවූ ගැටළු රාශියක් හේතුවෙන් සේවයට වාර්තා කිරීමට නොහැකි වීම නිසා සේවය හැරයාමේ නියෝගයකට ලක්වූ බව සඳහන් කරමින් නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත.

පෙත්සම්කාරියව නව ප්‍රවේශකයකු ලෙස සේවයේ පිහිටුවා ඇති බව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කාරක සභාව දැනුවත් කර ඇත.

**(56) ඒ.එන්. රුවන්සිරි ද අල්විස් මහතා**

**අංක 658/15, තැන්නේවත්ත මාවත, ෆාම්ගාඩ්න්, රත්නපුර**

**සීඔඑම්/පීපී/2013/1683**

මැදගම කාර්මික විද්‍යාලයෙහි මුරකරු තනතුරෙහි සේවයෙහි යෙදී සිටියදී ලද ස්ථාන මාරුව නිසා මහත් අපහසුතාවයට පත්වූ බව සඳහන් කරමින් අසාධාරණ ලෙස ස්ථාන මාරු කිරීම නවතා තමාට ලැබිය යුතු උසස්වීම් ආදිය ලබාදී පහසු ස්ථානයක සේවයේ යෙදවීමට කටයුතු සලසන ලෙස ඉල්ලමින් පෙත්සම ඉදිරිපත් කර ඇත.

පවතින පුරප්පාඩු අනුව පෙත්සම්කරුට පහසු සේවා ස්ථානයක් ලබා දෙන ලෙස කාරක සභාවේදී එළඹී එකඟතාවය අනුව ඔහුව වරකාපොළ කාර්මික විද්‍යාලයට ස්ථාන මාරුව ලබා දී ඇත.

**(57) පී. එම්. වී. එල්. සමුද්‍රා දේවි බණ්ඩාරනායක මහත්මිය**

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාතලේ**

**සීඔඑම්/පීපී/2013/1618**

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරිනියක වන තමා පදනම් විරහිත චෝදනා පත්‍රයක් නිකුත් කර විනය නියෝගයක් නිකුත් කළ බවත් තමා පත්ව සිටි අසහනකාරී තත්ත්වය මත සේවයට වාර්තා නොකිරීම මත සේවය අතහැර ගියා සේ සලකා ඇති බැවින් නැවත සේවය ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත.

කාරක සභාව මෙය සානුකම්පිතව සලකා බලමින් ඇය අභියාචනයක් කරන්නේ නම් ඇයට සහන ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම මත පෙත්සම්කාරිය සේවය හැර ගිය දින සිට නැවත සේවයට වාර්තා කරන දින දක්වා වූ සේවයේ නොසිටි කාල සීමාව වැටුප් රහිත නිවාඩු සේ සලකා පෙත්සම්කාරියව නැවත සේවයේ පිහිටුවා ඇත.

**(58) ඩී.ටී. සුරාජ් කුමාර මහතා**

**"චමී", ගුණසේන ද සිල්වා මාවත, දිඹුල්දූව, කුලීගොඩ**

**සීඔඑම්/පීපී/2011/425**

කුලීගොඩ තැපැල් කාර්යාලයේ අනියම් සේවකයෙක් ලෙස සේවය කර ඇති පෙත්සම්කරු ආදේශ තැපැල්කරු තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට සූදානම්ව සිටියද, තම නමේ වරදක් හේතුවෙන් පෙනී සිටීමට නොහැකි වූ බැවින් අනියම් තැපැල්කරුවකු වශයෙන් සේවය කරන තමාට ආදේශක තැපැල්කරු තනතුර ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත.

ඒ අනුව පෙත්සම්කරු ඉල්ලා සිටි ලියාපදිංචි ආදේශකත්වය ඔහුට ලබා දීමට කටයුතු කර ඇත.

**(59) කේ. සිරිපාල මහතා**

**ඉහළ මොරවත්ත, රුවන්වැල්ල**

**සීඔඑම්/පීපී/2012/1235**

තමාගේ වසර 20 ක සේවා කාලයට හිමි පාරිතෝෂික මුදල වන රු. 172,500/= ක මුදලින් තමාට මේ වනවිට ගෙවා ඇත්තේ රු. 120,542.50ක් බව පවසා, එහි ඉතිරි මුදල් හා අධිභාරය තමා වෙත ලබාදෙන මෙන් ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත.

ගමනා ගමන මණ්ඩලය නියෝජනය කරමින් පැමිණි සිටි නිලධාරීන් පෙත්සම්කරුට හිමි පාරිතෝෂික මුදලේ ඉතිරිය හා අධිභාරය ලබාදී ඇති බව පවසමින් ඒ පිළිබඳව ලියවිලි කාරක සභාව වෙත ඉදිරිපත් කර සිටින ලදි.

**(60) ආර්.එම්. නිමල් කරුණාතිලක මහතා**

**අංක 122, සිංහගම, අළුත්ඔය, හිඟුරක්ගොඩ**

**සීඔඑම්/පීපී/2010/351**

අසනීපව සිටි තමාට සේවය හැරයාමේ නිවේදනය නිකුත් කර ඇති බවත්, තමාගේ හා තම පවුලේ අසරණ තත්ත්වය සලකා නැවත සේවය ලබාදෙන ලෙස ඉල්ලමින් පෙත්සම්කරු පෙත්සම ඉදිරිපත් කර ඇත.

මෙහිදී පෙත්සම්කරුගේ පෙර සේවය එතරම් යහපත් නොවූවද සානුකම්පිත පදනම මත ඔහුට ආදේශක පත්වීමක් ලබාදීමට අමාත්‍යාංශය එකඟවී ඇති අතර එම පත්වීම ලබාදෙන ලෙස කාරක සභාව දන්වා ඇති අතර ඒ අනුව පෙත්සම්කරුට ආදේශක කම්කරු පත්වීම ලබා දීමට කටයුතු කර ඇත.

**(61) එස්. කේ. ප්‍රේමරත්න මහතා**

**අංක 02, පිටවටරවුම් පාර, කිරිවැව අසල, පුත්තලම**

**සීඔඑම්/පීපී/2012/1139**

ඉසින යන්ත්‍ර ක්‍රියාකරු (ආදේශක පදනම මත) තනතුරට පත් තම තනතුර ස්ථිර කළ කිරීමෙන් පසු විදෙස් ගතවූ බවත්, නැවත පැමිණීමේදී තම රැකියාව සහ තමා රැස් කළ මුදල්ද අහිමි වූ බැවින් සේවයේ නොසිටි කාලය වැටුප් රහිත සේ සලකා නැවත සේවය ලබාදෙන ලෙස ඉල්ලා පෙත්සම්කරු පෙත්සම ඉදිරිපත් කර ඇත.

වයඹ ආණ්ඩුකාරතුමා විසින් පෙත්සම්කරුව නවක සේවකයෙකු ලෙස සේවයේ පිහිටුවා ඇති බව නිලධාරීන් පැවසූ අතර ඒ අනුව පෙත්සම්කරුගේ ඉල්ලීම ඉටු වී ඔහුට සහන ලැබී ඇත.

**(62) තන්ත්‍රිගේ පේමවතී රුබේරු මහත්මිය**

**"චන්ද්‍රලේඛා", ජඹුරලිය, මඩපාත**

**සීඔඑම්/පීපී/2011/604**

තම ස්වාමියා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යංශයේ ප්‍රාදේශීය සංවර්ධන නිලධාරයෙකු ලෙස සේවය කළ බවත්, අමාත්‍යංශයේ සිදුවූ මූල්‍යමය වංචාවක් සම්බන්ධව ඒක පාර්ශ්විකව පරීක්ෂණයක් පවත්වා තම ස්වාමියාගේ රැකියාව අහිමි කළ බවත් සඳහන් කරමින් තම ස්වාමියා මිය ගොස් ඇති බැවින් තමාට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත.

ඒ අනුව පෙත්සම්කාරියට හිමි වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප ගණනය කොට ගෙවීම් කටයුතු සඳහා කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමු කරන ලද බව සඳහන් කරමින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් කාරක සභාවට දන්වා ඇත.

(63) **යූ. වජිරානි වෙත්තසිංහ මහත්මිය**

**අංක 05, නිදහස් මාවත, 300 ජනපදය, පදවි පරාක්‍රමපුර**

**සීඔඑම්/පීපී/2013/1653**

විවිධ සේවා සහායකවරියක් ලෙස ලංකා බැංකුවේ වසර 8 ක් පමණ මහත් කැපවීමෙන් සේවය කළ තමාට එම කාලයේදී රු. 250/- ක දෛනික මුදලක් පමණක් ගෙවූ අතර 2010 වර්ෂයේදී අනියම් හා කොන්ත්‍රාත් සේවකයින්ගේ සේවය හේතුවකින් තොරව අත්හිටුවූ බැවින් තම සේවයද අත්හිටුවන ලද බව සඳහන් කරමින් නැවත සේවයේ පිහිටුවා සුදුසු තනතුරක සේවය ස්ථිර කර දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත.

මේ සම්බන්ධයෙන් කාරක සභාව විමසා වාර්තාවක් කැඳවීමේදී පෙත්සම්කාරිය ලංකා බැංකුවේ මාණ්ඩලික සහකාරවරියක වශයෙන් ස්ථිර සේවයට බඳවා ගන්නා ලද බවට මුදල් අමාත්‍යංශයේ අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මානව සම්පත් සංවර්ධන) විසින් දන්වා ඇත.

**(64) ජේ.එම්.ජයසුන්දර මහතා**

**අංක 453/5, මාකොළ දකුණ, මාකොළ**

**සීඔඑම්/පීපී/2010/110**

පෙත්සම්කරු තමන්ට උසස්වීම් නියමිත දිනට ලබා නොදුන් බැවින් උසස්වීම් නියමිත දිනට ලබා දෙන ලෙසත්, තම සේවා දිගුව අවසන් වීමට නියමිත දිනට තමා විශ්‍රාම ගන්වන ලෙසත්, තම හිඟ වැටුප් ලබා දෙන ලෙසත් ඉල්ලමින් පෙත්සම ඉදිරිපත් කර තිබුනි.

පෙත්සම පළමු වරට විමසිමින් සුදුසු නියෝගයක් ලබා දීම පිණිස කම්කරු කොමසාරිස් ජනරාල් වෙත යොමු කර ඇති අතර එතුමාගෙන් ලද වාර්තාව අනුව බේරුම්කරණයට යොමු කර ඇති අතර ඒ අනුව බේරුම්කරණ ප්‍රදානය වූ රු. 250,000/=ක මුදලට පාර්ශ්ව දෙකම එකඟ වී එම මුදල පෙත්සම්කරු වෙත ලබා දීමට කටයුතු කර ඇත.

**(65) එම්. ක්ලේරා පෙරේරා මෙනෙවිය**

**අංක 14, විල්ෆ්‍රඩ් මාවත, සිංහාරමුල්ල, කැළණිය**

**සීඔඑම්/පීපී/2013/1736**

තමා ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි තැන්පත් කළ මුදල වෙනුවෙන් පොළිය පමණක් වරින් වර ලබා ගත් බවත්, තැන්පත් මුදල ලබා ගැනීමට ගිය විට එය වරින් වර ලබා ගෙන ඇති බව බැංකුව විසින් සිදු කළ ප්‍රකාශය ප්‍රතික්ෂේප කරමින් තම තැන්පත් මුදල ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර තිබිණි.

පෙත්සම්කාරිය වරින් වර මුදල් ලබාගෙන ඇති බවට වූ නිලධාරීන්ගේ ප්‍රකාශය සනාථ කිරීම සඳහා ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කිරීමට ඔවුන්ට නොහැකි වූ බැවින් පෙත්සම්කාරිය වෙත සානුකම්පිත පදනම මත සහනයක් ලබා දෙන ලෙස වූ කාරක සභාවේ නිර්දේශය අනුව ඇයට රු. 100,000/- ක මුදලක් ගෙවීම සඳහා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා දීමට කටයුතු කර ඇත.

**(66) කේ.එම්.අයි. ශිරෝමණී මහත්මිය**

**"ඉඳුනිල්", රත්මලේ, මාතර**

**සීඔඑම්/පීපී/2013/1814**

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වසර 11ක සේවා කාලයක් ඇති පෙත්සම්කාරිය නොකළ වරදක් හේතුවෙන් වැඩ තහනමට ලක් වූ බවත් පසුව තම නිර්දෝෂී බව මත නැවත සේවයේ පිහිටවූ නමුත් වැඩ තහනම්ව සිටි කාලයට අදාළ වැටුප් නොලද බවත් අයදුම් කළ කිසිදු උසස්වීමක් ලබා නොදුන් බවත් පවසමින් ලැබිය යුතු වැටුප් හා දීමනා ලබා දෙන ලෙස ඉල්ලමින් පෙත්සම ඉදිරිපත් කර තිබිණි.

කාරක සභාව විසින් මෙම පෙත්සම විමර්ශනය කර පෙත්සම්කාරියට සාධාරණය ඉටු විය යුතු බැවින් වැඩ තහනම්ව සිටි කාලයට හිමි සියලු වැටුප් හා වරප්‍රසාද ඇය වෙත ලබා දෙන ලෙස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට කාරක සභාව ලබා දුන් උපදෙස් පරිදි වැඩ තහනම්ව සිටි කාලයට අදාළ නොගෙවූ වැටුප් ගෙවීමටත් මෙම කාලයට අදාළ දායක මුදල් අදාළ අරමුදල් වෙත බැර කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

**(67) එම්.එල්.එස්. ජිනදාස මහතා**

**කොස්හේන, බඩල්ගම**

**සීඔඑම්/පීපී/2013/1656**

මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරියෙකු වශයෙන් සේවය කළ පෙත්සම්කරුව පසුව වයඹ පළාත් සභාවට අනුයුක්ත කළ අතර ඔහුගේ සේවාව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අන්තර්ග්‍රහණය කිරීමේදී විශ්‍රේෂ ශ්‍රේණියට පත්කළ යුතුව තිබුණ බැවින් විශේෂ ශ්‍රේණිය හා අදාළ වැටුප් තලය ලබාදෙන ලෙස පෙත්සම ඉදිරිපත් කර තිබිණි.

පෙත්සම ඉදිරිපත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස තමා අපේක්ෂා කරන සහනය ලබාදීම සඳහා වයඹ පළාත් සභාවේ නිලධාරීන් පියවර ගෙන ඇති බව දැනුම් දෙමින් පෙත්සම්කරු විසින් කාරක සභාව වෙත දන්වා සිටීමට කටයුතු කර ඇත.

**(68) ජී.ඩබ්ලිව්.ඒ. සුජාතා විජේසිංහ මහත්මිය**

**අංක 16, රුවන්පාය, කිතුලාව, කළුතර දකුණ**

**සීඔඑම්/පීපී/2011/943**

1979 වර්ෂයේදී උපගුරුවරියක ලෙස සේවයට එක්වී ඇති පෙත්සම්කාරිය 2008.01.01 දින සිට විදුහල්පති 2-1 ශ්‍රේණියට උසස්වීම් ලද බවත් තමා 2002 වසරේදී ලද ගුරු සේවයේ 1 ශ්‍රේණියේ උසස්වීම 2005/04 චක්‍රලේඛයට අනුව නිවැරදි නොවන බවත් තම උසස්වීමට අදාළ වැටුප මේ වනවිටද ලබා දී නොතිබීම තුළින් අසාධාරණයක් සිදුවූ බව ප්‍රකාශ කරමින් තම උසස්වීමට අදාළ වැටුප ලබා දෙන ලෙස ඉල්ලමින් පෙත්සම්කාරිය පෙත්සම ඉදිරිපත් කර තිබිණි.

පෙත්සම විමර්ශනය කරන ලද අවස්ථාවේදී පෙත්සම්කාරියගේ වැටුප අඩු කිරීමට පදනම්ව ඇත්තේ ගුරු සේවයේ ශේෂ කාලය විදුහල්පති සේවය සඳහා අදාළ කර ගත නොහැකිය යන හේතුවෙන් බව නිලධාරින් ප්‍රකාශ කර සිටියද, එය සාධාරණ තර්කයක් නොවන බව නිරීක්ෂණය කළ කාරක සභාව පෙත්සම්කාරියගේ වැටුප නිවැරදි කර හිඟ වැටුප් සමග ගෙවීම් කරන ලෙස අදාළ පාර්ශව වෙත දුන් උපදෙස් අනුව කටයුතු කර ඇත.

**(69) ශීලා රම්මුනි මහත්මිය**

**අංක 266 ඩී, දිබ්බැද්ද, පානදුර**

**සීඔඑම්/පීපී/2012/1194**

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්තව ලිපිකාරිනියක් ලෙස සේවය කර ඇති පෙත්සම්කාරිය අනුමත නිවාඩු මත විදේශගත වී ඇති අතර ඒ වනවිට පැවති ගල්ෆ් යුද්ධය හේතුවෙන් සේවයට වාර්තා කිරීමට නොහැකිව යුධමය තත්ත්වය අවසන් වීමෙන් පසු නැවත ලංකාවට පැමිණියද, තමා සේවය අතහැර ගියා සේ සලකා කටයුතු සිදු කර ඇති බව පවසමින් වසර 19ක තම සේවා කාලය සලකා විශ්‍රාම වැටුප ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර තිබිණි.

පෙත්සම්කාරියට නියමිත කාලය තුළදී නැවත ලංකාවට පැමිණීමට නොහැකිව ඇත්තේ ඇයගේ පාලනයෙන් තොර සිදු වූ ක්‍රියාවක් හේතුවෙන් බැවින් ඇයව නැවත සේවයේ පිහිටුවීමට ඉදිරිපත් කළ නිර්දේශය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව පෙත්සම්කාරිය වෙත නිකුත් කර ඇති තනතුර හැරයාමේ නිවේදනය ඉවත් කර කොන්දේසි 4කට යටත්ව ඇයව නැවත සේවයේ පිහිටුවීමට කටයුතු කර ඇත.

**(70) වයි.ආර්. ජීවනී වාසනා මහත්මිය**

**"සමන් සෙවන", ඩබ්ලිව් 4 වගාව, වනාතවිල්ලුව, පුත්තලම**

**සීඔඑම්/පීපී/2012/1190**

1998.09.23 වන දින සිට ස්වේච්ඡා ගුරුවරියක ලෙස සේවය කරන බවත් 2005 දී ස්වේච්ඡා ගුරුවරුන් සඳහා පත්වීම් ලබා දීමට පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයට අවශ්‍ය සුදුසුකම් සමග සහභාගි වූ නමුත් එයින් තේරී පත්වූවන්ගේ නාම ලේඛනයේ තම නම ඇතුළත් නොවීමෙන් අවශ්‍ය සුදුසුකම් සපුරා තිබූ තමාට අසාධාරණයක් වී ඇතැයි පවසමින් ගුරු සහායක පත්වීමක් ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර තිබිණි.

පෙත්සම්කාරිය තම සේවා කාලය සනාථ කරමින් ඉදිරිපත් කරන ලද ලේඛන සලකා බැලූ කාරක සභාව එකී ලේඛනවල නිරවද්‍යතාවය පරීක්ෂා කර බලා පෙත්සම්කාරියට ගුරු සහායක පත්වීමක් ලබා දිමට සුදුසුකම් ලබයි නම් එම පත්වීම ලබා දීමට කටයුතු කරන ලෙස වූ නිර්දේශය අනුව ඇයට ගුරු සහායක පත්වීම ලබා දීමට කටයුතු කර ඇත.

**(71) ඩබ්ලිව්. කේ. උපාලි කුලරත්න මහතා**

**අංක 03, කාංචනාපුරය, කුලියාපිටිය**

**සීඕඑම්/පීපී/2014/2080**

තම අර්ථ සාධක අරමුදල වංචා කිරීම/පැහැර හැරීමක්/සාවද්‍ය ගණනය කිරීම නිසා ඉන් තමාට අසාධාරණයක් සිදුවූ බව සඳහන් කරමින් පෙත්සම්කරු පෙත්සම ඉදිරිපත් කර තිබුණි.

පෙත්සම විමර්ශනය කළ අවස්ථාවේදී මහ බැංකුවේ නිලධාරීන් විසින් පැවසූ පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථ සාධක අරමුදල විසින් කම්කරු කොමසාරිස් විසින් එවනු ලබන ප්‍රතිලාභ ගෙවීම් කළ යුතු බවට වන තීරණ ලිපිය ප්‍රකාර, අදාළ තොරතුරු තහවුරු කර ගැනීමෙන් පසු පෙත්සම්කරුට නීත්‍යානුකූලව හිමිවිය යුතු ප්‍රතිලාභ ඔහු වෙත ලබා දීමට කටයුතු කර ඇත.

**(72) ආර්.ආර්.එස්. ගමගේ මහතා**

**අංක 48/1, මන්ඩාඩුව, වීරකැටිය**

**සීඕඑම්/පීපී/2011/901**

පොලිස් සේවයේ නියුතු පෙත්සම්කරු සම්බන්ධයෙන් විභාග වෙමින් පැවති නඩුවක් හේතුවෙන් තමාට හිමි උසස්වීම නවතා තිබූ බවත්, තමා අඩ වැටුප් යටතේ සේවය කළ බව හා වැටුප් වර්ධක ලබා නොදුන් බවත් විශ්‍රාම ගැනීමෙන් පසු තමාට එරෙහිව පවරා තිබූ නඩුවෙන් නිදොස් කොට නිදහස් වුවද විශ්‍රාම වැටුප ලබානොදුන් බව පවසා පෙත්සම ඉදිරිපත් කොට තිබුණි.

කාරක සභාව ලබා දුන් නිර්දේශය අනුව පෙත්සම්කරුට අදාළ වැටුප් වර්ධක සමඟ සංශෝධිත වැටුපට අදාළ හිඟ වැටුප් හා විශ්‍රාම වැටුප් ලබා දීමට කටයුතු කර ඇත.

**(73) එස්.ඩී. නන්දසේන මහතා**

**අඩප්පාගොඩවත්ත, මහහැගොඩ, බූස්ස**

**සීඕඑම්/පීපී/2010/246**

පෙත්සම්කරුට අයත් ඉඩමක් හරහා ඔහුට අයත් ගොඩනැගිල්ලක් ද කඩා දමා පෞද්ගලික පාරක් තැනීමට කටයුතු යොදා ඇති බව පවසමින් එය නවතා දෙන ලෙස ඉල්ලා පෙත්සම්කරු පෙත්සම ඉදිරිපත් කර තිබුණි.

පෙත්සම්කරුගේ ඉඩම මතින් පාරක් සඳහා ගම්වාසීන්ට ප්‍රවේශන අයිතියක් නැති බැවින් පවරාගත් එම ඉඩම අවසතු කරන ලෙසත්, ප්‍රදේශවාසීන්ට විකල්ප මාර්ගයක් මාස 3ක් තුල ඉක්මනින් සාදා දෙන ලෙසත් වූ කාරක සභාවේ නිර්දේශය අනුව පෙත්සම්කරුගේ ගැටළුව විසඳීමට කටයුතු කර ඇත.

**(74) එම්. පරමේෂ්වරන් මහතා**

**අංක 10, පඩුකඩ්ඩාර් පාර, නවට්කුඩාර්, මඩකලපුව**

**සීඔඑම්/පීපී/2012/1109**

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ උතුරු නැගෙනහිර වෙරළබඩ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතියේ සේවය අදාළ කර නොගැනීම නිසා කෘෂිකර්ම සේවයේ III ශ්‍රේණියට වන උසස්වීම අහිමි වූ බැවින් එය ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර තිබිණි.

මෙම පෙත්සම විමර්ශනය කළ කාරක සභාව පෙත්සම්කරුට අසාධාරණයක් වී ඇති බව නිරීක්ෂණය කර සෙසු අයදුම්කරුවන්ට උසස්වීම ලබා දුන් දින සිට උසස්වීම ලබා දෙන ලෙස කළ නිර්දේශය පරිදි උසස්වීම ලබා දීමට කටයුතු කර ඇත.

**(75) ආර්.පී. චන්ද්‍රපාල මහතා**

**රජයේ වී ගොවිපළ, අම්බලන්තොට**

**සීඔඑම්/පීපී/2011/727**

පෙත්සම්කරු අම්බලන්තොට රජයේ වී ගොවිපළේ අනියම් හා කොන්ත්‍රාත් පදනම මත සේවය කළ ද තමාගේ සේවය ස්ථිර නොකළ නමුත් දින 2571ක් සේවය කර ඇති සේවකයන් ස්ථිර කර ඇති බැවින් තමාගේ සේවයද ස්ථිර කර දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර තිබිණි.

මේ සම්බන්ධයෙන් සලකා බලන ලද අමාත්‍යාංශය කාරක සභාවේ නිර්දේශයද සලකා පෙත්සම්කරු කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති දින ගණන් අනුපිළිවෙළ අනුව දින 2719ක් සේවය කර ඇති බැවින් සුදුසුකම් සපුරන අවස්ථාවේදී පෙත්සම්කරු සේවයේ ස්ථිර කරන බව කළ දැනුම්දීම අනුව සේවයේ ස්ථිර කර ඇති බව පෙත්සම්කරු කාරක සභාවට දන්වා සිටින ලදි.

**(76) ටී.ඒ.ජී. සරත් පෙරේරා මහතා**

**අංක 681/30, කේ.ජේ. පීරිස් මාවත, නුවර පාර, කැළණිය.**

**සීඔඑම්/පීපී/2010/44**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පද්ධති විශ්ලේෂක/ වැඩසටහන් සම්පාදක ලෙස සේවය කරන පෙත්සම්කරු නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට උසස්වීම් ලබාදෙන මෙන් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර තිබුනි.

මේ සම්බන්ධයෙන් ලබා දුන් කාරක සභාවේ තීරණය පරිදි පෙත්සම්කරුට අධිසේවක පදනම මත නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර ලබා දීමට කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු ඇති කිරීමට ලබාදුන් අනුමැතිය මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අධිසේවක පදනම මත පෙත්සම්කරු සඳහා උසස්වීම් ලබාදී ඇත.

**(77) ඩබ්ලිව්.එච්.පී.ඩබ්. වීරසිරි මහතා**

**අංක 135/6, අරලිය මාවත, මැලෑගම, වාද්දුව**

**සීඔඑම්/පීපී/2010/45**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සේවය කරන ජ්‍යෝෂ්ඨ පද්ධති විශ්ලේෂක/වැඩසටහන් සම්පාදක ලෙස සේවය කරන පෙත්සම්කරු නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට උසස්වීම් ලබාදෙන මෙන් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර තිබුනි.

මේ සම්බන්ධයෙන් ලබා දුන් කාරක සභාවේ තීරණය පරිදි පෙත්සම්කරුට අධිසේවක පදනම මත නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර ලබා දීමට කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු ඇති කිරීමට ලබාදුන් අනුමැතිය මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අධිසේවක පදනම මත පෙත්සම්කරු සඳහා උසස්වීම් ලබාදී ඇත.

**(78) අයි.ඒ.එම්. ප්‍රනාන්දු මහත්මිය**

**අංක 27, පිලීෂියා මාවත, හපුගොඩ, කඳාන**

**සීඔඑම්/පීපී/2010/46**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සේවය කරන ජ්‍යෝෂ්ඨ පද්ධති විශ්ලේෂක/වැඩසටහන් සම්පාදකව ලෙස සේවය කරන පෙත්සම්කරු නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට උසස්වීම් ලබාදෙන මෙන් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර තිබුනි.

මේ සම්බන්ධයෙන් ලබා දුන් කාරක සභාවේ තීරණය පරිදි උක්ත පෙත්සම්කරුට අධිසේවක පදනම මත නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර ලබාදීමට කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු ඇති කිරීමට ලබාදුන් අනුමැතිය මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අධිසේවක පදනම මත පෙත්සම්කාරිය සඳහා උසස්වීම් ලබාදී ඇත.

**(79) පී.එම්.ආර්. ප්‍රනාන්දු මහතා**

**අංක 291/C, සමගි මාවත, කොස්වත්ත, තලංගම**

**සීඔඑම්/පීපී/2010/47**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සේවය කරන ජ්‍යෝෂ්ඨ පද්ධති විශ්ලේෂක/වැඩසටහන් සම්පාදකව ලෙස සේවය කරන පෙත්සම්කරු නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට උසස්වීම් ලබාදෙන මෙන් ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර තිබුනි.

මේ සම්බන්ධයෙන් ලබා දුන් කාරක සභාවේ තීරණය පරිදි උක්ත පෙත්සම්කරුට අධිසේවක පදනම මත නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර ලබා දීමට කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු ඇති කිරීමට ලබාදුන් අනුමැතිය මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අධිසේවක පදනම මත පෙත්සම්කාරිය සඳහා උසස්වීම් ලබාදී ඇත.

**(80) ඩබ්ලිව්.වී.එෆ්. විජේවීර මහතා**

**අංක 45, ග්‍රාමීය මධ්‍යස්ථානය, මොරකැටිය, ඇඹිලිපිටිය**

**සීඔඑම්/පීපී/2011/639**

ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ වසර 22ක සේවා කාලයට ලංකා විදුලිබල මණ්ඩලයේ සේවා කාලයද එකතු කර පෙත්සම්කරුට විශ්‍රාම වැටුප ගෙවන ලෙස ඉල්ලමින් පෙත්සම ඉදිරිපත් කර තිබිණි.

මෙම පෙත්සම කාරක සභාව විසින් විමර්ශනය කර ඇති අතර එහිදී පෙත්සම්කරුගේ සේවා කාලයන් 2 එකතු කර ඔහුට විශ්‍රාම වැටුප ලබා දෙන ලෙස කාරක සභාව විසින් ලබා දුන් නිර්දේශය පරිදි පෙත්සම්කරුට විශ්‍රාම වැටුප ලබා දී ඇත.

**(81) ලසන් ප්‍රදීප් හෙට්ටිවත්ත මහතා**

**අංක 394/6, දංගෙදර, ගාල්ල.**

**සීඔඑම්/පීපී/2011/437**

ගින්නෙන් විනාශ වූ තමාගේ ආසන 40කින් යුත් ගාල්ල-කොළඹ සුඛෝපභෝගී බස් රථය වෙනුවට ආසන 29කින් යුත් සුඛෝපභෝගී බස් රථයක් ධාවනයේ යෙදවීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවෙන් අවසර ඉල්ලා සිටියද එය නොලැබුණු බැවින් ගාල්ල-කොළඹ ධාවනයට ආසන 42කින් යුත් බස් රථයක් ධාවනයේ යෙදවීමට අවසර ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර තිබුණි.

පෙත්සම්කරුට නව බස් රථයක් යෙදවීම සඳහා ගමනාගමන කොමිෂන් සභාවෙන් ලබා දුන් බලපත්‍රයේ වලංගු කාලය ඉක්මවා ඇති නමුත් කාරක සභාව ලබා දුන් නිර්දේශය අනුව මගී සේවා අවසර පත්‍රය වලංගු කිරීමට නිලධාරීන් කටයුතු කර ඇති අතර ඒ අනුව බස්රථ ආදේශනය සිදු කර ඇති අතර ප්‍රමාද ගාස්තු ලෙස වූ දඩ මුදල වාරික 10කින් අයකර ගැනීමට කටයුතු කර ඇත.

**(82) මේජර් එස්.එස්.යූ. හෙට්ටිආරච්චි මහතා**

**12 විජයබා රෙජිමේන්තුව, අංක 05, වැකුණගොඩ, ගාල්ල**

**සීඔඑම්/පීපී/2012/1298**

ආබාධිත හමුදා නිලධාරියෙකු වන තමාට සාවද්‍ය චෝදනාවක් මත නඩු පැවරීම නිසා තමාට හිමිවීමට තිබූ උසස්වීම් නොලද බවත් වෛද්‍ය මණ්ඩලයට යොමු කිරීමේ ප්‍රමාදය හේතුවෙන් විශ්‍රාම වැටුපක් නොලබන බවත් පවසමින් නිල උසස්වීම හා විශ්‍රාම වැටුප ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර තිබිණි.

මෙම පෙත්සම සම්බන්ධයෙන් කාරක සභාව විසින් අමාත්‍යාංශයෙන් වාර්තාවක් කැඳවීමේදී පෙත්සම්කරුගේ අයහපත් විනය වාර්තා හේතුවෙන් උසස්වීම් ලබා දිය නොහැකි බවත්, ඔහුව වෛද්‍ය මණ්ඩලයට යොමු කිරීමෙන් පසු එහි නිර්දේශය අනුව ඔහුට විශ්‍රාම වැටුප් හිමිකම ලබා දී ඇති බවත් කාරක සභාව නිරීක්ෂණය කරන ලදි.

## 17. පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් විසින් නිර්දේශ කර සහන ලැබී ඇති පෙත්සම්

(1) **ඩී.එම්. අබේරත්න මහතා**

**කරවිලකැටිය, අරාව, බදුල්ල**

**සීඔඑම්/පීපී/2010/213**

ලංකා විදුලිබල මණ්ඩලය මඟින් ආඳාඋල්පත- මීගහකිවුල අධිසැර විදුලි රැහැන් මාර්ගය ඇදීම නිසා තමා වගා කළ ගම්මිරිස් වගාවට විශාල හානියක් සිදු වූ බැවින් ඒ සඳහා ලං.වි.බ. මණ්ඩලයෙන් ලැබුණු මුදල ප්‍රමාණවත් නොවූ බැවින් මෙම පෙත්සම්කරු සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවෙන් තක්සේරුවක් ලබා ගත්ත ද එය විදුලිබල මණ්ඩලය පිළිනොගත් බැවින් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරුවක් ලබා ගත්ත ද එය ද ප්‍රතික්ෂේප කර ඇති බැවින් තම බෝග වගාවට වූ හානියට සාධාරණ වන්දි මුදලක් ලබා දෙන ලෙස ඉල්ලමින් පෙත්සම්කරු මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත.

මෙම පෙත්සම පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් වෙත යොමු කිරීමෙන් අනතුරුව ලැබී ඇති නිර්දේශය ක්‍රියාත්මක කරන ලෙස කාරක සභාව දන්වා ඇති අතර ඒ අනුව රු.36,000/ක මුදලක් පෙත්සම්කරුට ලබා දීමට කටයුතු කර ඇත.

**(2) ඊ.එම්.චන්ද්‍රදාස බණ්ඩා මහතා**

**ඩී 20 ඇල, ආර්.බී. 01, හිඟුරක්ගොඩ**

**සීඔඑම්/පීපී/2010/352**

කෘෂිකර්ම සංවර්ධන අධිකාරියේ ස්ථිර රියදුරකු ලෙස සේවය කරන ලද පෙත්සම්කරු එම අධිකාරිය වසා දැමීමෙන් පසු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන ලද බවත් එසේවුවද තමාට වැටුප් වර්ධක හෝ රැකියාවේ ස්ථිර තත්ත්වයක් ලබා දී නැති බවත් සඳහන් කරමින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ස්ථිර රියදුරු සේවයට අන්තර්ග්‍රහණය කරන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත.

මෙම පෙත්සම පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් වෙත යොමු කිරීමෙන් අනතුරුව ලැබී ඇති නිර්දේශය අනුව කෘෂිකර්ම අමාත්‍යාංශයේ තනතුරු අහෝසිවීමේ පදනම මත දෙපාර්තමේන්තුගත රියදුරු තනතුරු දෙකක් අනුමත වී ඇති අතර, පෙත්සම්කරුට කෘෂිකර්ම දෙපාර්තමේන්තුගත රියදුරු තනතුර ලැබී ඇති බව ඔහුගෙන්ද දුරකථනයෙන් විමසා තහවුරු කරගැනීමෙන් අනතුරුව පෙත්සම්කරුට සහන ලැබී ඇති බැවින් පෙත්සමේ කටයුතු අවසන් කර ඇත.

**(3) ඒ.කේ.ඩී.එන්. සුමනසිංහ මහතා**

**අංක 16, ගැමුණු මාවත, කනුවන, කුරුඳුවත්ත, ඒකල**

**සීඹඑම්/පීපී/2013/2000**

කොළඹ මහ නගර සභාවේ තාක්ෂණ සේවා නිලධාරි තනතුරේ ස්ථිර සේවකයකු වූ තමාගේ සේවය චෝදනා ඉදිරිපත් නොකොට සහ ඒ පිළිබඳ විමර්ශනයක් නොපවත්වා අසාධාරණ ලෙස තහනම් කර ඇති බැවින් සියළු දීමනා සහිතව නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලමින් පෙත්සම ඉදිරිපත් කර ඇත.

මෙම පෙත්සම පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් වෙත යොමු කිරීමෙන් අනතුරුව ලැබී ඇති නිර්දේශය අනුව මේ සම්බන්ධයෙන් 2013.11.04 දිනැතිව පෙත්සම්කරු සේවයේ පිහිටුවා ඇති බව තමා වෙත දන්වා ඇති බව කාරක සභාවේ විමසුමට පිළිතුරු දෙමින් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් විසින් වාර්තා කර ඇත.

## 18. <u>කාරක සභාව විසින් සහන සලසා නොදුන් අවස්ථා කිහිපයක්</u>

මෙම කාල සීමාව තුල පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් වූ පෙත්සම් අතුරින් යම් ප්‍රමාණයක් පහත සඳහන් විවිධ හේතූන් මත ප්‍රතික්ෂේප වී ඇති අතර ඒවාට උදාහරණද සමඟ පහත දක්වා ඇත.

**(1) දිගින් දිගටම අයහපත් සේවා වාර්තා සහිත පෙත්සම්කරු නැවත සේවයේ පිහිටුවන ලෙස කල ඉල්ලීම්**

**වී. රත්නසිරි පෙරේරා මහතා - පෙත්සම් අංක සීඹඑම්/පීපී/2011/649**

අයහපත් පැමිණීමේ වාර්තා හේතුවෙන් පෙත්සම්කරුගේ **පරිවාස** කාලය දීර්ඝ කර ඇති අතර, වරින් වර සේවය අතහැර ගොස් එකිනෙකට පරස්පර හේතු දක්වමින් නැවත සේවය ඉල්ලා අභියාචනය කර ඇති නමුත්, නැවත සේවයේ පිහිටුවා පෙත්සම්කරුට සහන ලබාදීමට ප්‍රතිපාදන නොමැති බැවින් කාරක සභාව මෙම පෙත්සම නිෂ්ප්‍රභ කරන ලදි.

**(2) ආයතනය තුල පවතින නීති රාමුව අනුව සහන සලසා දිය නොහැකි අවස්ථා**

**විමලා කුමාරිහාමි මහත්මිය - පෙත්සම් අංක සීඹඑම්/පීපී/2012/1123**

පෙත්සම්කාරිය විදුලිබල මණ්ඩලයට අන්තර්ග්‍රහණය කිරීමට පෙර තැපැල් දෙපාර්තමේන්තුවේ ආදේශිකාවක් ලෙස හා පළාත් පාලන සේවයේ ලිපිකාරිනියක් ලෙස සේවය කර තිබුණ ද ඇය විදුලිබල මණ්ඩලයට අන්තර්ග්‍රහණය කිරීමේ දී නවක සේවිකාවක් ලෙස බඳවාගෙන ඇත.

විදුලිබල මණ්ඩලයේ සේවය කර ඇත්තේ වසර 16 මාස 03ක් පමණ වන අතර පාර්ලිමේන්තු පනතකින් පාලනය වන විදුලිබල මණ්ඩලයේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලැබීමට වසර 20ක මණ්ඩලීය සේවා කාලයක් අවශ්‍ය බැවින් පෙත්සම්කාරියට විශ්‍රාම වැටුප ලබාදීමට කාරක සභාවට ප්‍රතිපාදන නොමැති බැවින් පෙත්සම නිෂ්ප්‍රභ කරන ලදි.

**එච්. එම්. රාජා ධර්මවීර මහතා - පෙත්සම් අංක සීඔඑම්/පීපී/2011/560**

පෙත්සම්කරු සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ස්ථිර සාමාන්‍ය කම්කරුවෙකු ලෙස සේවය කළ අතර අසනීප තත්ත්වය මත සේවයට වාර්තා කිරීමට නොහැකි වීම හේතුවෙන් සේවය හැරගියා සේ සලකා ඇති බැවින් නැවත සේවය හෝ විශ්‍රාම වැටුප ලබා දෙන ලෙස ඉල්ලා සිටියි.

1975.02.15 වන දින කම්කරු තනතුරට පත් කර ඇති පෙත්සම්කරු තනතුර හැරගියා සේ සලකන දින වන විට වසර 10ක් සම්පූර්ණ කර නැති බැවින් ඔහු වෙත සහන සැලසීමට ප්‍රතිපාදන කාරක සභාවට නොමැති බැවින් පෙත්සම නිෂ්ප්‍රභ කරන ලදි.

**(3) රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය යන ආයතන දෙකෙන්ම ප්‍රතික්ෂේප වී අපේක්ෂිත සහනය ලබාදීමට නීතිමය ප්‍රතිපාදන නොමැති වීම**

**ආචාර්ය ඩබ්ලිව්. එල්. ඩී. එස්. ජී. පෙරේරා මහතා - සීඔඑම්/පීපී/2011/775**

ගුරු අධ්‍යාපනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් ලෙස සේවය කර ඇති පෙත්සම්කරු සේවා ස්ථානයෙන් විධිමත් පරිදි මුදා හැරීම සඳහා ඉල්ලුම් කර විවෘත විශ්වවිද්‍යාලයේ සේවය කරමින් සිටියදී සේවය හැරගියා සේ සලකා රැකියාව අහිමි කල බැවින් සාධාරණයක් ඉටු කර දෙන ලෙස පෙත්සම්කරු ඉල්ලා ඇත.

ගුරු අධ්‍යාපන සේවා ව්‍යවස්ථාවට පටහැනිව පෙත්සම්කරු කටයුතු කර තිබීමද, රාජ්‍ය සේවා කොමිසම විසින් සහන ලබා නොදෙමින් ප්‍රතික්ෂේප කර ඇති ඔහුගේ අභියාචනය පරිපාලන විනිශ්චය අධිකාරිය ප්‍රතික්ෂේප කර තිබීමද, ඔහු ගොනු කර ඇති පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණයේ නිෂ්ප්‍රභ කිරීමද යන කරුණු සැලකූ කාරක සභාව ඉහත ආයතන ලබා දුන් තීරණයට වඩා වෙනස් තීරණයක් පෙත්සම්කරුට ලබා දීමට මෙම කාරක සභාවට නොහැකි බැවින් පෙත්සම නිෂ්ප්‍රභ කරන ලදි.

**(4) පෙත්සම්කරුට අසාධාරණයක් සිදු වී නොමැති බැවින් සහන සලසා දීමට නොහැකි අවස්ථා**

**එම්. චන්ද්‍රන් මහතා - සීඔඑම්/පීපී/2011/845**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/91 හා ජ්‍යෙෂ්ඨ ලැයිස්තුවට අනුකූලව තමන්ට හිමිවිය යුතු රජයේ සෞඛ්‍ය පරීක්ෂක පළමු ශ්‍රේණියට අදාළ උසස්වීම ලබා දෙන ලෙස පෙත්සම්කරු ඉල්ලා ඇත.

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය අසමත්ව 1 පන්තිය හිමිනොවූ පෙත්සම්කරුට වඩා වැඩි ජ්‍යෙෂ්ඨත්වයක් ඇති නිලධාරීන් සිටින බවද, පෙත්සම්කරුට තම උසස්වීම ලබා ගැනීමට අවශ්‍ය වන සාධක නොසැපිරීම මත උසස්වීම නොලැබී ඇති බවද, ඒ අනුව ඔහුට අසාධාරණයක් වී නොමැති බව ද නිරීක්ෂණය කළ කාරක සභාව පෙත්සම නිෂ්ප්‍රභ කරන ලදි.

**(5) පෙත්සම්කරු තම අදහස් නොදැක්වීම හා පෙත්සම කෙරෙහි ඔහුගේ උනන්දුවක් නොමැති බව**

**නාවුලගේ රංජිත් මහතා - සීඔඑම්/පීපී/2011/709**

මෙම පෙත්සම සම්බන්ධයෙන් ප්‍රවාහන අමාත්‍යාංශයෙන් කැඳවූ වාර්තාව පෙත්සම්කරු වෙත ඔහුගේ අදහස් දැන ගැනීම පිණිස යවා ඇත ද ඔහු එයට පිළිතුරක් එවා නොතිබීම මත පෙත්සම පිළිබඳ පෙත්සම්කරුගේ උනන්දුවක් නොමැති බවට තීරණය කළ කාරක සභාව පෙත්සම නිෂ්ප්‍රභ කරන ලදි.

**19. <u>අටවන පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරයේ 2015.09.01 සිට 2016.08.31 දක්වා කාල සීමාව තුළ විමර්ශනය කළ පෙත්සම් පිළිබඳ සාරාංශය</u>**

(අ) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව ලද පෙත්සම් පිළිබඳ සාරාංශයක්

| | | |
|---|---|---|
| 1 | මහජන පෙත්සම් කාරක සභාවට ලැබුණු පෙත්සම් සංඛ්‍යාව | 1406 |
| 2 | ස්ථාවර නියෝගවලට අනුකූල නොවූ බැවින් කාරක සභාව විසින් ප්‍රතික්ෂේප කළ පෙත්සම් සංඛ්‍යාව | 377 |
| 3 | පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඉදිරි කටයුතු කළ පෙත්සම් සංඛ්‍යාව | 1029 |
| 4 | ඔම්බුඩ්ස්මන් වෙත යොමු කළ පෙත්සම් සංඛ්‍යාව | 32 |
| 5 | කාරක සභාව පැවැත්වූ වාර ගණන | 14 |
| 6 | කාරක සභාව සාකච්ඡාවට ගත් පෙත්සම් | 123 |
| 7 | සහන ලැබූ පෙත්සම්කරුවන් සංඛ්‍යාව | 08 |
| 8 | කාරක සභාවේ මූලික විමර්ශනයෙන් පසුව සහන ලබාදීමට නොහැකි බව තීරණය කර, නිෂ්ප්‍රභ කළ පෙත්සම් සංඛ්‍යාව | 31 |

(ආ) ලබා දුන් සහන අනුව සාරාංශය

| | අදාළ අමාත්‍යාංශය හා ගොනු අංකය | සහන ලැබී ඇති පෙත්සම් |
|---|---|---|
| 1. නැවත සේවයේ පිහිටුවීම | | 1 |
| | වරාය හා නාවික කටයුතු - (162) | |
| 2. උසස්වීම ලබා දීම | | 1 |
| | කෘෂිකර්ම - (216) | |
| 3. ස්ථාන මාරු අවලංගු කිරීම | | 1 |
| | පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය - (520) | |
| 4. ඉඩම් හා දේපළ ආරවුල් නිරාකරණය කිරීම | | 2 |
| | රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන - (314) | |
| | ඉඩම් - (34) | |
| 5. ශිෂ්‍යාධාර ලබා දීම | | 1 |
| | උසස් අධ්‍යාපන හා මහාමාර්ග - (185) | |
| 6. ලැබිය යුතු තනතුරෙහි පිහිටුවා වැටුප් වර්ධක ලබා දීම | | 1 |
| | විදුලිබල හා පුනර්ජනනීය - (2) | |
| 7. ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව ලබා දීම | | 1 |
| | සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන - (298) | |
| | එකතුව | 8 |

(ඇ) පෙත්සම් විමර්ශනය සිදුකළ අමාත්‍යාංශ අනුව සාරාංශයක්

| අනු අංකය | අමාත්‍යාංශය | වාර්තාවක් ඉල්ලා අමාත්‍යාංශ වෙත යොමු කළ පෙත්සම් ගණන | කාරක සභාව විමසන ලද පෙත්සම් ගණන | කාරක සභාව සහන ලබා දෙන ලෙස නිර්දේශ කළ පෙත්සම් ගණන | එම නිර්දේශ මත සහන දුන් පෙත්සම් ගණන | නිර්දේශ අතරින් සහන ලද ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|
| 1 | කෘෂිකර්ම | 15 | 1 | 1 | 1 | 100 |
| 2 | නගර සැලසුම් සහ ජලසම්පාදන | 9 | 3 | 3 | ප්‍රගතිය විමසා ඇත | |
| 3 | ආරක්ෂක | 46 | 12 | 3 | එම | |
| 4 | සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ | 3 | - | - | - | - |
| 5 | අධ්‍යාපන | 70 | 7 | 3 | ප්‍රගතිය විමසා ඇත | |
| 6 | මුදල් | 8 | 1 | 1 | එම | |
| 7 | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන | 3 | - | - | - | - |
| 8 | විදේශ රැකියා | 5 | 3 | 3 | ප්‍රගතිය විමසා ඇත | |
| 9 | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය | 33 | 5 | 3 | එම | |
| 10 | උසස් අධ්‍යාපන හා මහාමාර්ග | 23 | 4 | 4 | 1 | 25 |
| 11 | ස්වදේශ කටයුතු | 26 | 3 | 0 | - | - |
| 12 | නිවාස හා ඉදිකිරීම් | 5 | 1 | 1 | ප්‍රගතිය විමසා ඇත | |
| 13 | කර්මාන්ත හා වාණිජ | 16 | 3 | 3 | එම | |
| 14 | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු | 1 | 1 | 0 | එම | |
| 15 | වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ | 10 | - | - | - | - |
| 16 | අධිකරණ | 4 | - | - | - | - |
| 17 | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා | 6 | 2 | 1 | ප්‍රගතිය විමසා ඇත | |

| අනු අංකය | අමාත්‍යාංශය | වාර්තාවක් ඉල්ලා අමාත්‍යාංශය වෙත යොමු කළ පෙත්සම් ගණන | කාරක සභාව විමසන ලද පෙත්සම් ගණන | කාරක සභාව සහන ලබා දෙන ලෙස නිර්දේශ කළ පෙත්සම් ගණන | එම නිර්දේශ මත සහන දුන් පෙත්සම් ගණන | නිර්දේශ අනුව සහන ලද ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|
| 18 | ඉඩම් | 39 | 3 | 2 | 1 | 50 |
| 19 | නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන | 83 | 6 | 3 | ප්‍රගතිය විමසා ඇත | |
| 20 | මහවැලි සංවර්ධන හා පරිසර | 15 | 1 | 0 | - | - |
| 21 | මහානගර හා බස්නාහිර සංවර්ධන | 8 | 4 | 4 | ප්‍රගතිය විමසා ඇත | |
| 22 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු | 6 | 2 | 0 | - | - |
| 23 | පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය | 12 | 3 | 3 | 1 | 33 |
| 24 | ඛනිජ තෙල් සම්පත් සංවර්ධන | 1 | - | - | - | - |
| 25 | වැවිලි කර්මාන්ත | 6 | 5 | 2 | ප්‍රගතිය විමසා ඇත | |
| 26 | වරාය හා නාවික කටයුතු | 4 | 2 | 1 | 1 | 100 |
| 27 | තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු | 19 | 5 | 2 | ප්‍රගතිය විමසා ඇත | |
| 28 | විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති | 26 | 5 | 4 | 1 | 25 |
| 29 | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික | 12 | 4 | 1 | ප්‍රගතිය විමසා ඇත | |
| 30 | පළාත් සභා හා පළාත් පාලන | 39 | 14 | 12 | එම | |
| 31 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණය | 36 | 6 | 4 | එම | |
| 32 | රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන | 28 | 11 | 3 | 1 | 33 |
| 33 | ග්‍රාමීය ආර්ථිකය | 1 | 1 | 1 | ප්‍රගතිය විමසා ඇත | |
| 34 | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු | 2 | 1 | 1 | එම | |

| අනු අංකය | අමාත්‍යාංශය | වාර්තාවක් ඉල්ලා අමාත්‍යාංශ වෙත යොමු කළ පෙත්සම් ගණන | කාරක සභාව විමසා බලන ලද පෙත්සම් ගණන | කාරක සභාව සහන ලබා දෙන ලෙස නිර්දේශ කළ පෙත්සම් ගණන | එම නිර්දේශ මත සහන දුන් පෙත්සම් ගණන | නිර්දේශ අතරින් සහන ලද ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|
| 35 | සමාජ සවිබල ගැන්වීම් හා සුබසාධන | 8 | 1 | 1 | 1 | 100 |
| 36 | තිරසර සංවර්ධන හා වනජීවී | 2 | - | - | - | - |
| 37 | විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් | 6 | - | - | - | - |
| 38 | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා | 31 | - | - | - | - |
| 39 | ජනාධිපති ලේකම් | 3 | 1 | 0 | - | - |
| | **එකතුව** | 670 | 121 | 70 | 8 | 11 |

(ඈ) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්ට (ඔම්බුඩ්ස්මන්) අදාළ පෙත්සම් පිළිබඳ සාරාංශය

| **2015.09.01 – 2016.08.31 දක්වා වූ කාල සීමාව තුළදී:—** | |
|---|---|
| පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් වෙත යොමු කළ පෙත්සම් සංඛ්‍යාව | 32 |
| එසේ යොමුකළ පෙත්සම් අතරින් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් විසින් විභාග කර කාරක සභාවට වාර්තා කරන ලද පෙත්සම් සංඛ්‍යාව | 5 |
| පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් වෙත යොමු කළ පෙත්සම් අතරින් කාරක සභාව විභාග කළ පෙත්සම් සංඛ්‍යාව | 2 |
| පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්ට අදාළ පෙත්සම් අතරින් නිෂ්ප්‍රභ කළ පෙත්සම් සංඛ්‍යාව | 1 |

## 20. කාරක සභාව විසින් සහන සලසා දුන් පෙත්සම් 8 පිළිබඳ විමසුමක්

(1) **කේ.ජී. වික්‍රමසිංහ මහතා**

**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ 08.**

**සීඔඑම්/පීපී/2016/520**

තමාට වයස අවුරුදු 59ක්ව තිබියදීත් තම සේවා ස්ථානය වන රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු පවතින නමුත් ආයතන සංග්‍රහයෙන් ලැබී ඇති වරප්‍රසාද පිළිබඳ නොසලකා තමාට ස්ථාන මාරුවක් ලබා දී ඇති බව පවසමින් තමා විශ්‍රාම ගන්නා තෙක් වත්මන් සේවා ස්ථානයේම සේවය කිරීමට අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලමින් පෙත්සම්කරු පෙත්සම ඉදිරිපත් කර ඇත.

මෙම පෙත්සම සම්බන්ධයෙන් කාරක සභාවෙන් කළ විමසුමට ප්‍රතිචාර දක්වමින් පෙත්සම්කරුගේ ස්ථාන මාරුව අවලංගු කරන ලෙස රජයේ මුද්‍රණාලයාධිපති විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතින් සිදු කළ ඉල්ලීම අනුව මෙම ස්ථාන මාරුව නවතා ඇත.

(2) **කේ.පී.එස්. ප්‍රසන්තිකා මෙනෙවිය**

**අංක 02, කහටගස්වත්ත, ගොඩකන්ද, ගාල්ල.**

**සීඔඑම්/පීපී/2015/185**

රුහුණු විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන සමෘද්ධිලාභී මෙන්ම අඩු ආදායම්ලාභී පවුලක සාමාජිකාවක වන පෙත්සම්කාරිය මහත් ආර්ථික දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුව ඇති බව පවසමින් තමාට මහපොළ ශිෂ්‍යත්වය ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත.

මෙම පෙත්සම සම්බන්ධයෙන් කාරක සභාව විසින් වාර්තාවක් කැඳවූ අතර පෙත්සම්කාරිය මහපොළ ශිෂ්‍යත්වය සඳහා හිමිකම් නොලබන බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දැනුම් දී ඇති අතර විශ්වවිද්‍යාලය විසින් ලබා දෙන ශිෂ්‍යාධාර මුදල රු. 4000/- තෙක් වැඩිවීම තුළින් පෙත්සම්කාරිය සෑහීමට පත්වන බැවින් පෙත්සමේ කටයුතු අවසන් කරන ලදි.

(3) **කේ.ඩබ්ලිව්. ආනන්ද දිසානායක මහතා**

**අංක 287/2, කපුවැලිකන්ද, නාපාවල, අවිස්සාවේල්ල**

**සීඔඑම්/පීපී/2015/162**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවය කළ තමාගේ තනතුර ස්ථිර කිරීම සලකා බැලීමේදී තමා විසින් ව්‍යාජ අධ්‍යාපන සහතික ඉදිරිපත් කළ බව පවසමින් සේවයෙන් ඉවත් කළ බවත්, තම අධ්‍යාපන සහතිකවල නිරවද්‍යතාවය සනාථ කිරීමට උත්සාහ කළ නමුත් ඊට අවස්ථාවක් නොලැබුනු බවත් පවසමින් නැවත රැකියාව ලබා දෙන ලෙස ඉල්ලමින් පෙත්සම්කරු පෙත්සම ඉදිරිපත් කර ඇත.

මේ පිළිබඳ කාරක සභාව විසින් සිදු කළ විමර්ශනයේදී පෙත්සම්කරුට අසාධාරණයක් සිදුව ඇති බව නිගමනය කරමින් හිඟ වැටුප්ද සහිතව ඔහුව නැවත සේවයේ පිහිටුවන ලෙස සිදු කළ නිර්දේශය අනුව පෙත්සම්කරුව නැවත සේවයේ පිහිටුවීමට කටයුතු කර ඇත. හිඟ වැටුප් ලබාදීම සම්බන්ධයෙන් විමසීමක් කිරීමට කාරක සභාව කටයුතු කරන ලදි.

(4) **එන්.ඒ. වීරසූරිය මහතා**

**සමන්ති, නැඟින්න, දොඩන්ගොඩ**

**සීඔඑම්/පීපී/2015/314**

ඉඩම් කැබැල්ලක් හා නිවස උගසට තමා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන් ලබා ගත් ණය මුදල හා පොළී මුදල වන රු. 3,12,000/- මේ වනවිටත් පියවා ඇති නමුත් රු. 4,50,000/- ගෙවා ඉඩම නිවස නිරවුල් කර ගන්නා ලෙස බැංකුව විසින් වාචිකව දන්වා සිටින බව පවසමින් මෙහි සිදුව ඇති අක්‍රමිකතාවය නිරවුල් කර දෙන ලෙස ඉල්ලා පෙත්සම්කරු පෙත්සම ඉදිරිපත් කර ඇත.

මෙම පෙත්සම සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙතින් විමසීම් කිරීමේදී පෙත්සම්කරුට පොළී සහනයක් ලබා දෙමින් දේපළ නිදහස් කර ගැනීමට ලබා දී තිබූ අවස්ථාව අනුව කටයුතු කර පෙත්සම්කරු තම දේපළ නිදහස් කරගෙන ඇත.

(5) **ආර්.එම්. පද්මසිරි මහතා**

**අංක 67, පාසල් මාවත, ඇත්තලපිටිය, බණ්ඩාරවෙල**

**සීඔඑම්/පීපී/2015/2**

ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයෙකු වන තමාට අසත්‍ය චෝදනා ගොනුකර දඬුවම් පමුණුවන ලද අතර තම ආයතනයේ සිදු කළ අභ්‍යන්තර විමර්ශනය අනුව තම නිරවද්‍යතාවය සනාථ වන නමුත් සහනයක් නොලද බැවින් සාධාරණය ඉටු කර දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත.

මෙම පෙත්සම විමර්ශනය කළ කාරක සභාව පෙත්සම්කරු මෙම ගැටළුවට මුහුණ නුදුන්නේනම් ඔහු සිටිය යුතු තනතුරේ පිහිටුවීමටත්, ඔහුගෙන් අයකරගෙන ඇති දඩ මුදලක් වේ නම් එයද වැටුප් වර්ධකද නිවැරදිව ගෙවා පහසු සේවා ස්ථානයක සේවය කිරීමටත් අවස්ථාව ලබා දෙන ලෙස ලබා දුන් නිර්දේශය අනුව පෙත්සම්කරුට සහන සැලසී ඇත.

(6) **කේ. සුජාතා රමණී පෙරේරා මෙනෙවිය**

**අංක 71, පළමු පටුමග, මැද වැලිකඩ පාර, රාජගිරිය**

**සීඔඑම්/පීපී/2015/298**

තම පියාගේ ඇවෑමෙන් පසු තම මව ලබමින් සිටි විශ්‍රාම වැටුප ඇය මිය යාමෙන් පසු අහිමි වූ බවත් ජීවත් වීම සඳහා තමාට රැකියාවක් කළ නොහැකි බවත් පවසන පෙත්සම්කරු තම අසරණභාවය සලකා මාසික දීමනාවක් ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම්කාරිය පෙත්සම ඉදිරිපත් කර ඇත.

මෙම පෙත්සම විමර්ශනය කළ කාරක සභාව පෙත්සම්කාරිය වසය අවුරුදු 70 සම්පූර්ණ කර ඇති බැවින් ඇයට මාසිකව රු. 2000/- ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව ගෙවීමට කටයුතු කරන ලෙස ලබා දුන් නිර්දේශය අනුව ඇයට එම මාසික දීමනාව ගෙවීමට කටයුතු කර ඇත.

(7) **ගුණපාල විතාරණ මහතා**

**අංක 181, බණ්ඩාරනායක පෙදෙස, ගාල්ල**

**සීඔඑම්/පීපී/2015/216**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටියදී ශිෂ්‍යත්වයක් ලබා විදෙස්ගත වූ බවත් නැවත පැමිණෙන විට තමා සේවය කළ අංශය වෙනම දෙපාර්තමේන්තුවක් බවට පත්කර තිබූ බවත් එහි ප්‍රධානී විසින් තමාට උසස්වීම ලබා නොදුන් බවත් පවසමින් තම උසස්වීම නිසිකාලයේදී ලබා දී හිඟ වැටුප් ලබා දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත.

මේ සම්බන්ධයෙන් කාරක සභාව විසින් විමර්ශනය කර ලබා දුන් නිර්දේශය අනුව පෙත්සම්කරුට 1977.05.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය සේවයේ මධ්‍යම මට්ටමේ කාර්මික ඒකාබද්ධ සේවයේ II පන්තියේ "අ" බණ්ඩයට උසස්වීම ලබා දීමට කටයුතු කර ඇත.

(8) **ඩබ්ලිව්.පී. දයාරත්න මහතා**

**අංක 405/බී, රිටිගලහේන, මාවතගම, පාදුක්ක**

**සීඔඑම්/පීපී/2015/34**

තමා පදිංචිව සිටින ඉඩම සඳහා ලද දීමනා පත්‍රය තම පියාගේ නමට වූ අතර එහි අනුප්‍රාප්තිකයා ලෙස තම නම සඳහන් වූ බවත්, පියාගේ ඇවෑමෙන් පසු මවගේ නමට ජීවිත භුක්තියට එය සංශෝධනය වූ පසු අනුප්‍රාප්තිකයා ලෙස තමාගේ නම ඉවත් කර ඇති බවත් පවසමින් සාධාරණයක් ඉටු කර දෙන ලෙස ඉල්ලා පෙත්සම ඉදිරිපත් කර ඇත.

කාරක සභාව විසින් මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙතින් විමසීමක් කිරීමේදී ඉඩමේ බලපත්‍රකරු වන පෙත්සම්කරුගේ පියා විසින් නම් කරන ලද පසු උරුමය වලංගු බවත් ජීවිත භුක්තිකාරිය වන වයස්ගත රෝගී තත්ත්වයෙන් පසුවන පෙත්සම්කරුගේ මවගේ ඇවෑමෙන් බලපත්‍රයේ පසු උරුමය වලංගු කිරීමට පෙත්සම්කරු එකඟ වී ඇති බවත් අමාත්‍යාංශය විසින් වාර්තා කර ඇත.

## 21. කාරක සභාව විසින් සහන සලසා නොදුන් අවස්ථා කිහිපයක්

මෙම කාල සීමාව තුළ පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කරන ලද පෙත්සම් සමහරක් කාරක සභාව විමර්ශනයෙන් පසු නිෂ්ප්‍රභ කරන ලද අතර ඊට පෙත්සම්කරුට රජයේ නිලධාරීන්ගෙන් අසාධාරණයක් සිදුවී නොමැති බව පෙනී යාම, ආයතන තුළ පවත්නා නීති හා රෙගුලාසි අනුව සහන සළසා දීමට නොහැකිවීම, අපේක්ෂිත සහන ලබාදීමට ප්‍රතිපාදන නොවීම මත රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් හා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරියෙන් ප්‍රතික්ෂේප වීම, පෙත්සම්කරුට පෙත්සම සම්බන්ධයෙන් උනන්දුවක් නොවීම හා පෙත්සම්කරුගේ ප්‍රතිචාරයක් නොදැක්වීම යනාදී කරුණු හේතු වී ඇත. පහත පෙත්සම් එසේ නිෂ්ප්‍රභ වී ඇත.

**එච්.ඩබ්. ප්‍රියන්ත කුමාර මහතා - පෙත්සම් අංක සීඕඑම්/පීපී/2015/130**

පොලිස් කොස්තාපල්වරයෙක් ලෙස සේවයේ යෙදී සිටියදී විවාහ වීම සඳහා තමා සේවය කළ කොට්ඨාශයේ පොලිස් අධිකාරි වෙතින් අවසර ඉල්ලා සිටියද පිළිතුරක් නොලද බවත් ආධුනික කාලය තුල විවාහ වීම වරදක් බව තමා නොදැන සිටි බවත් පවසමින් නැවත සේවයේ පිහිටුවන ලෙස පෙත්සම්කරු ඉල්ලා ඇත.

පෙත්සම්කරු නිසි අවසරයකින් තොරව විවාහ වීම පොලිස් දෙපාර්තමේන්තුවේ පවතින නියෝග හා බඳවා ගැනීමේ කොන්දේසි උල්ලංඝනය කිරීමක් වන බැවින් පෙත්සම්කරු නැවත සේවයේ පිහිටුවීම සිදු කළ නොහැකි බැවින් මෙම පෙත්සම නිෂ්ප්‍රභා කරන ලදි.

**එස්.ඩී.එස්. මනෝහර මහතා - සීඕඑම්/පීපී/2015/110**

නිවසේදී සිදුවූ අනතුරක් හේතුවෙන් නිවාඩු ඉල්ලා ලිපියක් යොමු කළ නමුත් තමන් සේවය අතහැර ගියා සේ සලකා කටයුතු කළ බැවින් නැවත රැකියාව ලබා දෙන ලෙස පෙත්සම්කරු ඉල්ලා ඇත.

පෙත්සම්කරු ඉදිරිපත් කර තිබූ වෛද්‍ය සහතිකවල තිබූ අඩුපාඩු හේතුවෙන් ඒවා ප්‍රතික්ෂේප කර ඇති තිබීමත් රාජ්‍ය සේවා කොමිසමට ඉදිරිපත් කළ අභියාචනය නියමිත කාලසීමාව තුළ ඉදිරිපත් නොවීම මත ප්‍රතික්ෂේප වී තිබීමත් පරිපාලන විනිශ්චය අධිකාරිය වෙත ඉදිරිපත් කළ අභියාචනයේදී නොකඩවා වාර 3ක් සහභාගි නොවීම මත එය නිෂ්ප්‍රභ කර තිබීමත් සැලකූ කාරක සභාව පෙත්සමේ කටයුතු අවසන් කරන ලදි.

**ටී.එම්.ඩී.එස්.ඩබ්ලිව්. මුණසිංහ මහතා - සීඕඑම්/පීපී/2015/113**

ග්‍රාම නිලධාරියෙකු ලෙස සේවය කර ඇති පෙත්සම්කරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2/7 වගන්තිය යටතේ විශ්‍රාම ගෙන නැවත සේවයට එක්ව දෙවන වරට විශ්‍රාම ගෙන ඇති අතර විශ්‍රාම වැටුප් ගණනය කිරීමේදී තමාගේ විශ්‍රාම වැටුප අඩු කර ගෙවන බවත් බැවින් විශ්‍රාම වැටුප නිවැරදි කර දෙන ලෙස ඉල්ලා ඇත.

මෙහිදී පෙත්සම්කරු තම පළමු විශ්‍රාමයේ අඩු නොකළ විශ්‍රාම වැටුප සහ දෙවන විශ්‍රාමයේ අඩු කළ විශ්‍රාම වැටුප සැසඳීම නිසා තමාට අඩු විශ්‍රාම වැටුපක් ලැබෙන බවට ඔහු තුළ වූ අදහස හේතුවෙන් ගැටළුව හටගෙන ඇති බව නිරීක්ෂණය කළ කාරක සභාව ඔහුගේ විශ්‍රාම වැටුප නිවැරදිව ගණනය කර ඇති බැවින් ඔහුට අසාධාරණයක් වී නැති බව ද නිරීක්ෂණය කළ කාරක සභාව පෙත්සම නිෂ්ප්‍රභ කරන ලදි.

# ස්තුතිය

1. ආරම්භක කාරක සභාවේ සහ ඊට පසු මේ දක්වා පැවති කාරක සභාවල සාමාජික ගරු මන්ත්‍රීවරුන්ට,

2. කාරක සභාවේ සභාපති ලෙස සේවය කළ සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට,

3. අප සමග කටයුතු කළ සියලුම ඔම්බුඩ්ස්මන්වරුන්ට හා ඔවුන්ගේ කාර්යය මණ්ඩලයට,

4. කාරක සභාව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පහසුකම් හා දැනුම ලබා දෙමින් කටයුතු කල පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට, කාර්ය මණ්ඩල ප්‍රධානී හා නියෝජ්‍ය මහ ලේකම්වරයාට සහ සහකාර මහ ලේකම්වරුන්ට,

5. කාරක සභාවන්හි දී ඇති වූ ඒකගතාවයන් ක්‍රියාත්මක කරමින් පෙත්සම්කරුවන්ට සහන ලබාදීමට සහාය වූ සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ට සහ ඔවුන්ගේ නිලධාරි මණ්ඩලයන් වෙත,

6. කාරක සභාවේ ඉල්ලීම පරිදි අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කරමින් ඉන් තම සේවකයින්ට සහන සැලසූ අමාත්‍යවරුන්ට සහ එම අමාත්‍ය මණ්ඩල සංදේශයන්ට අනුමැතිය ලබා දුන් අමාත්‍ය මණ්ඩලයට සහ ඒ සඳහා දායක වූ සියලුම නිලධාරින්ට,

7. කාරක සභා කාර්යාංශය තුළ අනු කාරක සභාවක් ලෙස පෙත්සම් කාරක සභාව පවත්වාගෙන යමින් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙනුවෙන් කටයුතු ඉටු කළ හිටපු සියලුම පෙත්සම් කාරක සභා ලේකම්වරුන්ට හා ඔවුන්ගේ කාර්ය මණ්ඩලයට,

8. මෙම වාර්තාව සැකසීම සඳහා දැනුමෙන් හා ශ්‍රමයෙන් දායක වූ මහජන පෙත්සම් කාරක සභා කාර්යාංශය ඇතුළු පාර්ලිමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩලයට,

අටවන පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව සිය හෘදයාංගම ස්තුතිය පුද කරයි.

[5 වන වගන්තිය]

## උපලේඛනය 1

**පෙත්සමක ආදර්ශය**

ගරු කථානායකතුමනි,

පහත සඳහන් පෙත්සම මම ඉදිරිපත් කරමි.

(මන්ත්‍රීතුමාගේ නම, අත්සන, දිනය හා නිල මුද්‍රාව)

පෙත්සම්කරුගේ නම හා
ලිපිනය

දිනය

ගරු කථානායකතුමා
පාර්ලිමේන්තුව
කෝට්ටේ

ගරු කථානායකතුමනි,

සිදුව ඇති අසාධාරණය

……………………………………………………………………………………………………

ඉල්ලා සිටින සහනය

……………………………………………………………………………………………………

පෙත්සම්කරුගේ අත්සන හෝ ඇඟිලි සලකුණ

[5 වන වගන්තිය]

## උපලේඛනය 2

පෙත්සමක් ප්‍රතික්ෂේප කිරීමට පදනම් වන කරුණු

**පහත "අ" කොටසෙහි සඳහන් කරුණක් පෙත්සමෙහි අඩුපාඩුවක් වේ නම් එය නිවැරදි කර නැවත පෙත්සම කාරක සභාවට යොමු කළ හැක.**

"අ" කොටස

(1) පෙත්සම ගරු කථානායකතුමා වෙත ආමන්ත්‍රණය කර නොතිබීම.

(2) පෙත්සමේ ඉහළින් "ගරු කථානායකතුමනි, මෙම පෙත්සම ඉදිරිපත් කරමි" යනුවෙන් සටහන් කොට වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විසින් අත්සන් කර නොතිබීම. (මන්ත්‍රීවරයා පෙත්සමෙහි අත්සන් නොකර ආවරණ ලිපියක් මගින් යොමු කිරීම ප්‍රමාණවත් නොවේ.)

(3) පෙත්සමේ අඩංගු කරුණු ඉතා කෙටියෙන් (පිටු දෙකකට සීමා වන පරිදි) හා පැහැදිලිව ඉදිරිපත් කර නොතිබීම.

(4) ඉල්ලා සිටිනු ලබන සහනය පිළිබඳව ආයාචනයකින් පෙත්සම අවසන් වී නොතිබීම.

(5) පෙත්සම්කරු විසින් පෙත්සම අත්සන් කර/ඇඟිලි සලකුණු තබා නොතිබීම.

(6) පෙත්සමෙහි මුල් පිටපත එවා නොතිබීම. (අත්සන ඡායා පිටපතක් නොවිය යුතු අතර පෙත්සමේ පිටපත් හා වෙනත් ඇමුණුම් එවීම අනවශ්‍යය)

(7) පහත සඳහන් ආයතන ඉදිරියේ වර්තමානයේ විමර්ශනය වෙමින් පැවතීම.

I. අධිකරණය

II. ඔම්බුඩ්ස්මන්වරයා

III. මානව හිමිකම් කොමිෂන් සභාව

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභාව

(මෙම විමර්ශන කටයුතු අවසන් වූ පසු පෙත්සම ඉදිරිපත් කළ හැක.)

පහත "ආ" කොටසෙහි සඳහන් කරුණක් පෙත්සමෙහි අඩුපාඩුවක් වේ නම් පෙත්සම නිෂ්ප්‍රභා වන අතර නැවත පෙත්සම යොමු කළ නොහැක.

"ආ" කොටස

(1) රජයේ හෝ සමාන වෙනත් ආයතනයක නිලධාරියෙකු විසින් මූලික අයිතිවාසිකමක් කඩකිරීමක් හෝ වෙනත් අයුක්තියක් සිදු කරනු ලැබ ඇති බව අනාවරණය නොවීම.

(2) අමාත්‍ය මණ්ඩල තීරණයක් වෙනස් කරන ලෙස ඉල්ලා සිටීම.

(3) අධිකරණය විසින් ලබා දුන් තීන්දුවක් වෙනස් කරන ලෙස ඉල්ලා සිටීම.

(4) වරක් පෙත්සම් කාරක සභාව විසින් නිෂ්ප්‍රභා කර ඇති කරුණක් සම්බන්ධයෙන් වීම.

(5) පෙත්සම් කාරක සභාව විසින් වරක් සහන ලබා දී ඇති කරුණක් සම්බන්ධයෙන් තවදුරටත් සහන බලාපොරොත්තුවෙන් නැවත වරක් ඉදිරිපත් කර තිබීම.

(6) පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුලත් කර ගැනීම සම්බන්ධයෙන් වීම.

(7) 2007.05.24 වන දිනට පෙර නිකුත්කර ඇති දේශපාලන පළිගැනීම්වලට ලක්වූවන් සම්බන්ධයෙන් වූ අමාත්‍ය මණ්ඩල තීරණ මගින් නිර්දේශිත සහන ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටීම.

(8) පාර්ලිමේන්තුවේ විවාදයක් පිළිබඳ සඳහනක් කර තිබීම.

**[11 (iii) වන වගන්තිය]**

<u>උපලේඛනය 3</u>

ජනාධිපති කාර්යාලය
ஜனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය: E&O/AC/1/8/6

2014 ඔක්තෝබර් මස 10 දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත,

<u>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, මහජන පෙත්සම් කාරක සභාව හා පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) විසින් දෙනු ලබන නිර්දේශ ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීම</u>

රාජ්‍ය සේවකයන්ට හා පොදු මහජනතාවට ආයතනික වශයෙන් ඇතිවන ගැටලු සම්බන්ධයෙන් පැමිණිලි විමර්ශනය කිරීමේ කටයුතු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, මහජන පෙත්සම් කාරක සභාව හා ඔම්බුඩ්ස්මන්වරයා විසින් සිදු කරනු ලැබේ.

උක්ත ආයතන විසින් එකී ගැටලු විමර්ශනය කිරීමෙන් පසු දෙනු ලබන නිර්දේශයන් බොහොමයක් ක්‍රියාත්මක නොවන බව මා වෙත වාර්තා වී ඇත.

කිසියම් බලධාරියෙකුට එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ අපහසුතාවයක් වේ නම්, විෂයභාර අමාත්‍යවරයා මගින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමෙන් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීම කළ යුතු බවට අතිගරු ජනාධිපතිතුමා විසින් උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, මහජන පෙත්සම් කාරක සභාව හා ඔම්බුඩ්ස්මන්වරයා විසින් ලබා දෙනු ලබන නිර්දේශයන් ක්‍රියාත්මක නොවන අවස්ථා සම්බන්ධයෙන් ඉදිරියේදී ඔබ දැනුවත් කරන අතර, ඒ සඳහා ඉහත අන්වන ඡේදයේ සඳහන් ආකාරයට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

උක්ත ක්‍රියාමාර්ගයන් පිළිබඳව ඔබ යටතේ පවතින ආයතනයන් ද දැනුවත් කරන්නේ නම් මැනවි.

ලලිත් වීරතුංග
ජනාධිපති ලේකම්

පිටපත්:-
1. පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් - දැනගැනීම සඳහා
2. සභාපති, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව - දැනගැනීම සඳහා
3. සභාපති, මහජන පෙත්සම් කාරක සභාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව - දැනගැනීම සඳහා

ගාලු මුවදොර, කොළඹ 01 / காலி முகத்திடல், கொழும்பு 01 / Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones: 011 2354354, 011 4354354
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2340340
ඊ-තැපෑල / மின்-அஞ்சல் / e-mail: ps@presidentsoffice.lk

**[11(V) වන වගන්තිය]**

<u>උපලේඛනය 4</u>

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.

**මහජන පෙත්සම් කාරක සභා කාර්යාංශය**
பொதுமனுக் குழு அலுவலகம்
**PUBLIC PETITIONS COMMITTEE OFFICE**

දුරකථන / தொலைபேசி / Telephones: 2777100, 2777302, 2777282, Ext.:5247, 6477
ෆැක්ස් / தொலைநகல் / Fax: 2777558

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව / இலங்கை பாராளுமன்றம் / **Parliament of Sri Lanka**
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ / ஸ்ரீ ஜயவர்தனபுர கோட்டே / Sri Jayewardenepura Kotte

2014 මාර්තු මස 18 වන දින

ගරු කථානායකතුමා
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු මැතිතුමනි

<u>දෙස්/විදෙස් පුහුණු සැසි සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නම් කිරීමේදී පෙත්සම් කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරුන්ද සලකා බලන ලෙස කරනු ලබන ඉල්ලීම</u>

මහජන නියෝජිතයින් හරහා පාර්ලිමේන්තුවට යොමු කරන පෙත්සම් විමර්ශනය සඳහා ඔබතුමා විසින් නම් කරන මහජන නියෝජිතයන් 29 දෙනෙක්ගෙන් සමන්විත මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව රාජ්‍ය ආයතනවල ක්‍රියාකාරීත්වය තුළින් මහජනතාවට අසාධාරණයක් හෝ අයුක්තියක් වී ඇතැයි පෙත්සම් විමර්ශනයේදී තීරණ කරන්නේ නම්, එම අසාධාරණය ඉවත් කිරීම සඳහා නිර්දේශ ලබා දී පෙත්සම්කරුවනට සහන ලබාදෙන අතර නිර්දේශ ක්‍රියාත්මක නොවන අවස්ථාවලදී නැවත නැවතද ඒවා විමර්ශනය කරමින් හා ප්‍රතිපාදන නැති අවස්ථාවලදී සානුකම්පිත පදනම මත හෝ පෙත්සම්කරුවනට සහන ලබා දීමට උත්සාහ දරමින් කටයුතු කරන අතර එමගින් ඔවුනු පාර්ලිමේන්තුව පිළිබඳ මහජන විශ්වාසය වැඩි දියුණු කිරීමට දායක වන බව මම අදහස් කරමි.

කාරක සභාවේ සිටපු සහ වත්මන් සාමාජික මන්ත්‍රීවරුන් පක්ෂ/විපක්ෂ භේදයකින් තොරව ඉතා උනන්දුවෙන් කාරක සභාවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා තම වගකීම ඉටු කර ඇති අතර ඒ අනුව 7වන පාර්ලිමේන්තු කාල සීමාව තුල මේ වන විට පෙත්සම්කරුවන් 150 දෙනෙකුට පමණ සහන ලබා දීමට හැකිවී ඇති බව බව මම සතුටින් ප්‍රකාශ කරමි. මා කාර්ය බහුලවූ අවස්ථාවලදී අනෙකුත් සාමාජික මන්ත්‍රීවරුන් අතරින් තලතා අතුකෝරාළ, වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ, සුජීව සේනසිංහ යන ගරු මන්ත්‍රීවරු/මන්ත්‍රීවරියන් කාරක සභාවේ සභාපතිත්වය දරමින්ද සරත් වීරසේකර, විනායගමූර්ති මුරලිදරන්, පොන් සෙල්වරාසා වැනි ගරු මන්ත්‍රීවරුන්ද එහි කටයුතුවලට සක්‍රියව දායක වෙමින්ද එම කටයුතු ඉටු නොකළේ නම් කාරක සභාවේ අභිප්‍රාය වන "එය ඉදිරියට පැමිණෙන පෙත්සම්කරුවන්ට සහන ලබා දීම" සාර්ථක නොවන බව ඔබතුමාගේ අවධානයට යොමු කරවනු කැමැත්තෙමි.

කාරක සභික මන්ත්‍රීන් අසහනයට පත් මහජනතාව සමග එක්ව සිට පෙත්සම් විමර්ශනය කිරීමේදී ඔවුන්ගේ විෂය දැනුම පුළුල් වී තිබීම අත්‍යාවශ්‍ය වන අතර එමෙන්ම ඔවුන්ගේ විෂය දැනුම හා අත්දැකීම් වැඩිවීම තුළින් ඔවුන් වැඩි ඵලදායිතාවයකින් හා කාර්යක්ෂමතාවයකින් යුක්තව තම කාර්යය ඉටු කරනු ඇති බවට මා පෞද්ගලිකව අදහස් කරන බැවින් සක්‍රියව කාරක සභාවේ කටයුතුවලට සහභාගී වන ඉහත සඳහන් සාමාජික මන්ත්‍රීවරුන්ට ප්‍රමුඛතාවය ලබා දෙමින් අනෙකුත් සියළු සාමාජිකයන්ද දෙස්/විදෙස් පුහුණු සැසි හා වැඩමුළු සඳහා නම් කරන්නේ නම් සුදුසු බව කාරක සභාවේ සභාපති ලෙස මම ඉතා ගෞරවයෙන් ඔබට දන්වා සිටිමි.

ඔබතුමා හා සියළු මහජන නියෝජිතයන් වෙනුවෙන් තම කාලය හා ශ්‍රමය වැය කරමින් තම වගකීම ඉටු කරන කාරක සභික මන්ත්‍රීවරුන්හට එලෙස දෙස් විදෙස් ශික්ෂණය ලබා දීම තුල ඔවුන්ගේ කාර්ය භාරය ඇගයීමට ලක්වීම සිදුවන බවත් එතුලින් ඔවුනු තවත් කැපවීමකින් යුක්තව කාරක සභාවේ කටයුතු කරනු ඇති බවත් මා තරයේ විශ්වාස කරමි.

මෙයට විශ්වාසී

(අත්සන)

ලලිත් දිසානායක පා.ම.
සභාපති
මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව
(සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍ය)

<u>උපලේඛනය 5</u>

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : CPA/6/OMB/1/9
1996 ඔක්තෝබර් 12

හිතවත් අමාත්‍යතුමනි,

**<u>ඔම්බුඩ්ස්මන්වරයාගේ නිර්දේශ</u>**

මා වෙත ඉදිරිපත් කරන ලද 1995 සඳහා වූ තම වාර්ෂික වාර්තාවෙහි ඔම්බුඩ්ස්මන්වරයා මාගේ දැඩි අවධානය යොමු කරවන කරුණක් සඳහන් කර තිබේ. ඔහු ප්‍රකාශ කර සිටිනුයේ ඔහු වෙත ඉදිරිපත් කරන කරුණු පිළිබඳ ඔහුගේ නිර්දේශ සඳහා රජයේ ආයතන බොහෝ විට අවධානය යොමු නොකරන බවයි.

ඔබ දන්නා පරිදි විශේෂයෙන්ම විධායකයේ ක්‍රියාකාරකම්වලට අදාළව, දුක් ගැනවිලි විසඳීමේ රාජ්‍ය යාන්ත්‍රණය ශක්තිමත් කරන බව අප ජනතාවට ලබා දුන් ප්‍රතිඥාවකි. මෙම ප්‍රතිඥාව ඉටුකරමින්, ඔහු වෙත සෘජුවම කරුණු දැක්වීම සිදුකිරීමට හැකිවන පරිදි ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්යාලයට අදාළ නීති අපි සංශෝධනය කළෙමු. කෙසේවෙතත්, සුපරීක්ෂාකාරීව සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව, ඔම්බුඩ්ස්මන්වරයා ලබාදෙන නිර්දේශ රජයේ ආයතන නොසලකා හරින්නේ නම් අපගේ අභිප්‍රායන් නිශේධනය වනු ඇත.

ඔම්බුඩ්ස්මන්වරයා සිය නිර්දේශ ලබා දෙනුයේ අදාළ සියලු පාර්ශවයන්ට සවන් දීමෙන් පසුවය. ප්‍රතිපත්ති කාරණාවන් සහ මූල්‍ය බලපෑම් ඇතුළුව තම දෘෂ්ටි කෝණයෙන්, අදාළ සියලු කරුණු ඔහුගේ අවධානයට යොමු කිරීමේ අවස්ථාව එහිදී අදාළ රජයේ ආයතනවලට හිමි වේ. ගැටළුවට බඳුන් වී ඇති කරුණුවල සියලු අංශ හොඳින් සලකා බලා ඔම්බුඩ්ස්මන්වරයා සිය තීරණ ගනු ඇතිය යන්න අපි බලාපොරොත්තු වන්නෙමු.

එබැවින් ඔම්බුඩ්ස්මන්වරයාගේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම අනිවාර්ය නොවුවද, ඒවාට නිසි ගෞරවය ලබාදිය යුතුය. පැහැදිලි හේතුවක් නිසාවෙන් නිර්දේශය ක්‍රියාත්මක කළ නොහැකි නම්, සාමූහික තීරණයක් ගැනීම පිණිස අදාළ අමාත්‍යවරයා විසින් එය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) පනතේ 17(2) වගන්තිය යටතේ තම තීරණ අදාළ අමාත්‍යවරයාට ද දැනුම් දෙන්නේය යන කරුණට මම ඔබගේ අවධානය යොමු කළ යුතුව තිබේ. මෙම තීරණයන්ට නිසි සැලකිල්ල ලබා දෙන බව හා යම් ගැටළුකාරී තත්වයක් ඔබේ අවධානයට යොමු කරනු ලබන බව සහතික කිරීම පිණිස අවස්ථාවක් මෙම පටිපාටිය ඔබට ලබා දෙයි.

අත්තනෝමතික, වෙනස් ලෙස සලකන හෝ අන්‍යායකාරයෙන් අසාධාරණ විධායක ක්‍රියාමාර්ග සිදුවීම වැළැක්වීම පිණිස ඔම්බුඩ්ස්මන්වරයාගේ ආයතනය ප්‍රයෝජනයට ගනු ලබන බවට වග බලා ගැනීම අපගේ වගකීම වන්නේය යන කරුණු මම යළි අවධාරණය කරන්නෙමි.

ඔබගේ හිතෛෂී

.........................................................
චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග
ජනාධිපති

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් - දැනුවත් වනු පිණිස

*(මුල් පිටපතෙහි පරිවර්තනයකි)*

<u>උපලේඛනය 6</u>

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 17/2005

මගේ අංකය : ආ/1/1/2/4/1
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2005.10.[illegible]

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

<u>මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැවරී ඇති කාර්යයන්
ඉටුකිරීමේදී රාජ්‍ය ආයතනවලට සහාය ලබා දීම</u>

1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතෙහි 10 වන වගන්තිය මගින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පවරා ඇති කර්තව්‍ය අතරින් පහත සඳහන් කර්තව්‍යයන් කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

(අ) මූලික අයිතිවාසිකම්වලට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධාන අනුව ක්‍රියා කරනු ලබන බවට සහතික කිරීමේ අදහසින් සහ මූලික අයිතිවාසිකම්වලට ගරු කිරීම හා ඒවා පිළිපැදීම ප්‍රවර්ධනය කිරීම පිණිස විධායක හා පරිපාලනමය පිළිවෙත් හා කාර්ය පටිපාටි පිළිබඳව සුපරීක්ෂාවෙන් සිටීම ;

(ආ) මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම හෝ උල්ලංඝනය කිරීමට ආසන්නව තිබීම සම්බන්ධයෙන් වූ පැමිණිලි පිළිබඳ විභාග කිරීම හා විමර්ශනය කිරීම සහ මෙහි මින් මතු සලසා ඇති විධිවිධානවලට අනුකූලව සමථයට පත්කිරීමේ හා සමගි කිරීමේ මාර්ගයෙන් ඒවා විසඳීම සඳහා විධිවිධාන සැලැස්වීම ;

(ඇ) මූලික අයිතිවාසිකම් වැඩිදියුණු කිරීමේ, ප්‍රවර්ධනය කිරීමේ හා ආරක්ෂා කිරීමේ නීතිමය සහ පරිපාලනමය විධාන හා කාර්ය පටිපාටි සකස් කිරීමෙහි ලා ආණ්ඩුවට උපදෙස් දීම සහ සහාය වීම ;

මානව හිමිකම් කොමිසම විසින් ඉහත කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේදී ඔබ ආයතනයට අදාළ වන කාර්යයන් සම්බන්ධයෙන් කරනු ලබන පරීක්ෂණ වලදී එම කොමිෂන් සභාව වෙත වගකීමකින් යුතුව කරුණු ඉදිරිපත් කරන ලෙසත්, මානව හිමිකම් කඩවීම සම්බන්ධව කොමිෂන් සභාව කරනු ලබන නිර්දේශ ඔබ වෙත ලැබුණු විට එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට විධිමත් අනුමැතිය අදාල බලධාරීන්ගෙන් ලබාගැනීමෙන් පසු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු කල යුතු බවත් මෙයින් දන්වමි.

ඩී. දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

T-cir/md